## 2025-09-09 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ.

## සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව.

මෙදින පෙ.ව 9.30 ට සාමාන්‍ය මහා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.

| අනු අංක | නම | තනතුර |
|---|---|---|
| 01. | ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා | ගරු සභාපති |
| 02. | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | ගරු උප සභාපති |
| 03. | ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා | සභික |
| 04. | ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා | සභික |
| 05. | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සභික |
| 06. | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා | සභික |
| 07. | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සභික |
| 08. | ගරු මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය | සභික |
| 09. | ගරු මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සභික |
| 10. | ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා | සභික |
| 11 | ගරු මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සභික |
| 12 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සභික |
| 13 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සභික |
| 14 | ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සභික |
| 15 | ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය | සභික |
| 16 | ගරු මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා | සභික |
| 17 | ගරු මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය | සභික |
| 18 | ගරු මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා | සභික |
| 19 | ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා | සභික |
| 20 | ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා | සභික |
| 21 | ගරු මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සභික |
| 22 | ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා | සභික |
| 23 | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සභික |
| 24 | ගරු මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා | සභික |
| 25 | ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා | සභික |
| 26 | ගරු මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සභික |
| 27 | ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා | සභික |
| 28 | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සභික |
| 29 | ගරු මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා | සභික |
| 30 | ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා | සභික |
| 31 | ගරු මන්ත්‍රීනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සභික |
| 32 | 32.ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා | සභික |
| 33 | 33.එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා | සභික |
| 34 | 34.එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා | සභික |
| 35 | 35.සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය | සභික |
| 36 | 36.පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා | සභික |

01.ඩී.බී.මනොජ් තිවංක මයා සභාවේ ලේකම් ලෙස සහභාගී විය.

**සභාපතිතුමා :-**
පැමිණ සිටින උපසභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන්, ඒ වගේම ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඒ වගේම ප්‍රාදේශිය සභාව නියෝජනය කරන නිලධාරීන් දෙපල ඒ වගේ ම මාධ්‍යවේදී සහෝදර හිතවතුන් සියලු දෙනාටම සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරමින් අපි සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීමට සූදානම් වන්නේ.

**සභාපතිතුමා :-**
ප්‍රථමයෙන් ම තිබෙන්නේ පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

**01.පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.**
1.01.2025.08.12 වන දින පැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කිරීමට මම යෝජනා කරමි.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය :-**
ගරු සභාපතිතුමනි, බේරුවාන රංජන් මහතාගේ නිවස අසල කියන එක රංග මහතාගේ නිවස කියලා ඒක නිවැරදි වෙන්න ඕනේ.

**සභාපතිතුමා :-**
පසුගිය සභා වාර්තාවේ සංශෝධන තිබේ නම් මේ අවස්ථාවේ වාචිකව ඉදිරිපත් කරන්න.නැත්නම් අපහසුතාවට පත් වෙනවා, සභාවේ නිලධාරී මහත්මියන්.තව සංශෝධන තියෙනවද? මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීතුමියන්ට වාර්තාව ලැබිල ඇති නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, 2025.08.12 වන දින සාමාන්‍ය මහා සභා වාර්තාව සංශෝධන සහිතව ස්ථිර කරනවා.

ඒ අනුව 2025.08.12 වන දින සාමාන්‍ය මහා සභා වාර්තාව සංශෝධන සහිතව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**02. සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ නිවේදන.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**03. මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා ඇති ලිපි සභාගත කිරිම.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**04.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**05.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**06. යථා පරිදි කල් දී ඇති යෝජනා.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණියගේ යෝජනාව :-**
**6.1.මීන්නාන හන්දියේ ඇති විශාල අඩුපාඩුවක් ලෙස පොදු වැසිකිලියක් ඉදිකිරීමට යෝජනා කරමි.(සුදුසු භූමියක් ඇත,ප්‍රතිලාභීන් දෛනිකව 250-300 ක් පමණවේ.)**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණියගේ යෝජනාව:-**
ගරු සභාපතිතුමනි, මින්නාන හන්දියට අඩුපාඩුවක්ව තියෙන පොදු වැසිකිලියක අවශ්‍යතාවය තියෙනවා, ගරු සභාපතිතුමනි. දෛනිකව මිනිස්සු 250 ක් 300 ක් ඉන්නවා.ඊට වැඩි ප්‍රමාණයක්, හාර පන්සීය ක් වගේ ප්‍රමාණයක් මිනිස්සු ගැවසෙනවා.ඉද්දමල්ගොඩ බෝපැත්ත ඒ වගේ ප්‍රදේශවලින් එන ජනතාව බස් එක එනකන් සමහර වෙලාවට පැය ගණන් එතන රැඳෙනවා.ඒ වගේ වෙලාවට ගැබිනි අම්මා කෙනෙකුට රෝගී පුද්ගලයෙකුට හදිසියේ අවශ්‍යතාවක් ඉෂ්ඨ කර ගන්න යන්න තියෙන්නේ එතන තියෙන කඩේකට හරි එතන තියෙන ගෙදරකට හරි.ඉතින් ඒක විශාල ගැටලුවක්.ඒක හින්ද දැනට ඒකට සුදුසු භූමියක් විදිහට CGR එකට අයිති කලින් ට්‍රාන්ස්ෆෝමරය තිබ්බව භූමියක් තියෙනවා.ඒකෙ ට්‍රාන්ස්ෆෝමරය ගලවගෙන ගිහින් තියෙන්නේ එතන.අලුතින් කෝච්චි පාර ආව වුණත්, එතන වැසිකිලිය හැදුවට එතනට ගැටලුවක් වෙන්නේ නෑ.ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ගැන විශේෂ සැලකිල්ලක් අරගෙන මේ යෝජනාවට ඔබතුමාගේ අවධානය දෙන්න කියලා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු යෝජනාවේ මටත් පොඩි දිගුවක් කරන්න ඕන.මොකද මමත් ඉද්දමල්ගොඩ ප්‍රදේශය නියෝජනය කරන නිසා. මං හිතන්නේ වැඩි පිරිසක් ඉද්දමල්ගොඩ ප්‍රදේශයේ අය තමයි බස් එක එනකම් ඉන්නවා ගොඩක් වෙලාවට.බස් එක එනකම් පැයේ හමාර ඉන්න අය ඉන්නවා.ඉතින් ඒ අයට වැසිකිලි පහසුකම් නැතිකම ලොකු අඩුපාඩුවක් ලෙස පවතිනවා.ඒ නිසා ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු යෝජනාව කාලෝචිත යෝජනාවක් නිසා, ඒ ගැන වැඩි අවධානයක් යොමු කරලා සභාවේ ප්‍රමුඛතාව දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මින්නාන වසමට තිබ්බ්ච ලොකු, කල් ඉදන් තිබ්බ්ච අඩුපාඩුවක් තමයි මේ මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළේ.මං හිතන්නේ මෙච්චර කාලයකට මේකට සුදුසු ඉඩමක් තිබුණේ නෑ. මන්ත්‍රීතුමිය කිව්ව වගේ එතන තිබුණු ට්‍රාන්ස්ෆෝමරය ගලවගෙන ගිහින් වෙන ස්ථානයක සවි කරලා තියෙන්නේ.මිනිස්සු ආවට පස්සේ වැසිකිලි යන්න අවශ්‍යතාවයක් ඇති වුණොත්, එතන තියෙන කඩේට ගිහිල්ලා, නැත්නම් ගෙදරකට යන්න ඕන.අවුරුදු ගාණක්ම තිබුණු අඩුපාඩුවක්,ඔබතුමන්ගේ එය කඩිනමින් සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණියගේ 6.1.මීන්නාන හන්දියේ ඇති විශාල අඩුපාඩුවක් ලෙස පොදු වැසිකිලියක් ඉදිකිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (සුදුසු භූමියක් ඇත, ප්‍රතිලාභීන් දෛනිකව 250-300 ක් පමණවේ.)

**සභාපතිතුමා -**
6.2.සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**
**6.2.මීන්නාන නගරය ආශ්‍රිත නිවාස හා ව්‍යාපාරික ආයතනවලට විධිමත් ජල යෝජනා ක්‍රමයක් යෝජනා කරමි.**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මින්නාන ප්‍රදේශයට දැවෙන ප්‍රශ්නයක් වන මේ ජල ගැටලුව දීර්ඝ කාලයක් තිස්සේ තියෙන ගැටලුවක්.1994 - 95 වගේ විදේශාධාරයකුත්, ප්‍රදේශයේ ජනතාවගේ සහයෝගයෙනුත් ටැංකියක් බැඳලා වතුර අරගෙන තියෙනවා. ඒ වුණාට දැනට ඒක විධිමත් නෑ.මොකද තියෙන බට කැඩිලා.දාල තියෙන යකඩ බට මළකඩ කාලා.මැදින් බට කපලා වෙන ගෙවල්වලට අර ගෙන.දැන් නගරයට වතුර එන්නේ නෑ.ඒක ලොකු ගැටලුවක්.ජනතාව හැමදාම කියන ගැටලුවක් ඒක.ඒකට මේ දක්වා හරි විසඳුමක් ලැබිලා නෑ.ඉතින් දැනට ටැංකිය තියෙනවා.උල්පත තියෙනවා.ඒ ටැංකියයි, උල්පතයි පාවිච්චි කර ගෙන අලුතින් බට පද්ධතියක් දාලා ඒ ගෙවල් වලට මීටර් හයි කරලා හරි වතුර දුන්නොත් ජල ප්‍රශ්නය විසඳෙනවා කියලා මගේ විශ්වාශයක් තියෙනවා.ඒ ප්‍රදේශයේ ජනතාවත් ඒක කියනවා, මීටර් දැම්මත් ගැටලුවක් නෑ, ඒකට මීටර් දාල හරි අපිට ජලය දෙන්න කියලා.ඉතින් මේක හැකි ඉක්මනින් පුළුවන් නම් සභාපතිතුමාගේ අවධානය යොමු කරලා මේ ගැටලුව විසඳලා දෙන්න කියලා මං ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණියගේ 6.2.මීන්නාන නගරය ආශ්‍රිත නිවාස හා ව්‍යාපාරික ආයතනවලට විධිමත් ජල යෝජනා ක්‍රමයක් යෝජනා කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
අද දින මං මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් ඉල්ලා සිටිනවා, මම විශේෂයෙන්ම අපි මේ සභාව සඳහා ඔබ ඉදිරිපත් කළ සියලුම යෝජනා අපි සභාවට දාන්න අනුමත කළා.නමුත් සමහර සභා යෝජනා තියෙනවා අපේ විෂය පථයට ගැළපෙන් නැති. අපි ලේකම්තුමත් එක්කත් සාකච්ඡා කළා.මේ පාර සියලුම යෝජනා ඉදිරිපත් කළා.එකක් තමයි,පළාත් සභා කෙටුම්පත දෙන්න ප්‍රමාද වුණා.ඒ වගේම රීති මාලාව දෙන්න ප්‍රමාද වුණා.අද දින ලබා දුන්නා.මං හිතනවා ඊළඟ සභා වාරයේ දී ඒ ගැන අධ්‍යනයක් කරන්න.පරණ මන්ත්‍රීවරුන් නම් ඒවා කියවල බලලා තියෙනවා.එහෙම අපිට සභාවේ ඉස්සරහට අවශ්‍ය නැති යෝජනා ඉදිරිපත් නොකෙරුවොත් අපිට ඉස්සරහට කරගෙන යන්න පුළුවන්.අපරාද කාලයක් වැය නොවන පරිදි.

**සභාපතිතුමා :-**
6.3.සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා :-**
**6.3.පලිගල අඹගස්තැන්න මාර්ගය ඉහළ කොටස මීටර් 400 ක් දුරක් කොන්ක්‍රීට් කිරීම යෝජනා කරමි.(දිනේෂ්ගේ ගෙදර ළඟ සිට)**

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පලිගල අඹගස්තැන්න මාර්ගය දිනේෂ් මහතාගේ නිවසින් ඉහළ කොටස ගෙවල් 14 ක් තියෙනවා.ඒගොල්ලෝ තේ රබර් තමයි ජීවනෝපාය විදිහට කරන්නේ.දැනට වාහනයක් යන්න හැකියාවක්

නෑ එතනින් ඉහළට. මීටර් 400 ක දුරක් තියෙන්නේ අබලන් ම ස්ථාන. ඒ ටික කඩිනමින් අලුත්වැඩියා කර දෙන ලෙස යෝජනා කරනවා.

ඒ අනුව සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ 6.3.පලිගල අඹගස්තැන්න මාර්ගය ඉහළ කොටස මීටර් 400 ක් දුරින් කොන්ක්‍රීට් කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (දිනේෂ්ගේ ගෙදර ළඟ සිට)

**සභාපතිතුමා :-**
6.4.සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ යෝජනාව.

**සභිකකේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
**6.4.පලීගල සිට මියනකොලතැන්න මාර්ගයේ අබලන් වී ඇති ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.**

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා -**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභිකකේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පලීගල මියනකොලතැන්න මාර්ගය පලිගලින් පටන් ගන්න පිවිසුම් මාර්ගය ඒක ස්ථාන 09 කින් අබලන් වෙලා තියෙනවා.කොන්ක්‍රීට් මාර්ගය තැනින් තැන ඉන්ටලොක් ගල් දාපු තැන් කිපයකුත් තියෙනවා.වාහනයක් යන්න බැරි තරමට අබලන් වෙලා.ඒක ඉතා කඩනමින් ප්‍රතිසංස්කරනය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ 6.4.පලීගල සිට මියනකොලතැන්න මාර්ගයේ අබලන් වී ඇති ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.5.සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමාගේ යෝජනාව.

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**
**6.5.හක්කොන් සුමනසාර මාවත මාර්ගය පාසල් විකල්ප මාර්ගය සොම්සාර කඩේ දක්වා පැති බැම්ම යොදා කොන්ක්‍රීට් අතුරා ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.**

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, උඩුමත්ත පාසලේ දරුවන් එක්දාස් දෙසීයක් විතර මේ පාසලේ ඉගෙන ගන්නවා. ඒ දරුවන්ගෙන් හත්සියයක් වගේ ප්‍රමාණයක් ප්‍රධාන පාරෙන් තමයි පාසලට ඇතුල් වෙන්නේ. නමුත් මේ පාසල පවත්වන දිනේට වාහන තදබදයක් ඇතිවෙලා ගමේ තියෙන වාහන වලටත් අපහසුයි ගමන් කරන්න.මේ මාර්ගය දැනට භාගයක් හදලා තියෙන්නෙ බෝක්කු 6 ක් 7 ක් වගේ දාල.ඉතුරු ටිකත් අපට හදාගන්න පුළුවන්නම්, ඒ වාහන තදබදයටත් ළමුන්ගේ ආරක්ෂාවටත් සුදුසුයි කියලා මං යෝජනා කරනවා.ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මං යෝජනා කරනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මං හිතන්නේ ඒක වඩාත් සුදුසු යෝජනාවක්. මොකද උඩුමත්ත පාසලට පැමිණෙන්නේ ඒ අවට ප්‍රදේශවාසීන්ගේ ළමයි තමයි. විශේෂයෙන්ම උඩුමත්ත පාසලට පැමිණෙන්නේ තොරණගොඩ වසමේ අය තමයි. එතකොට මං හිතන්නේ ප්‍රධාන පාරෙන් ඇවිල්ල තමයි මේ ඉස්කෝලෙට එන්නේ.ඒ අතර ඔය පාරට සංවර්ධනය වෙනව නම් දැනට මං හිතන්නේ එතන තිබ්ච්ච අබලන් පාලමත් හදලා ඉවරයි. ඒ හේතුව හින්ද විශේෂ අවධානය යොමු කරලා මේ පාර සංවර්ධනය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමාගේ **6.5.**හක්කොන් සුමනසාර මාවත මාර්ගය පාසල් විකල්ප මාර්ගය සොම්සාර කඩේ දක්වා පැති බැම්ම යොදා කොන්ක්‍රීට් අතුරා ප්‍රතිසංස්කරණය කිරිම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.6.සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමාගේ යෝජනාව.

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**
**6.6.උඩුමත්ත බෝපැත්ත ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතිය කොන්ක්‍රීට් දාලා පිරිසකර කිරිමට යෝජනා කරමි.**

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මගේ අතින් යෝජනා දෙනකොට පොඩි වැරදීමක් වෙලා තියෙනවා. පිරිසිදු කිරීම කියලා තමයි මං දීලා තියෙන්නේ. නමුත් ඒක වෙන්න ඕනේ කාණු පද්ධතිය කොන්ක්‍රීට් දාලා පිලිසකර කරන කියලා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, ඒ කාණු පද්ධතිය නිසා උඩුමත්තේ පටන් ගන්න තැන සිට බෝපැත්ත මාර්ගයේ මීටර් දෙසීයක් වගේ ප්‍රමාණයක් තමයි කාණු පද්ධතිය නැතුව තියෙන්නෙ.ඒ කාණු පද්ධතිය නැතුව තියෙන නිසා අපි කොච්චර පාරවල් හැදුවත් වැඩක් නෑ, වතුර පාරේ යන්නේ පාර මැදින්. ඒකත් එක්කලා ඒ හදපු පාරවල් ටික ආයෙ බාදනයට ලක්වෙනවා. කාණු පද්ධතිය පිරිසකර කරලා වතුර පාර ගලාගෙන යන්න හැදුවොත් පාරවල් ටික කාලයක් පාවිච්චි කරන්න පුළුවන් කියල මම යෝජනා කරනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මං හිතන්නේ බෝපැත්ත මාර්ගයේ නම්,බෝපැත්ත ටිකට අහුවෙන ඒ ටිකේ නම් කාණු නෙමෙයි, මං හිතන්නේ උඩුමත වසමට තමයි මේ ටික අයිති වෙන්නේ.බෝපැත්ත මාර්ගය. නමුත් බෝපැත්ත වසමට නෙමේ,උඩුමත්ත වසමේ මාර්ගයේ කාණු පද්ධතියට තමයි අයිති වෙන්නේ. මොකද මං කන්දත් එක්ක ඇවිල්ලා ...ගෙවල් කිට්ටුව තියෙන පාර වෙන්න ඇති.ඒ ටික වෙන්න ඇති.දෙපැත්තටම තියෙන්නේ ප්‍රධාන පාර. ඒක උඩුමත්ත වසමේ ව්‍යාපෘතියක් තමයි.බෝපැත්ත වසමට සම්බන්ධ වෙන්නේ නෑ.මොකද එතන බෝපැත්තෙ කාණු ඒ ටිකේ ඇත්තේම නෑ. එක පැත්තක තියෙන්නෙ වෙල.අනිත් පැත්තෙන් තියෙන්නේ ගෙවල්.ඒ නිසා ඒක පොඩ්ඩක් අවධානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං පොඩි එකතු කිරීමක් කරනවා, අපි යෝජනාවෙදී මෙන්න මේ ස්ථානයේ සිට මෙන්න මේ ස්ථානය දක්වා කියල නිශ්චිත ස්ථාන දෙකක් තිබ්බනම් අපට ඇස්තමේනතු එහෙම හදන කොට ඉස්සරහට ප්‍රශ්නයක් වෙන්න ඉඩ තියෙනවා.මීටර් ගාණවත් තිබ්බ නම් හොඳයි කියලා පොඩි අදහසක් ඉදිරිපත් කළේ.

**සභාපතිතුමා :-**
මාත් මන්ත්‍රීතුමාගේ යෝජනාවට එකඟ වෙනවා. මන්ත්‍රීවරියටත් ප්‍රශ්නයක් තිබ්බෙ ඒක තමා. ප්‍රධාන මාර්ගය තිබ්බට මීටර් ගාණක් දාල නෑ මෙතන.වඩාත් හොඳයි නිවස ළඟ සිට කියලා දැම්ම නම්.අනිත් මන්ත්‍රීරුත් යෝජනා ඉදිරිපත් කරන කොට ඒ ගැන සැලකිලිමත් වුණොත් හොඳයි.

ඒ අනුව සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමාගේ **6.6.**උඩුමත්ත බෝපැත්ත ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතිය පිරිසිදු කිරිම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.7.සභිකඑම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ යෝජනාව

**සභික එම්.එම්.එම්.මුන්සීර්ම මැතිතුමා :-**
**6.7.අස්ගගුල තනි පොල්ගහවත්ත සහ හතරකෝරලේ වත්ත, කලවිටිගොඩ, ටෙනිස්පෝට් වත්ත වන ගම්මානවලට පානීය ජලය සඳහා ඇති ජල ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,දැන් ඇහැලියගොඩ අවටමත් ජල ප්‍රශ්නය ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙන්නෙ.සතියක් දෙකක් පායන කොට ඉස්සර වගේ නෙමෙයි ඇහැලියගොඩ ඇතුළට එන ගම්මානවල ළිං වලින් හා උල්පත්වලින් වතුර ගත්ත අයට ලොකු අපහසුතාවක් වෙලා තියෙනවා,මේ පායන කාලයේදී වතුර ලබා ගැනීමට. ගරු සභාපතිතුමනි, මේ ස්ථානයේ තියෙන ඒ උල්පතින් සාමාන්‍යයෙන් අවුරුදු විසි පහකට තිහකට කලින් ගමේ මිනිස්සු එකතු වෙලා ඉඩම් අයිතිකාරයත් එක්ක කතා කරලා, පොඩි ටැංකියක් වගේ හදාගෙන, බට සවි කරගෙන ජල ව්‍යාපෘතියක් වගේ හදාගෙන, එම මිනිස්සු පාවිච්චි කරගෙන ඉන්නේ.ඉතින් දැන් ටිකක් හුගක් කලක් ගියපු හින්දා ඒකෙන් පාවිච්චි කරපු කලින් අයගෙන් මෙම ටැංකියට ළං වෙන අයට විතරයි දැනට වතුර ලබා ගන්න පුළුවන් වෙලා තියෙන්නේ.පල්ලෙහාට වතුර එන එක අඩුයි, ඒකෙ පායන කාලයේදී සමහර වෙලාවේදී හරි පිළිවෙලක් නැති හින්ද, සමහර තැන්වලින් වතුර අපතේ යනවා. පල්ලෙහා වතුර උවමනා මිනිසුන්ට වතුර අඩුයි. අපට පුළුවන් මේ ස්ථානවලට, ගෙවල් දෙසීයකට වැඩිය තියනවා, ඒ ගම්මානයේ. ඒ ජල ව්‍යාපෘතිය අපි හරි විදිහට හදා ගත්තොත් අපට පුළුවන් පායන කාලෙටත් එම ස්ථානයේ තියෙන පන්සල්, පල්ලිවලටත් ගමේ තියෙන සියළුම ස්ථානවලට ප්‍රයෝජනවත් වන විදිහට එම ජල ව්‍යාපෘතියෙන් ප්‍රයෝජන ගන්න පුළුවන් කියලා මම හිතනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙක මේ කාරණයට අදාළ වන දෙයක් නෙමේ.හැබැයි ඒකත් එක්ක සම්බන්ධ වන දෙයක්.මේ දවස්වල අපිට පායනවා.දැන් සතියක් එක දිගට පැවුවා. මේ ජල ප්‍රශ්නය අපේ ප්‍රදේශවලහැමතැනකටම බලපානවා. අපි මේක ප්‍රායෝගිකව දෙන්න පුළුවන් එක විසඳුමක් හොයාගන්න ඕන. එතකොට තලාවිටිය තැනක් තියෙනවා.තැන නිවරදිව මතක නෑ.එතනින් ගන්න වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න. අපේ ජල සම්පාදන අමාත්‍යාංශයත් එක්ක කතා කරල ඒකට මුදල් ප්‍රතිපාදනයක් අරගෙන ඒ වගේ වැඩපිළිවෙළකට ගියේ නැත්නම් ඉස්සර මට මතකයි ආව යෝජනා ක්‍රමයක් අවිස්සාවේල්ල පැත්තෙ තල්දූව පැත්ත ඒ වගේඑක ක්‍රියාමාර්ගයක් ගන්න වෙනවා. දැන් මං මේක යෝජනා කරන්නේ ඊයේ නිවුස් බැලුවනම් ඊයේ නඩුවක් දාලා තියෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයක, දේශගුණ විපර්යාසවලට වෙන හානි සඳහා නිසි ක්‍රියාමාර්ගයක් නොගැනීම සම්බන්ධයෙන්. ඒ වගේම දෙයක් අපට වෙන්න පුළුවන්. මිනිස්සු අපට චෝදනා කරන්න පුළුවන්.ගමේ අතන ටැංකි හැදුව, මෙතන ටැංකි හැදුවා කෝ කියල.1991 ප්‍රාදේශීය සභාවට ආපු මන්ත්‍රීවරු කරපු ප්‍රධාන දෙයක් තමා නළ ළිං හා පානීය ජලය සඳහා ළිං ලැස්ති කිරීම.ඒ දවස්වල තිබ්ච්ච ගැටලුත් එක්ක තිබුණ දේ.ඒවා ඔවුන් සිදු කළා.අපි අද අවුරුදු විසි පහකට පස්සේ අපි කිසි වැඩපිළිවෙලක්. අපට සභාවට කරන්න බෑ විශාල ව්‍යාපෘතියක්.ඒ ජල සම්පාදන අමාත්‍යාංශය සමඟ කතා කරලා හරි මධ්‍යම

ආණ්ඩුව එක්ක කතා කරලා හරි ආණ්ඩුකාරතුමිය එක්ක කතා කරලා පළාත් සභා මුදල් වලින් හරි අරගෙන නිසි වැඩපිළිවෙලක් හදා ගත්තොත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට හරි ආසනයටම හරි මේ ඉන්න ජනතාවට වතුර නිසි විදියට දෙන්න පුළුවන් වැපිළිවෙලක්.මං හිතනවා ඒක ගොඩක් දුරට සාර්ථක වෙයි නැත්නම් තව අවුරුදු පහකින් මේක දිගටම එන්න තියෙනවා. මොකද ජල සම්පාදනයෙන් ටවුන් එකට එන වතුර ලයින් එකේ වැස්ස කාලෙටත් වතුර නෑ.පායන කොටත් වතුර නෑ.වැඩිපුර වැස්සොත් මඩ එන හින්ද නවත්වනවා.අඩුවෙන් වැස්සොත් වතුර නැති හින්ද නවත්වනවා.මේකට නිසි ක්‍රියාමාර්ගයක්, අපි යෝජනාවක් අරගෙන අමාත්‍යාංශයත් එක්කත් කතා කරල වැඩපිළිවෙළක් ගමු, කියලා මං යෝජනා කරනවා.මේ ප්‍රතිසංස්කරණ කටයුතු කරන්න ඕන.අර වගේ යෝජනාවකුත් මං ඔබතුමාට ඉදිරිපත් කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ ගයේෂාන් මන්ත්‍රීතුමා කිව්ව වගේ අපි මෙතන සියලුම වැඩි පිරිසකට මේ ජල ප්‍රශ්නය තියෙනවා.මට මතකයි පසුගිය ආණ්ඩුවේ ජල සම්පත් අමාත්‍යවරයා විදියට ගරු වාසුදේව නානායක්කාරතුමා ගරු සභාපතිතුමනි, කුරුවිට ප්‍රාදේශීය සභාවට අයිති තලාවිටිය වසමේ ව්‍යාපෘතිය සියයට අසූවක් අනුවක්ම නිම කරලා තියෙන්නේ. මම දන්න විදියට. එතන ට්‍රාන්ස්ෆෝමරය සවිකර ගැනීම සඳහා ඉඩම් කැබැල්ලක ප්‍රශ්නයක් තමයි තියෙන්නේ.ඒකත් මං හිතන්නේ කුරුවිට ප්‍රාදේශීය ලේකම්තුමියගේ, ඔබතුමා තහවුරු කරගන්න.පොඩි ගැටළුවක් තියෙන්නේ.ඒ නිසා මං විශ්වාස කරනවා අපේ මේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ වසම් 44 ම මේ ජල ප්‍රශ්නය යම් ප්‍රමාණයකට බලපානවා. විශේෂයෙන් ම ඇහැලියගොඩ නගරය, මෝරගල, අස්ගගුල උතුර දකුණ, බුළුගහපිටිය, රොස්ලින්වත්ත ඒ වගේ දැඩිව බලපානවා., මං යෝජනාවකුත් ගෙනාවා.ගියපාර සභාවේ යෝජනාවක් කළෙත් ඒකයි. දැඩිව මුහුණ දෙන අර්බුදකාරී ප්‍රශ්නයක්.මානුෂීය ප්‍රශ්නයක්.ඒ නිසා මං ඔබතුමාට අදහසක් විදිහට ඉදිරිපත් කරන්නේ ඒ සම්බන්ධව අපේ ප්‍රාදේශීය ලේකම්තුමිය එක්ක කතා කරලා, අපි සම්බන්ධීකරණ කමිටුවෙත් කතා කරල තියෙනවා, මීට පෙර සභාපතිතුමා යටතේ. ඒ නිසා අපිට මේ ප්‍රශ්නයට ඉතාමත්ම කෙටි කාලීන උත්තරයක් ගන්න පුළුවන්.ඒ සම්බන්ධව ඔබතුමා මැදිහත් වෙලා මේ තලාවිටිය මේ බල ප්‍රදේශයට ම වතුර ගන්න පුළුවන් විදියට සැලසුම් කළේ ගරු වාසුදේව නානායක්කාර මහතා, එතුමා සිහිපත් කරමින් ඔබතුමා ඒ සම්බන්ධව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.තව ඇත්තේ පොඩි ප්‍රමාණයක්. ට්‍රාන්ස්ෆෝමරය සවිකර ගැනීමේ ගැටලුවක් තමයි තියෙන්නේ දන්න විදිහට.ඒ ගැන අවධානය යොමු කරන්න.

**සභාපතිතුමා :-**
මේ ගැන තමයි මම පහුගිය කාලේ වැඩිපුර සොයා බැලුවේ. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයත් වසම් 44 තුළ ප්‍රාදේශීය ප්‍රධානම එක තමයි ජල ගැටලුව.ඒ සඳහා ඔබ දෙපළම යෝජනා කළා තලාවිටිය.තලාවිටියේ යෝජනා ක්‍රමය.ඒ යෝජනා ක්‍රමයේ තියෙන මූලික වැරැද්ද තමයි, ඒ ඉඩම් අවශ්‍ය කරන භූමිය අත්පත් නොකර තමයි සංවර්ධන කටයුතු කරලා තියෙන්නේ.ඒක දේවාල හා නින්දගම් පනත යටතේ තියෙන ඉඩමක්. එතනින් අපි ඒක බුද්ධ ශාසන අමාත්‍ය සුනිල් සෙනෙවි මැතිතුමා මැදිහත් වෙලා,කොමසාරිස්ගේ බලයෙන් මේක අපි ඉවත් කර ගත්තා.අනිත් ප්‍රශ්නය තමයි, මේක අයිති ගොවිජන සේවා එකට. ඒක ගොවිජන සේවා එකෙන් අනුමැතිය අරගෙන නෑ.සංවර්ධන යෝජනාවල මුලින් කරන්න තිබ්බව ඒවා කරපු නැති එක. සියයට අසූවක් හරි.සීයට අසූවක් නිම වෙලා.මුලින් කරන්න තිබ්බව ඒවා නොකරපු හින්දා හිරවෙලා තියෙනවා. අපි ඒකට මැදිහත් වුණා.අපි ඇමතිතුමාගේ ලේකම් එක්ක රත්නපුරේට ගිහිල්ල, අපි දිස්ත්‍රික් ලේකම්තුමා හමුවෙලා එයා සමග, භාග්‍යා ලේකම්තුමා,ඒක කුරුවිටට අයිති වෙන්නේ,අපි යෝජනාවක් සම්මත කරගෙන,ඒකත් අපි නිදහස් කර ගත්තා.අපේ අනිත් කැබ් එක අනතුරට පත්වෙලා.අද උදේ පාන්දර සභාපතිතුමාට අයිති කැබ් එක රත්නපුර ගියේ ඔය කාරණයට. දැන් හිර වෙලා ගොඩක් දුරට ගිහිල්ල ඉවරයි. මන්ත්‍රීතුමා ඒකේ දැන් ප්‍රතිපාදන හම්බෙලා තියෙන්නේ. මුදලුත් තියෙනව, ඉතුරු ටික කරන්න විදියක් නෑ දැන් ගොවිජන එකෙන් අනුමත වුණාට මේක කොළඹට ගිහිල්ලා නෑ.දැන් අපේ ලේකම්තුමා වාහනේ අරගෙන රත්නපුර ගියේ ඒක ඉවරයක් කර ගන්න.ඒක ඉවරයක් කර ගත්තොත් අපිට ලොකුවට ගැටලු නෑ.ඒක ධාරිතාව තියෙන්නෙ පවුල් පන්සීයකට විතරයි. එයින් පවුල් දෙසිය පනහක් ඒ ගමේ අය ඉල්ලනවා. නමුත් ඒක දෙන්න වෙනවා.මේ ටික සාර්ථක කර ගත්තොත් අපිට මේ අවුරුද්ද ඇතුළත ඒක ඉවර කර ගන්න අපි උපරිම උත්සාහ කරනවා.සීයට අනූවක්ම සියයට අනූ නවයක්ම විශ්වාසයි. මේකෙ ප්‍රතිපාදන ඇවිල්ල තියෙනවා.ඊළඟට තමයි ඔබතුමා කිවුව වගේ රත්නපුරේට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව ප්‍රදේශය තුළ පානීය ජල ප්‍රශ්නය විසඳගන්න ධාරිතාව මදි. ඒකට එකම විසඳුම තමයි අපිට අවිස්සාවේල්ල ඉඳන්, සුජීව මන්ත්‍රීතුමා කිව්ව වගේ එක යෝජනා කළේ.ඒකට සීතාවක යෝජනා ක්‍රමය කියලා කියන්නේ.ඒකෙ මූලික සැලසුම් ටික හදල ඉවරයි මේකට මිලියන දොළොස් දාහක් යනවා. බිලියන දොළහක් යනවා.2024 වර්ෂයේ තමයි මුදල් පාස්වෙලා තියෙන්නේ. අදියර කීපයකින් කරන්න වෙන්නේ. ලොකු ව්‍යාපෘතියක්. ඒක කර ගෙන යන්න පුළුවන් වුනොත් කුරුවිට දක්වා යනවා. ඇහැලියගොඩට කිසිම වතුර ප්‍රශ්නයක් ඇති වෙන්නෙ නෑ.සුනිල් ඇමතිතුමයි මායි කතා වුණේ,අපට 2030 වෙනකන් ඉන්න බෑ, 2026 දී අපට අදියර කීපයකින් යන නිසා අපිට මූලික මුදලක් ජනාධිපති හරි හම්බෙලා 2026 ට මුදලක් ලබා ගමු මේක පටන් ගමු කියලා.ඇත්තටම අපි ඒක මැදිහත් වෙලා මේ අවුරුද්දේ අපි ඒක ස්ථිර කර ගන්න බලාපොරොත්තු වෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ තලාවිටියේ ජල මාර්ගය මගින් ජලය ලබා ගැනීමේදී මූලික පැන නගින ප්‍රධාන ගැටලුව තමයි, ප්‍රදේශයේ ජනතාවගේ විරෝධතාවයක් ආව ඔබතුමා කිව්ව වගේ ගෙවල් දෙසීයක් දෙසිය පනහක් අතර ප්‍රමාණයකට ජලය නොදී තමයි මෙහෙට ගන්න කියන අදහස තමයි ඔතන නිර්මාණය වුණේ. ඒකත් එක්කම එතන විදුලිය ලබා ගැනීමේ ගැටලු කීපයක් තිබුණා. හිටපු අමාත්‍ය ගරු පවිත්‍රා දෙවි වන්නිආරච්චි මැතිණිය මැදිහත් වෙලා විදුලිය ලබා ගන්න අවශ්‍ය මාර්ගෝපදේශය හරහා ඒ අදාළ ආයතන වලින් ලබා ගැනීමේ හැකියාව ලැබුණා.ඊට අමතරව ට්‍රාන්ස්ෆෝමරයේ ප්‍රශ්නය ලොකුවට තිබුණා.ඒකටත් මං හිතන්නේ ඒ වකවානුවේ මුදල් වෙන් කරලා තිබුණෙ.එක එතනින් එහාට කෙසේ වුණා ද කියන ප්‍රශ්නය තියෙනවා.ඊට අමතරව මෙම ව්‍යාපෘතිය දැනට බදුවත්ත දක්වා වෝර්ටබෝඩ් එකෙන් ජලය සපයනවා. ඒ බදුවත්තේ ඉඳලා තලාවිටිය ගෙවල් 200 ක් 250 ක් ම වෝටර් බෝර්ඩ් එක හරහා දෙන්න උත්සාහ කරා.එතනදි කිලෝමීටර් දෙකක් වගේ ප්‍රමාණයක් තියෙන්නේ.එළලා තියෙන නළ මාර්ගයෙ ධාරිතාව ගෙනි යන්න බැරි ප්‍රශ්නයක්

වුණා.එක නිසා තමයි නතර වෙන්න හේතුව.කෙසේ වෙතත් මේ ව්‍යාපෘතියෙන් සියයට අසූවකට වැඩි ප්‍රමාණයක් නිම වෙලා තියෙන්නෙ.ඔබතුමාගේ කියපු විදිහට මැදිහත්වීමක් තුළින් අපි අපේක්ෂා කරනවා 2026 වර්ෂය තුළ ජලය අපට නගරයට, මං හිතන්නේ අවුරුදු පහක කාලසීමාවකට තමා ඒ ජල ව්‍යාපෘතිය භාවිතා කිරීමට අපේක්ෂා කරේ.මොකද හේතුව සීතාවක ගඟෙන් ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වුණාට පස්සේ නැවත ඒ ජල ව්‍යාපෘතිය ගමට ලබාදීමේ පදනම මත තමයි ගරු අමාත්‍ය වාසුදේව නානායක්කාර ඇමැතිතුමා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළේ.තාවකාලික ව්‍යාපෘතියක් ලෙස. ඒත් පවතින තත්ත්වය තුළ මේ ව්‍යාපෘතිය තුළින් මුළු නගරයට ගත හැකි ප්‍රයෝජනය ගන්න ඔබතුමාගේ උත්සාහය අපි අගය කොට සලකනවා. ඒත් එක්කම මුන්සීර් මන්ත්‍රීතුමා කිව්ව වගේ තනිපොල්ගහවත්ත, හතරකෝරලේ වත්ත, තලවිටිගොඩ, ටෙලිස්පෝට්වත්ත ප්‍රදේශයේ, ඒකත් ප්‍රජා ජල ව්‍යාපෘතියක් මට මතක විදිහට ක්‍රියාත්මක වුණේ.ඒකේ නළ පද්ධතිය අවුරුදු විසිපහක් තිහක් පැරණි වෙන එකක්.ඒ නිසා නළ පද්ධතිය ක්‍රමානුකූලව ප්‍රතිසංස්කරණය කර ගන්න හැකියාව ලැබුණොත් ඒ ප්‍රදේශයේ ජල ප්‍රශ්නය විසඳන්න ලොකු පිටුවහලක් කරගන්න පුළුවන්. එසේ ප්‍රකාශ කරමින් ඔබතුමාට සුබ පතනවා, 2026 වර්ෂය තුළ මේ කටයුත්ත නිමා කර ගන්නටත් ශක්තිය නිර්මාණය වේවායි ප්‍රාර්ථනා කරමින්.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ ජල ප්‍රශ්නය එක දිගටම එන ප්‍රශ්නයක්. මේ වන විට යාය පාර දන්දෙනිය ප්‍රදේශවලට ජල ප්‍රශ්නය මතුවෙලා තියෙන්නේ. දැන් මේ කතා කරපු විදිහට මට මතකයි වාසුදේව මහත්තයා හම්බෙන්න ගියා මේ ප්‍රශ්නය කරන්න.එතුමත් එක්ක කතා කරන කොට කෝටි 600 ව්‍යාපෘතියක් පටන් ගන්නවා කියන එක අපිත් එක්ක කතා කළා. ඊට පස්සේ පාලන කාලය ඉවර වුණා.ඊළඟට බුළුගහපිටියේ ලොකු ටැංකියක් බැඳල වතුර ඒකෙන් තමයි ඇහැලියගොඩට ගත්තෙ. ඒක බලන්න ගියා මේකෙ හිටපු සභාපතිතුමත් එක්ක ඒ බට ඔක්කොම එලපුව තියෙනවා. කන්ද උඩ ටැංකිය ගහල තියෙනවා.ඒකෙන් මේ නගරෙට වතුර අරන් තියෙන්නේ. හැබැයි ඒකෙ මයිටාව මතුවෙනවා කියල ඒක නවත්තල තියෙනවා.මේ වෙන කොටත් විශාල ටැංකියක් වෙල මැද තියෙනවා. වතුර පිරිලා තියෙනවා.තව මං මේ ළඟදිත් ගියා. අපට මේ විද්‍යාව දියුණු තාක්ෂණය දියුණු තියෙන මේ යුගයේ ඒ මයිටාව පිල්ටර් කරන්න පුළුවන් තාක්ෂණය උපයෝගී කර ගෙන තාවකාලිකව ජලය ගන්න පුළුවන් මේකෙ.නගරයට එන බට නම් දැන් නැතිව ඇති.මොකද ඒවා කඩල අරගෙන ඒවා එහෙම කරලා ඇති. ඊළඟ එක තමයි අපේ රෝහලට වතුර ගේන්නේ තලාවිටිය වත්තෙන්, හුලංගස්දළුවෙන්. 20% වතුර ප්‍රයෝජනයට ගන්නේ.අපේ වෛද්‍ය අභය වික්‍රම මහතා ඉන්න කාලෙ, එතුමත් එක්ක සංවිධානය වෙලා නගරයේ රාජ්‍ය ආයතන වලට වතුර දෙන්න වැඩ සටහනක් කර ගෙන ගියා.බට ටිකක් ගෙනැල්ල ලැස්ති වුණාට පස්සේ, පළාත් සභාව සම්බන්ධ වෙලා ඒක දේශපාලනීකරණය වුණා.ඊට පස්සේ ඒක අත ඇරලා දැම්මා.අපට ඒ වගේ විකල්ප අවස්ථා තියෙනවා. ඒ විකල්ප අවස්ථා වලට අපිට යන්න වෙනවා.මොක ද අපි අවුරුදු පහකින් බලාපොරොත්තු වෙනවා වතුර (පැහැදිලි නෑ) ඒතනට යන්න කලින්, දැන් මේ උද්ගත වෙන එක ගිය අවුරුද්දට වැඩිය මේ අවුරුද්ද ,අපි එදා රත්නපුර ලේකම්තුමා වැඩසටහනට සහභාගි වුණ වෙලාවෙත් කතා කළා, එතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා අපිට වතුර දෙන්න කතා කරල තියෙන්නේ, පානීය ජලය.පානීය ජලය කියලා කියන්නේ ලීටර් දහයයි ගෙදරකට. ඒකට ලීටර් දහයක් වතුර දීලා හරියන්නෙ නෑ.මිනිස්සුන්ට බොන්න වතුර කොහෙන් හරි හොයා ගන්නවා.හැබැයි අපි දැනට අගේ කරන්න ඕන ඩීප් කෝනර් එකේ නළ ළිඳෙන් දවස ගානේ මිනිස්සු වතුර අරන් යනවා.ඒ මහත්තයා කරලා තියෙන්නේ විශාල සේවයක් මේ නගරයට. මේ සඳහා අපි මැදිහත් වෙන්න සූදානම් වෙන්න වෙනවා. තව සතියක් මේ විදියට පැවුවොත් එහෙම අනිවාර්යෙන් වතුර බෙදන්න වෙනවා.ඒක නිසා ඒ වැඩේ ක්‍රියාත්මක කරන්න. තලාවිටිය වැඩසටහනටත් සභාපතිතුමා මැදිහත් වෙලා තියෙනවා.මේවා අපි හඳුනා ගෙන ඒවට සම්බන්ධ වෙමු කියලා ඉල්ලීමක් කරනවා.

ඒ අනුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ **6.7.**අස්ගගුල තනි පොල්ගහවත්ත සහ හතරකෝරලේ වත්ත, කලවිටිගොඩ, ටෙනිස්පෝට් වත්ත වන ගම්මානවලට පානීය ජලය සඳහා ඇති ජල ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.8.සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා :-**
**6.8.අස්ගගුල දකුණ බලංගොඩ කඩේ අසල සිට පොදු මාර්ගයේ කාණු (මීටර් 200 ක්)පද්ධතිය නාපවල මහතාගේ නිවස දක්වා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,අපිට දකින්නට පුළුවන් ගොඩක් පිට පාරවල් හදද්දි දෙපැත්තේ තියෙන ඉඩම් මායිම් කරගෙන පාරවල් හැදෙනවා.නමුත් ඒ පාර වලින් වැහි කාලෙට එන වතුර බැස යාම සඳහා ගොඩක් විට කාණු පද්ධතිය හදල නෑ.ඒ වගේම තමයි මෙම ස්ථානයේ තියෙන කාණු පද්ධතිය මීටර් දෙසීයක් විතර තියෙනවා හරි අමාරුයි වැසි කාලෙට.කොහොමත් දවසක් දෙකක් මේ පාරෙ වතුර තියෙනවා. ඒ පාරේ අඩියක් විතර වතුර තියෙනවා.ඒ පාර මාහර පන්සලට යන පාර.මේ පාරේ ළමයින්ට ඉස්කෝලෙ යන්න එන්න පයින් යන කට්ටියට එහෙම යන්න අමාරුයි. එතනින් යන්න වෙන විකල්ප මාර්ගයක් නැති හින්ද මිනිස්සු ඒ වතුරෙන් තමයි බැහැල යන්නේ. සමහර විට ඒ වතුර වලින් ලෙඩ රෝග බෝ වෙන්නත් ඉඩ තියෙනවා. එවැනි තත්ත්වයෙන් තියෙන ඒ කාණු පද්ධතිය ඉතා ඉක්මනින් පුළුවන් විදිහට සංවර්ධනය කරලා දෙන්න කියලා මං ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ **6.8.**අස්ගගුල දකුණ බලංගොඩ කඩේ අසල සිට පොදු මාර්ගයේ කාණු (මීටර් 200 ක්)පද්ධතිය නාපවල මහතාගේ නිවස දක්වා සංවර්ධනය කිරිම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.9.සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා :-**
**6.9.කැකුනුමලය මාර්ගය සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, කැකුනුමලය මාර්ගය අපේ නගරයේ තියෙන කුඩා ගම්මානයක්.ගෙවල් 30 ක් විතර තියෙන කුඩා ගම්මානයක්.නගර ලඟම තියෙන තුඩා ගම්මානයක්. අස්ගගුල දකුණ වසමට තමයි අයිති වෙන්නේ. එම ස්ථානයේ වැසි කාලෙට ගං වතුර දානවා. හේතුව බිසෝ උයනෙන් එන ඇල මාර්ග ඔක්කොම එය ගම්මානයෙන් තමයි පල්ලෙහාට යන්නේ.ඉතින් ඒ ඇල මාර්ගයේ ගස් වැව්ලා කුඹුරත් එක්ක ,ඒ තත්වයෙන් තමයි දැනට තියෙන්නේ.ඒ ගම්මානයේ තියෙන ලොකුම අබලන් තත්ත්වය තමයි ඔය පාරෙ වතුර පිරුණාහම එහාට මෙහාට යන්න බැ.මඩ පිරිල සම්පූර්ණ අබලන් තත්ත්වයේ තමයි ඒ පාර තියෙන්නේ. ඒ පාර ඉතා ඉක්මනින් සංවර්ධනය කරලා දෙන්න කියල මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ **6.9.**කැකුනුමලය මාර්ගය සංවර්ධනය කිරිම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.10.සභික එච්.ආරියදාස මැතිතුමා මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා මැතිතුමා:-**
**6.10.යාය පාරේ රාජාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මට පොඩි වචනයක් කියන්න අවස්තාව දෙන්න.පසුගිය වසර දෙක තුළ රුපියල් ලක්ෂ පහක මුදලක් මම වෙන් කළා මං හිතන්නේ අපේ මන්ත්‍රීතුමත් ඒක දන්නව ඇති.එතකොට ඒ වෙලාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුදල් අනුමත වෙලා, නමුත් තිබ්ච්ච අර්බුදයත් එක්ක කොන්ත්‍රාත්කාරයෙක් ඉදිරිපත් වුණේ නෑ ගරු සභාපතිතුමනි. ඒ නිසා අපේ ආරියදාස මන්ත්‍රීතුමා කාලෝචිත යෝජනාවක් ගෙනාවේ. ඒ ගෙවල් 10 වගේ ප්‍රමාණයක් තියෙනවා. සැදිය යුතු පාරක්.යකුදාගොඩ වසම ගත්තාම ඔබතුමා නිරික්ෂණය කරලා ඇති,වැඩි පාරවල් ප්‍රමාණයක් හදල ඉවරයි මේ වෙන කොට.එතුමාගේ යෝජනාවට ප්‍රමුඛත්වය ලබා දීලා කටයුතු කරන්න බොහොම ස්තුතියි.

**සභික එච්.ආරියදාස මැතිතුමා මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සුජීව මන්ත්‍රීතුමා කියපු එක ඇත්ත.මොකද යාය පාර ප්‍රධාන පාරට මුහුණලා තියෙන පාරක්.ඒ පැත්තෙ පාරවල් ඔක්කොම වගේ සංවර්ධනය වෙලා, මේ පාර සංවර්ධනය වෙලා නෑ.මේකෙ මිටර් 150 විතර දුරත් තියෙන්නේ.පවුල් දහයක් පහළොවක් විතර ඉන්නවා. ඒක සංවර්ධනය කරලා දෙන්න කියලා යෝජනා කරනවා.

ඒ අනුව සභික එච්.ආරියදාස මැතිතුමා මැතිතුමාගේ **6.10.**යාය පාර රාජාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරිම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.11.සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා මැතිතුමා:-**
**6.11.විමලේ මුදලාලිගේ කඩේ ළඟින් ඇතුළට තියෙන පාර සංවර්ධනය කිරිම යෝජනා කරමි.**
මේක සංවර්ධන කමිටුවේ යෝජනා කරලා දා ගත්ත පාරවල් මේවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒකත් පොඩ්ඩක් පැහැදිලි කරනවා.මීට වසර පහළොවකට පමණ පෙර එතුමාගේ නැගණිය අභාවයට පත්වුණා. මං හිතන්නේ ඔබතුමා ඒකට සම්බන්ධ වුණා ද දන්නෑ.ඒ වෙනකොට ගරු සභාපතිතුමනි, අඩි තුනක පාරක් තිබුණේ. ඔබතුමා නිරීක්ෂණයට ගිය මාර්ගය නෙමේ මේ කියන්නේ.එතකොට ලොකු අර්බුදයක් ඇති වෙලා පාරේ මිනිය ගෙනියන්න බැරි ප්‍රශ්නයකට පවා මුහුණ දුන්නා.ඒ වෙලාවේ මං මැදිහත් වෙලා රටේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක නොවන අවස්ථාවක ප්‍රතිපාදන වෙන් කරලා තිබුණා මම තමයි ලංකාවෙම එම ව්‍යාපෘති ආරම්භ කළේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම්

කාර්යාලයේ. ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි අමාත්‍යතුමිය මැදිහත් වෙලා මේකට මට මුදල් දුන්නා. ඒ පාරේ රුපියල් ලක්ෂ පහක.ඊට පස්සෙ ඒ වැඩේ කර ගන්න අපිට බැරි වුණා.අපි පාර පළල් කරලා. ඒ වෙලාවේ ව්‍යාපාරිකයෝ ඉදිරිපත් වුණා, සල්ලි වියදම් කරන්න.අපි රුපියලක්වත් වියදම් කළේ නෑ. ගරු සභාපතිතුමනි, ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වෙලා, ඒ පාර පළල් කරලා දීලා ලස්සනට හදල දීල තියෙනවා.ඒ නිසා අපේ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව මං ස්ථිර කරමින් ඒ සඳහා මුදල් වෙන් කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ සුජීව මන්ත්‍රීතුමා පැහැදිලි කරන ටික ගැටලුවක් නෑ.අපේ කොට්ඨාශයේ ඉන්නවා 5 දෙනෙක් මෙතන.මේක කොන්ක්‍රීට් කරලා නෑ.(ඝෝෂාව)මේ පාර සංවර්ධනය කරන්න තමයි අපි කතා කරන්නේ. ඒ නිසා පවුල් පහළොවක් විතර ඉන්නව ඊටත් වැඩි ජනතාවක් ඉන්නවා. මං හිතන්නේ පාර කැඩිල බිඳිල තියෙන්නෙ. ඒක සංවර්ධනය කරන්න යෝජනාව දැම්මෙ.

**සභාපතිතුමා :-**
ගරු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මං ඉල්ලා සිටිනවා, තමන්ගේ යෝජනාව කරලා ඒක ස්ථිර කරාට පස්සේ අදහස් දක්වන්න, යෝජනාව ඉදිරිපත් කරාට පස්සේ අදහස් දක්වන්න යෝජනා කරලා ඉඳගන්න.කියන්න ඕන නැනේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මේක රීති ප්‍රශ්නයක්. රීති වල තියෙනවා එකොළොස්වැනි රීතිය. කල්දී ඇති යෝජනාවල "කිසියම් යෝජනාවක් සභාවට යෝජනා කිරීමෙන් අනතුරුව වෙනත් සභිකයකු විසින් ස්ථිර කළ යුතු අතර එලෙස යම් යෝජනාවක් ස්ථිර වන තෙක් යෝජනාව පිළිබඳව යෝජක විසින් හෝ වෙනත් සභිකයකු විසින් අදහස් දැක්වීමක් නොකළ යුතුය." වශයෙන්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,යෝජනාව හරි.යෝජනා කරන මන්ත්‍රීවරයා ඒ යෝජනාව කරලා ඉඳගන්න ඕන.ඊළඟ කෙනාට අවස්ථාව දෙන්න ඕන.ස්ථිර කරන්න අවස්ථාව දෙන්න ඕන.ඊට පස්සේ පැහැදිලි කරන්න දෙන්න ඕන.ඒකට බාධා කිරීමක් නෑ.හැබැයි මෙතනදි වුණේ අපේ ආරියදාස මන්ත්‍රීතුමා හිටගෙන හිටියා. වාඩිවෙන්න ඕනෙ.(ඝෝෂාව)

ඒ අනුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ **6.11.**විමලේ මුදලාලිගේ කඩේ ළඟින් ඇති පාර සංවර්ධනය කිරීම (මීටර් 100 ක් පමණ) යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.12.සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව'

**සභික එච්.ආරියදාස මැතිතුමා මැතිතුමා -**
**6.12.දෙල්ගහ කොටුව වත්තේ පිහිටා ඇති පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමාමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ පොදු ළිඳ කාලෙකින් ප්‍රතිසංස්කරණය කරලා නෑ.ඒක අත්‍යවශ්‍ය කාරණයක්.ලමේ මිනිස්සු නාන ළිඳක්.මං හිතනවා මේක මේ වන කොට සංවර්ධනය විය යුතුයි කියලා.ජල ප්‍රශ්නයක් උග්‍ර වෙන කොට සමහර වෙලාවට මේක,නාන ළිං බොන ළිං බවට පරිවර්ථනය කරනවා.ඒක නිසා මේක සංවර්ධනය කරලා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ **6.12.**දෙල්ගහ කොටුව වත්තේ පිහිටා ඇති පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.13.සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
**6.13.භාවිතයෙන් ඉවත් කර ඇති මාරඹේ සේවා පියස නැවත ප්‍රතිසංස්කරණය කර නැවත භාවිතයට ගැනීම සම්බන්ධව සොයා බැලීමට යෝජනා කරමි.**

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නැගෙනහිර කලටුවාව වසමට ප්‍රධාන අවශ්‍යතාවයක් වුණු සේවා පියසක, නැත්නම් ප්‍රජා ශාලාවක අවශ්‍යතාවය තදින්ම බලපාලා තිබුණා. මෙම ප්‍රජා ශාලාව ජනතාවගේ හා ප්‍රදේශවාසීන්ගේ හා තරුණ ක්‍රියාකාරීන්ගේ ඉල්ලීම පරිදි 2010 වසරේදී ප්‍රජාශාලාවක් ලැබෙනවා මාරඹේ ප්‍රදේශයට.ඉතින් ඒ ප්‍රජා ශාලාවේ වැඩ කටයුතු 2010 වසරේදීම අවසන් වීමෙන් පසු මෙම ප්‍රජාශාව තුළ ග්‍රාම නිලධාරීන් ඇතුළු නිලධාරීන් ප්‍රජා ශාලාව තුළ රාජකාරී කරනවා. ඉතින් නිලධාරීන්ට ප්‍රජාශාලාව තුළ රාජකාරී කරන්න පුළුවන් වුණේ අවුරුදු එකහමාරක වගේ කාලයක් පමණයි. එම ප්‍රජාශාලාවේ අවිධිමත් සංවර්ධනය නිසා අවුරුදු එකහමාරක් දෙකක් වගේ කාලය තුළදී එම ප්‍රජාශාලා වෙන් ප්‍රදේශවාසීන්ට හා ග්‍රාම නිලධාරීන්ට ඉවත්

වෙන්න සිදු වුණා.ඉවත් වීමෙන් පසු ප්‍රජාශාලාව ඇත්තටම වල් බිහිවෙලා කැළෑට ගියා. නැවත නැගෙනහිර කලටුවාව වසමේ මන්ත්‍රීවරයා ලෙස මං පත්වීමෙන් පසු ,නැවත මේ ගැන සොයා බලන්න පටන් ගත්තා.ඇත්තටම කණගාටුදායක කාරණය නම්, ප්‍රජා ශාලාව ගැන සොයා බලන කොට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයවත් කිසිම තැනක මේ ප්‍රජා ශාලාව ගැන තොරතුරක් නෑ. අත්පත් කර ගත්තෙ කොහෙන්ද, අත්පත් කරගත් ලේඛන, මුදල් යෙදෙව්වේ මොන ආයතනයෙන්ද කරපු කොන්ත්‍රාත්කරු කවුද කිසිම තොරතුරක් මට මේ වෙන කොට හොයා ගන්න බැරි වුණා.ඉතින් මම ප්‍රදේශවාසීන්ගේ ශ්‍රමදායකත්වයෙන් මේ ප්‍රජා ශාලා භූමිය සුද්ද කළා. සුද්ද කරලා ඉවර වෙලා, පොඩ්ඩක් බැලුවා ඒ දවස්වල විවෘත කරන කොට පලකයක් තියලා විවෘත කරනවනේ.බැලුවහම එතනත් කණගාටුදායකයි ඒ පලකයත් නෑ එතන.ඒකත් ගලවපු එක තියෙනවා. අර උඩින් පාත් වෙච්ච ප්‍රජා ශාලාවක් වගේ මේක ගැන කිසිම තොරතුරක් නෑ.මම සභාවට යෝජනා කරන්නේ මේක ගැන තොරතුරු සභාව සතුව තියෙනවනම් ඒ ගැන සොයා බලනව වගේම නැවත මෙය ප්‍රතිසංස්කරණය කර ජනතාවට ප්‍රයෝජනය ගන්න සාදා දෙන්න කියලා. මේ සම්බන්ධව සොයලා බලලා වගකිව යුතු ආයතන හා වගකිය යුතු අවිධිමත්ව ප්‍රතිසංස්කරණය කරපු අයට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්න කියමින් මං යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, අපේ නිමේෂ් තරුණ මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාමත් ම හොඳයි. අපි බලන්න ඕනෙ මෙතන මේ වගේ සේවා පියසක් ඉදි කළේ ඇයි කියලයි, ඊට අමතරව මේ වගේ සේවා පියසක් ඉදි කරලා මේක වැහිල තියෙන්නෙ ඇයි කියලයි, හේතු හොයල බලන්න ඕන. ඇත්තටම කාලයක් යනකොට සමහර ඉදිකිරීම් තියෙනවා,සමහර ගොඩනැගිලි තියෙනවා, කාලීන අවශ්‍යතාව නැතිවෙලා යනවා. එම අවශ්‍යතාව නැතිවීම නිසාද දන්නෑ මේ ගොඩනැගිල්ල අතහැරලා දාල තියෙන්නේ.හැබැයි ඒක නිමේෂ් මන්ත්‍රීතුමාගේ යෝජනාව ඒ නිලධාරීන්ට දඬුවම් කරන්න ඕන කියල. ඒකට වගකිවයුතු නිලධාරීන්ට දඬුවම් කරන්න ඕන කියල. ඒක කොච්චර දුරට සාධාරණද නැද්ද කියන එක ගැටළුවක් අපට තියෙනවා.මොකද මං අර කලින් කියපු කාරණාවත් එක්ක, සමහර ඒවාට හේතු සාධක තියෙනවා.සමහර වෙලාවට ඊට වඩා නව ගොඩනැගිල්ලට එතන හිටපු සේවා පියසේ සිටි නිලධාරීන් යන්න ඇති. එහෙම නැත් නම් ඒ සේවා පියසේ දීර්ඝ කාලයක් තිස්සේ අඩුපාඩු තියෙන්න ඇති. ඒ වගේ හේතු බලලා ඒ වගේ තීරණයක් ගන්න එක හොඳයි.නැත්නම් මේ වගේ සභාවක මේ වගේ සාකච්ඡා කරා කියල,ඒ නිලධාරීන්ට ආරංචි වුණොත් එහෙම සමහර වෙලාවට එක මං දන්නෑ දකුණු පස සිටින මන්ත්‍රීවරුන්ට කොහොමද දන්නෙ නෑ.අපේ පැත්තෙ ඉන්න අය, වම් පැත්තෙ ඉන්න අය මේකට එච්චර එකඟ වෙන්නේ නෑ. මොකද නිලධාරීන් අපහසුතාවට පත් කරන හේතුවක් සාධාරණ හේතුවක් තියේද නැද්ද කියන දේ ඉස්සෙල්ල හොයල බලන්න ඕන. මොකද මේ අපේ නිමේෂ් මන්ත්‍රීතුමාගේ යෝජනාවෙන් ඉදිරියට ආවේ නෑ, සේවාව පියස ඉදිකරලා එතනින් එහා ක්‍රියාමාර්ග මොනවද ගන්නෙ කියන එක, ඒ යෝජනාවේ නෑ. අපි පැහැදිලි කරගන්න ඕනෙ, සේවා පියස නැවත ඉදිකරලා, එතනින් එහාට ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘර්ධි නිලධාරී ඒ ස්ථානයට ස්ථානගත කරනවද? නැත්නම් ඒ සේවා පියස වෙනත් කාර්යකට යොදා ගන්නවා ද කියන එක.අපිට පොඩි පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා සභාපතිතුමනි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, ඇත්තතටම වියලගොඩ වසමෙත් ක්‍රීඩා පිටිය එහා පැත්තෙ තියෙනවා ඒ වගේම අඩක් නිමවුණු කොන්ක්‍රීට් කණු ටිකක් දාලා ස්ලැබ් එකක් දාපු වල් බිහි වෙච්චඔය විදිහටම හදපු ඉදිකිරීමක්.ගොඩක් වෙලාවට මේ ඉදිකිරීම් මොකක් හරි යෝජනා විදිහට අරන්,ඊට පස්සේ මන්ත්‍රීවරුන් විදිහට යෝජනා දාලා ඊට පස්සේ ඒව අවසන් කරන්න හරි, නැත්නම් ඒවා, ඇත්තටම මේ වියදම් කරන්නේ කාගෙවත් මුදල් නෙමෙයි. මහජන මුදල්. නැගෙනහිර කලටුවාව වසමේ ඒ ගොඩනැගිල්ල මමත් දැක්කා. ඒක භාගයක් ඉදිකරලා, ඒ ගොඩනැගිල්ල දැනට පුපුරල ගිහින් තියෙන්නේ. තලාවිටිය ජලය යෝජනා ක්‍රමයත්, ඒ වගේ තමා.හරියට අත්පත් කර ගැනීම් කරගෙන නැතිව.නිසි ක්‍රියාමාර්ග අදාල පියවරයන් යන් නැතුව තමයි මේ දේවල් කරලා තියෙන්නේ. ඉතින් ඇත්තටම මේවා ගැන සොයලා බලන්න ඕන. මේක කොහොමද වුණේ. කවුද කරේ.දැන් ඇත්තටම බිම් මට්ටමේ ජනතාවගෙන් යෝජනාවක් ආවට පස්සේ, ඒක ගැළපෙනවද? ඒක කරන්න පුළුවන්ද? ඒකට තමයි නිලධාරීන් ඉන්නේ.ඒ අදාළ ආයතනවල.ඒක කරන්න පුළුවන් නම් තමයි ඒක කරන්න ඕන. මං කියන්නේ ඇත්තටම ඒවා නැවත ජනතාවගේ පාවිච්චියට ගන්න අපි ඒවා ප්‍රතිසංස්කරණය කරලා වැඩ අවසන් කරලා ඒවා භාවිතයට ගන්නව වගේම,අපි ඇත්තටම සොයා බලන්න ඕන, ඒවා කොහොමද වුණේ? මොකද්ද වුණේ දේවල්. ඒ නිසා මම නම් මං හිතනවා අපේ සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනාගේම එකඟ වෙයි.මං හිතනවා මේවා සොයලා බලන්න ඕන කාරණා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මෙතන පොඩි ගැටළුවක් තියෙනවා.දැන් නිලධාරීන්ට අපි චෝදනාවක් එල්ල කළා. එතකොට අපි බලන්න ඕන,මේ වැඩසටහන යටතේ,දැන් මෙතන කාරණය ගමු. සේවා පියස කියලා නමක් භාවිතා කරනවා. ප්‍රජා ශාලාව කියලා නමක් භාවිතා වෙනවා. ගමේ ප්‍රජා ශාලාව ගමේ ප්‍රජාවගේ පොදු කටයුතු සඳහා මරණාධාර රැස්වීම් තියන්න, ආගමික මොකක් හරි වැඩසටහනක් තියෙනවා නම් ඒක තියන්න ගන්නේ. ඒවා සේවා පියස කියන එකේ අපි භාවිතා කරපු දේ තමා ගමේ ඉන්න සේවා පියස කියන එක හරියටම කියනව නම්, රජයේ නිලධාරීන්ට ගිහිල්ල තමන්ගේ සේවාව ලබාදෙන ස්ථානය, සේවා පියස. එතකොට අපි මේක ගමේදී භාවිතා කළා සේවා පියස කියන එක. ගමේ ඉන්න නිලධාරී පස්දෙනාට තමන්ගේ කාර්යාල පවත්වා ගෙන යන්න. එතකොට මේ ගැටුමක් ඇති වෙනවා.එතකොට ප්‍රජා ශාලාවක් හදල දුන්නට පස්සේ කිසියම් කාලෙක ආණ්ඩුවකින් හදල දෙන්නේ, ඒ ප්‍රදේශයේ මහජනතාවගේ ඉල්ලීම මත. එකිනෙකාගේ ඉල්ලීම මත. රජයේ නිලධාරීන් මුදල් වැය කරලා ඒ දේ හදල දුන්නට පස්සේ ඒක පවත්වා ගෙන යෑම, සම්බන්ධ වගකීමක් ගමේ ජනතාවට තියෙනවා. අපේ ගමෙත් ප්‍රජා ශාලාවක් තියෙනවා. නඳුන් මන්ත්‍රීතුමා දන්නවා. ගොරකයාගේ වත්තෙ පාලම ගාව වම්අත පැත්තෙත් ප්‍රජා ශාලාවක් තියෙනවා. ඒක අවමංගල්‍යාධාර සමිතිය රැස් වෙනවා.සුද්ද පවිත්‍ර කරලා තියා ගන්නවා.එතකොට ගමේ ජනතාවට වගකීමක් තියෙනවා. තමගේ ගමට ලැබෙන සම්පත හරියට පරිහරණය කරන්න.එතකොට ඒ කාලය තුළ මම කියන් නෑ, අනවශ්‍ය දේවල් නොවුනා කියලා. අනවශ්‍ය දේවලුත් වෙලා ඇති.හැබැයි සංවර්ධන යෝජනා ඒ ප්‍රදේශයේ ජනතාව

විසින් සිදු කරපු ඉල්ලීම් මත යම්කිසි ආණ්ඩුවකින් ඒක UNP වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා ආණ්ඩුව වෙන්න පුළුවන්, දැන් ජාතික ජන බලවේගය ආණ්ඩුවෙන් වුණත් හදන්නේ, ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමක් මත. එතකොට අපි ඒක හදාගන්න ඕනෙ, ජනතාවට වගකීමක් තියෙනවා, තමන්ගේ ගමට ලැබුණු සම්පත, අපේ ගමේ තියනවා පුස්තකාලයක්. දැන් හදල අවුරුදු දහයක් විතර වෙනවා. එතකොට ඒක ගමේ මිනිස්සු පාවිච්චි කරනවා. හැබැයි ඒ පුස්තකාලේ ගමේ මිනිස්සු පාවිච්චි කරන්නේ නැත්නම්, හදල දීමේ අරමුණ ඉෂ්ට වුණත් හැබැයි, හදන්න ඕන අරමුණ ඉෂ්ඨ වෙලා තියෙනවා.හැබැයි ඒක පාවිච්චි කරනවද කියන, ගැටළුවක් තියෙනවා. එතකොට අපි නිලධාරීන්ට චෝදනා කරන්න කලින්, වරදක් වෙලා තියෙනවනම් ඕනෑම කෙනෙක් එක්ක ආගියු කිරීම කිසිම ගැටලුවක් නැහැ.සභාවේ ඉන්න කාලෙවත්, අනිවාර්යෙන්ම අධිභාරයක් වෙලා ඒක ගෙවන්න වෙනවා. ඒක ගැටළුවක් නෑ.හැබැයි අපි බලන්න ඕන ජනතාව එක්ක, අපි සුද්ද කරල දුන්නනේ, මං දැක්ක ෆේස්බුක් ෆොටෝස් එහෙම ශෙයා කරලා තියෙනවා. සුද්ද කරලා තියෙනවා.හැබැයි බලන්න ඕනෙ ඊට පහුවෙනිද ඊළඟ සතියේ හරි ගමේ මිනිස්සු එකතු වෙලා එතන සාකච්ඡාවක් කරනවද? ඒක පොදු වැඩ කටයුත්තකට යොදා ගන්නවද ? කියලා. මොකද අපි කොච්චර දේවල් කළත් වැඩක් , ජනතාවට ඒක ඇත්ත වශයෙන්ම අවශ්‍ය වෙන නැත්නම් ඒක. අවශ්‍ය නම් මිනිස්සු පාවිච්චි කරන්න ඕනි. මම දකින දේ තමයි නිලධාරීන්ට චෝදනා කරනවට වඩා. මොකද එහෙම වුණොත් වෙන්නේ අපි අපේ ගමේ ප්‍රජා ශාලාව හදන්න කියලා චෝදනාවට වඩා, එහෙම වුණොත් වෙන්නේ, අපි අපේ ප්‍රජා ශාලාව හදන්න කියලා යෝජනාව ආපු ගමන් නිලධාරීන් පස්ස ගහනවා. මොනද ගමේ මිනිස්සු පාවිච්චි කළේ නැතොත් ප්‍රශ්නයක් වෙනවා.ඒක හින්දා අපි මේ සංවාදය වෙන තැනකට ගොඩනගා ගන්න වෙනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, අපේත් ගොඩනැගිල්ලක් තියෙනවා. ඒක ලක්ෂ සීයක ගොඩනැගිල්ලක්. ඒක දේශපාලන අරමුණකින්ම , ගමේ අරමුණක් නැතිව ඉදිකරපු ගොඩනැගිල්ලක්. ඒක ඇත්තම ජනතා අයිතියට පත්කරල තිබුණ නම් බාගෙට හදපු ඉදිකිරීම්, ජනතාව ප්‍රයෝජනයට ගන්නවා. භාගයක් හදලා, අපේ ගොඩනැගිල්ලේ වැසිකිලි පද්ධතිය හදලා තියෙනවා,ඇතුලේ කොමඩ් හයි කරලා. හැබැයි එළියට බට දාලා වහලා තියෙනවා. වැසිකිලි වලවල් කපල නෑ. හැබැයි ව්‍යාපෘතියෙ මුදල් ඔක්කොම අරගෙන තියෙනවා. ඒක ඊට පස්සේ අපි මන්ත්‍රී ධූරයට ආවට පස්සේ ලොකු ශ්‍රමදානයක් දාලා, සභාපතිතුමන්වත් මම එතනට ගෙන්න ගත්තා ඒකෙ ඉඩකඩක්වත් නෑ, hospital එකක් හදන්න කියලා, ගොඩනැගිල්ල හදලා තියෙනවා. ඉඩමවත් අත්පත් කරගෙන නෙමෙයි. ක්ෂණිකව අඩුම තරමේ ප්‍රදේශයේ සංවර්ධන නිලධාරිවත්,ග්‍රාම නිලධාරිවත්,දන් නැතුව දේශපාලන අධිකාරිට අවශ්‍යතාවයට හදලා තියෙනවා.බැකෝ යන්ත්‍රයක් යොදාගෙන ගෙපළ කපලා ,භූමියවත් නිදහස් කරගෙන නෙමෙයි හදල තියෙන්නේ. ලක්ෂ සීයක් වගේ මම හිතන්නේ අනුමත කරලා තියෙනවා. ඒකේ දැන් විශාල උණ ගස් හැදිල තියෙනවා. හැබැයි තාම ඇතුල මේවා ඉවර කරලා කරල නෑ. ලොක් කරලා තියෙනවා. අවුරුදු තුනහමාරක් තිස්සේ. එතකොට අපි එදා සම්බන්ධීකරණ කමිටුවේදී කිව්වා මේක අවට සුද්ද කරලා තියෙන්නේ මේකෙ මැනුම් ටිකවත් දාලා දෙන්න කියලා. දැන් මාස තුනක් තිස්සේ කිසිම කාරණාවක් සිද්ධ වුණේ නෑ . එතනින් එහාට අපිට මොනවට හරි යොදා ගන්න පුළුවන්ද කියන කාරණාව.ග්ලාස් දාලා තියෙනවා ග්ලාස් වල උණ පැළ පැල වෙලා තියෙනවා. ඇතුලෙ බිත්ති පුපුරලා තියෙනවා. එතන එහා පැත්තෙ තාප්පෙ,සාමාන්‍යෙයන් ඉදිකිරීමකදී අඩි තුනක්වත් අඩුම එහා ඉඩමට මායිම තියෙන්න ඕනේ. ඒ මායිමට කරල හදල තියෙනවා. භාගයක් හදද්දී ඉඩම් ගැටලුවක් ඇවිත් තියෙනවා. අපි කතා කරන්නේ දේශපාලන අධිකාරිය විසින් ඇති කරපු මේ භාගෙට ඉදි කිරීම්, ජනතාවට පවරපු ගොඩනැගිලි ජනතාව විසින් යම්කිසි විදිහට කරගෙන යනවා.මේවා මේ ජනතාවට බලෙන් අත්පත් කරගන්න බෑ.පසුගිය කාලයතුළ භාගෙට හදලා, ඒ මුදලුත් අනුමත කර ගෙන තියෙනවා, හැබැයි ඒවා ජනතාවට පවරලත් නෑ.අපි ඒ සම්බන්ධව තමා කටයුතු කරන්න ඕන කිවුවේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, දැන් මේ මාතෘකාව අපි මාධ්‍යවේදීන් ඉදිරියේ සාකච්ඡා කරන්න සුදුසු නෑ, කියන එක තමයි මගේ පෞද්ගලික අදහස නම්. මොකද ඇහැලියගොඩ වසම් 44 ක බල ප්‍රදේශය තුළ යම් ගොඩනැගිල්ලක් හෝ යම් ඉදිකිරීමක් සිදුවෙන විට ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් හෝ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ නිලධාරීන් තමයි මේ සම්බන්ධව මූලික පරීක්ෂණ කරලා ඒ ස්ථාන පරීක්ෂණය කරලා ඊළඟට මුදල් වෙන් කරන්න සුදුසු ද නැද්ද කියලා නිර්දේශ කළාට පස්සෙ තමයි, ඒ කටයුත්ත මහ පොළවේ ඉන්දෙන්නේ.එතකොට යම් යම් කටයුතු වල අඩුපාඩුකම් නම් තියෙන්න පුළුවන්. අපි උදාහරණයක් ගමුකෝ .අපි ඒ කාලේ අපේ ආණ්ඩුව කාලෙත් හිටපු අපේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ඉන්නවා තාක්ෂණික නිලධාරී නිශාන්ත රාමනායක කියන මහතා .එතකොට එදා අපේ ආණ්ඩුව කාලෙ ඉන්න කොට එතුමා තමයි ඒ නිර්දේශ ලබා දීලා ඒ ව්‍යාපෘතිය පටන් අරගෙන තියෙන්නේ. එතකොට දැන් ඔබතුමාලගේ යහපාලන ආණ්ඩුව කාලේ අපේ ජයසෝම මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට, එතකොට ඔබතුමාලා යෝජනාවක් ගෙනාවොත් ඒක දේශපාලන අරමුණකින් නෙමෙයිද ගේන්නේ? එතකොට ඒ රාමනායක මහත්මයා නෙමෙයිද ඒක නිරීක්ෂණය කරන්නේ ? එතකොට ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට යනවා ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ඉන්නවා තාක්ෂණික නිලධාරීන්. ඒ තාක්ෂණික නිලධාරීන්.අපි ගමුකො සම්බන්ධීකරණයේ ගරු සභාපතිතුමා බුද්ධ ශාසන ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි කරන ඒ කටයුතු වලදී එතුමා නිලධාරීන්ට ඒ අවශ්‍ය කටයුතු සඳහා බලය පවරලා කටයුතු කරනවා .ඒක අගය කරනවා. එතකොට දැන් ඉන්නෙත් ඒ නිලධාරින් ම යි. එතකොට අපි මේ නිලධාරීන් එක්ක අර්බුදයක් ඇති කරගෙන ඒ නිලධාරීන්ට නඩු දාන්න ගිහිල්ලා අපි කොහෙටද මේ යන්නේ? ඒ නිසා මම හිතන්නේ මේක මේ මාධ්‍යවේදීන් තියා ගෙන කතා කළ යුතු මාතෘකාවක් නෙමෙයි. අපි අපේ ප්‍රාදේශීය සභාවේ හෝ අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ නිලධාරිත් එක්ක අපි මේ ගැටුමක් ඇතිකර ගන්නේ. මම විශ්වාස කරනවා. මගේ පුද්ගලික අදහස නම් මම හිතන්නේ ඔබතුමාගේ වම් පාර්ශ්වය විදිහට අපි ඒකට එකඟ වෙන්නේ නෑ. ඔබතුමා මේ ගෙන යන විශාල වැඩපිළිවෙල ,අපි අද තමයි දන්නේ. ඔබතුමා මේ තලාවිට්ටියේ ජල ව්‍යාපෘතිය වෙනුවෙන් කරපු කැප කිරීම අපි දන්නේ අද උදේ.ඒකත් මෙතන මතුවෙච්ච නිසා. ඔබතුමා අපට කියන්නෙත් නෑ , ඔබතුමාගේ කොටස ඔබතුමා උපසභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය කර ගෙන යයි. අපි ඒක අගය කරනවා. හැබැයි ගරු සභාපතිතුමනි ,ඔබතුමාට ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ නිලධාරියෙකුට ඔඩරයක් දෙන්න බැරිවෙයි මේ

යන විදිහට. ඇයි මේ අපි නඩු දාන්නනේ හදන්නේ. නිලධාරීන්ට.මේක මහා විශාල අර්බුදයක් නේ. මට හිතෙන්නේ අපි මේ මාධ්‍යවේදීන් ඉන්න තැන කතා කරන්න සුදුසු මාතෘකාවක් නෙමෙයි . මාධ්‍යවේදීන් මේක පත්තරේ දැම්මොත් මෙතන ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව නිලධාරීන්ට මෙහෙම නඩුවක් දාන්න යනවා කියලා මේ නිලධාරීන් රාජකාරියක් කරන එකක් නෑ. මේක විශාල අර්බුදයක් ගොඩනැගෙන මාතෘකාවක්. ඒ නිසා මං විශ්වාස කරනවා , අපි බොහොම අවබෝධයෙන් මේ වගේ යෝජනා ගේන කොට ගරු සභාපතිතුමත් එක්ක කතා කරලා අපේ උපසභාපතිතුමත් ජ්‍යේෂ්ඨ උපසභාපතිවරයෙක් , ප්‍රාදේශීය සභාවේ පරිණත මහජන නියෝජිතයෙක්. මේවා කතා කරලා ගේන්න ඕන.මේ වගේ යෝජනා ගේන්න එපා මේ සභාවට .එතකොට අපි සභාපතිවරයාගේ වම් පාර්ශ්වයේ විදිහට , අපි මේ ඔබතුමාලත් එක්ක අර්බුදයක් කරගන්න කාරණාවක් නෙමෙයි .ඒක ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ වෙන්න පුළුවන් , අපේ ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් වෙන්න පුළුවන්, මේක මහ විශාල අර්බුදයක් ගොඩනැගෙන මාතෘකාවක් වෙයි. මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා , මාධ්‍යවේදීන් මේ ගැන පළ කරන්න එහෙම එපා පුවත්පත්වල. ලොකු අර්බුදයක් වෙන කාරණාවක්. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි මේ නඩු දාන්න නෙමෙයි , යම් අකටයුත්තක් වෙලා තියෙනව නම් ඒ සම්බන්ධව ඔබතුමා මැදිහත් වෙලා , ඔබතුමා කොහොමත් මැදිහත් වෙනවා ,මැදිහත් වෙලා මේ කටයුත්ත අපි අතරම විසඳ ගනිමු.නැත්නම් මේක ලොකු අර්බුදයකට යයි. විශාල ආන්දෝලනයක් වෙයි .මේ වගේ මාතෘකා අපි කතා කරනකොට. ඒ නිසා ඒ නිලධාරීන් ඒ කාලය වෙනකොට අදාළ මන්ත්‍රීවරයාට යෝජනාවක් ගෙනත්ල මේ, ඒ මන්ත්‍රීවරයා සභාවෙන් සම්මත වෙලා ඇමතිවරයාගෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරව ගෙන කරන්නේ. ඒ දේශපාලන අරමුණක් තමයි. දැන් අපි ඔබතුමාගේ දකුණු පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ගේන්නේ දේශපාලන අරමුණකින් නෙමෙයිද? මොකක්ද අරමුණ, ඒ නිසා මං හිතන්නේ ඒ ගැනත් ගරු සභාපතිතුමා වැඩි අවධානයක් යොමු කරයි කියලා මම විශ්වාස කරනවා.බොහොම ස්තුතියි.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක සාවද්‍ය පරාවර්ථනය කියලා එකක්.එම කාරණාවක් ඉදිරිපත් කරන කොට ඒක පුද්ගලික කාරණාවට වෙනස් වන පරිදි එම කාරණාව කියන්න පුලුවන්.මෙතුමා කතා කළේ නිලධාරීන් ඉලක්ක කර ගෙන නෙමේ. මේකෙ මූලික කරුණට වෙනස් වූ කරුණක්.මේ කතා කළේ ව්‍යාපෘතියේ තියෙන අඩු පාඩුකම් නිවරදි කිරිම තමයි මේ කතා කලේ.අපි දකින කටුක යථාර්තයක් තියෙනවා ඒ තමයි,අලේ නිලධාරීන් හොඳ වෙන්න පුළුවන්.විශාල පිරිසක් නිලධාරීන් හොඳ අය ඉන්නේ හැබැයි මේ නිලධාරීන් දේශපාලන අඩුවට අහුවෙනවා , ඒකට හිර වෙනවා. ඒකට හිර වෙලා ,නිලධාරීන් කොච්චර සද්භාවයෙන් වැඩ කළත් දේශපාලඥයන් මේ අය හිර කරනවා. නිලධාරීන් එහෙම වුණා ද දන්නෙ නෑ.නිලධාරින්ට අපි දඬුවම් දෙන්නෙත් නෑ. එහෙම කියන්නෙත් නෑ. මේක නිවැරදි කිරීමේ ක්‍රියාවලිය කළ යුතුයි. නිමේෂ් මන්ත්‍රීතුමා කිව්වේ විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්න.අපිළිවෙලයි. පිළිවෙලක් තිබිය යුතුයි .අපි ඉලක්ක කරන්නෙ නෑ නිලධාරීන්ට දඬුවම් කළ යුතුයි කියලා. නමුත් යම් පරීක්ෂණයක් කරලා යම් වැරැද්දක් තියෙනවා නම් නීතිමය රාමුවක් තුළ යමක් කළ යුතුයි.

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,. අපි මේවා දැන් නිවැරදි කර ගෙන යමු. දැන් ඔබතුමා කිව්ව අර ජල යෝජනා ක්‍රමයෙත්, ඒ වගේම තමයි මම යෝජනාවක් ගෙනාවා පසුගිය දවස්වල , කීනගහවිල තියෙන ක්‍රීඩා පිටියේ තියෙන මාතෘ සායන ගොඩනැගිල්ලේ නව ඉදිකිරීමක් කරන්න. එතකොට ඒ යෝජනාව ප්‍රතික්ෂේප වුණා. මොකද ඒ කීනගහවිල පිට්ටනිය ප්‍රාදේශීය සභාවට අයිති එකක් නෙමේ. ඒ භූමිය. එතකොට මම ඇහුවේ ඒ ඉදිකිරීම් කලේ කොහොමද කියන එක. අපි කොච්චර කතා කලත් පසුගිය කාලේ එහෙම ඉදිකිරීම් කරලා. ස්ථාවර වත්කම් කියන ලේඛණයේ නෑ.ඒ භූමිය අපට අයිතියි කියල. එතකොට කොහොමද ඒ ඉදිකිරීම් කළේ ? මම හිතන්නේ අපේ මන්ත්‍රීතුමා දන්නවා ඒක. නඩු දාන්න මහා ඝෝෂාවක් නැගුවේ මන්ත්‍රීතුමා.මන්ත්‍රීතුමාගේ යෝජනාවේ එහෙම දෙයක් කිව්වේ නෑ. අජ් රණවිර සර්, මන්ත්‍රිතුමා යෝජනා කලා වගේ එහෙම දෙයක් කිවුවෙ නෑ.නිලධාරීන්ට නඩු පවරන්න ඕන නෑ. නමුත් අපි මේවා නිවැරදි කරගන්න ඕන ඉස්සරහට.දැන් මේ ගොඩනැගිලි හදලා මේවට මොනවා හරි ප්‍රශ්නයක් වුණොත් එහෙම අපට මේවට අපිට අධිහාර පැනවෙයි .තව ඒ වගේම තියෙනවා , උතුරු කරදන මාතෘ සායන ගොඩනැගිල්ලක් හදලා.දැන් තුන් වතාවක් ප්‍රතිසංස්කරණය කරලා තියෙනවා. විශාල මුදල් ප්‍රමාණයක් යොදවලා. නමුත් ඒකත් අපට නෙමෙයි තියෙන්නේ. අපට අයිති භූමියක නෙමෙයි ඉදිකිරීම් කරලා තියෙන්නේ.ඒවා මං කියන්නේ අපි මේවා නිවැරදි කර ගෙන යං ඉස්සරහදි. නැත්නම් මේ විදිහට ගියොත් එහෙම අපට මේවා කරගෙන යන්න බැරි වෙනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි. යෝජනාව තියෙන්නේ භාවිතයෙන් ඉවත් කරලා තියෙන සේවා පියස නැවත ආයේ භාවිතයට ගන්න තැනට අපි හදමු කියන එක.2010 දී හදපු ඒ ගොඩනැගිල්ල අවුරුද්දක් විතර යනකොට නිලධාරීන්ට ඉවත් වෙන්න කියනවා. එයට හේතු වෙලා තියෙන්නේ මේ ස්ලැබ් එක දාලා තියෙන තැන පුපුරලා. ඒ වගේ වාතාවරණයක් තුළ තමයි අයින් වෙන්න කියන්නේ. අන්තිමට ගන්නේ මෙතන නිලධාරීන්ට දඬුවම් දුන්නා කියන එක මාධ්‍යයේ ප්‍රකාශ කරන්න එපා මාධ්‍යයට යන්න එපා. ඒ වගේ අවසාන තීරණයකට ඇවිත් තියෙනවා. අර තියෙන තත්වය ප්‍රතික්ෂේප කරලා. ඒ නිසා , හොයන්න ඕනි අපි ඇයි ඒ වගේ ක්‍රියාවක් වෙලා තියෙන්නේ කියලා. මේ වගේ දේවල් වෙන්න හේතුව ඇයි? ඔබ දැන් මාධ්‍යයෙන් දකිනවා නිතරම වැරදි දෙයක් කළොත් අනිවාර්යයෙන්ම දඬුවම් විඳින්න වෙනවා. ඒක කවුද ? මම ද? සභාපතිතුමාද ? කියන එක නෙමෙයි. ඒක නිසා අපි නැවත මෙවැනි දේවල් වෙන්නෙ නැතිව, (ඝෝෂාව) මේක ඇයි මේ වෙලා තියෙන්නේ ඒකට පරීක්ෂණයක් අපි ඉල්ලනවා. ඉල්ලන්නේ මොකද ආයේ කිසිම දේකට මේ දේශපාලන අධිකාරිය තුළවත් , මේ ආණ්ඩු ක්‍රමය තුළවත් , මෙවැනි අකටයුතුකම් වෙලා තියෙන සේවා පියසක්ද මොන ගොඩනැගිල්ලක් ද මොන ක්‍රියාවක් ද වෙන්න බැ.අපි මේ ඇවිල්ල තියන ජාතික ජන බල වේගයත් පත්වෙලා දැවැන්ත ඡන්ද ප්‍රමාණයකින්. අපි පිරිසිදු දේශපාලනයක් කරමු. පිරිසිදු දෙයක් ප්‍රයෝජනවත් දෙයක් ගමට රටට කරමු කියලා , (ඝෝෂාව) ඒ නිසා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ යෝජනාවට අපි යෝජනා කරනව නම්, ඒ දේ ප්‍රතිඵලය මොකක්ද? ඒකට සිදුවෙලා තියෙන අකටයුත්ත මොකක්ද? කියන තැන අපි නිරීක්ෂණය කරමු. අපිට ඇඟිල්ල දික් කරන්න බෑ.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මටත් එහෙම ප්‍රශ්නයක් තියෙනවා. බුලුගහපිටිය විදාතා එක පවරගෙන නෑ. කණ්ඩායම ඔක්කොමලා එකතුවෙලා යෝජනාවක් ගෙනාවා, කැඩිලා බිඳිලා තියෙන ඒවා සංරක්ෂණය කරලා ඒකට සල්ලි වෙන් කරලා දෙන්න කතා කළා.මේවා සොයලා බලන කොට ඒක පවර ගෙන නෑ. පවරගෙන නැතිව ඉදිකිරීමක් කරනවා .ඒ වගේ තැන් ඇත්තටම ප්‍රශ්නයක්. මේ මන්ත්‍රීතුමා පැහැදිලි කලේ නඩු දාන්න කියන එක නෙමෙයි. අපි හිතනවා වෙන පැත්තකට අපේ මේ මන්ත්‍රීතුමා කිව්වා වගේ වෙන පැත්තකට ඒ ප්‍රශ්න අරගෙන යන්න හදන්න එපා. මොකද අපි එහෙම බලාපොරොත්තු තියාගෙන මෙතන වැඩ කරනවා නෙමෙයි. හැබැයි ඒ වැඩේ කරන පිළිවෙල අපට ඕනා. ඒක නැතිව අපට ඒ වැඩේ කරන්න බෑ .අපිළිවෙලට කරපු වැඩ අපි එතන ඉඳන් අපිත් කරන් ගියොත් හරි යන්නේ නෑ නේ. අපි බලාපොරොත්තු වෙන්නේ පිළිවෙලකට ඒ වැඩේ කරන්න. මේ මන්ත්‍රීතුමා ඒක හොයනවා. හොයන්න ඕන ඒක. මම වැඩක් කරනව නම් මම ඒක හොයන්න ඕන , එතන වෙලා තියෙන්නේ මොකක්ද කවුද කරේ? ඇයි මේක කරේ. මේකේ ව්‍යාපෘතියක් තිබුණද ඒ ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද එහෙම නම් ඇයි ඒක ලැබුනේ? ඒක හොයන්න ඕන.තලාවිටියේ වතුර ප්‍රශ්නය අපි කතා නොකලට ඒ ප්‍රශ්නය බරපතල විදිහට ප්‍රශ්නයක් වෙලා තිබුණා. සභාපතිතුමා, උප සභාපතිතුමා රත්නපුරේ ගිහිල්ලා මාස දෙකක් විතර මේ වෙනුවෙන් සම්බන්ධ වෙලා යම් කිසි නිරාකරණය කරන තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඒ වගේ නිරාකරණය කරගන්න ඕන.මේ මන්ත්‍රීතුමා යෝජනා කළේ නෑ නඩු දාන්න ඕන කියල. එහෙම එකක් අපේ නෑ. හැබැයි මේක හොයන්න ඕනා. ඒක දේශපාලන අධිකාරියෙන් හෝ නිලධාරීන් ඒවට යටත් වෙලා ඒක සිද්ධ වෙලා තියෙනවා නම් ඒක වැරදියි. අපි ඒක පිළිගන්න ඕනා. ඒ හින්දා වහාම වාර්තාව අරගෙන ඒ වැඩසටහන , ව්‍යාපෘතිය කරගෙන යන්න නිරවුල් භාවයක් තියෙන්න ඕන. පවරගෙන නැත්නම් අපි පවර ගන්න ඕනා. සභාවට හරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හරි ඒ අවශ්‍ය තැනට ඒක පවරගෙන, අපි ඒ වැඩේ කළ යුතුයි.මේ වගේ ඒවා හැම තැනම තියෙනවා තැන් තැන්වල. ඒ තැන්වලදී අපි කණ්ඩායමක් වශයෙන් එකතුවෙලා ඒ වැඩේ කළ යුතුයි. ඒ නිසා නිලධාරීන්ට නඩු දාන්න එහෙම එකක් මෙතන කතා වුණේ නෑ. ඒ ගැන මට පොඩි දුකක් ආවා. එහෙම එකක් නෙමෙයි උනේ. අපි මේ වැඩේ හරියට කරන්න උත්සාහ කරන එක තමයි පැහැදිලි කළේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි. මම විශේෂයෙන්ම ඉල්ලනවා ,දේශපාලනඥයෝ වැරදි වැඩක් කරලා තියෙනව නම් දඩුවම් දිය යුතුමයි. දේශපාලඥයෝ ඒ කාලේ වැරදි තීන්දුවක් අරන් තියෙනව නම් දඩුවම් දිය යුතුමයි. මේ යෝජනාව ගෙනාවෙ මොහාන් එල්ලාවල ඇමතිතුමාගේ කාලයේ යෝජනාව ඉදිරිපත් කළේ කවුද අල්ලගෙන හිරේ දාන්නම ඕනි. එකඟද? එකඟද? ඔබතුමාලගේ අවල ජාගොඩ ජේ.වී.පී මන්ත්‍රීවරයා. මහින්ද රාජපක්ෂ මහත්තයත් එක්ක හවුලේ ආණ්ඩු හදපු කාලේ හිටපු අවල ජාගොඩ මන්ත්‍රීතුමා අල්ලලා හිරේ දාන්න. එතුමා තමයි මේ වැරැද්ද කරලා තියෙන්නේ? වැරදියි කිව්වනේ. මහින්ද රාජපක්ෂ මහත්තයත් එක්ක හවුලේ ආණ්ඩු හදපු කාලේ 2015. අවල ජාගොඩ මන්ත්‍රීතුමා තමයි මේක යෝජනා කලේ. එතකොට මහින්ද රාජපක්ෂ මැතිතුමත් එක්ක හවුලේ ආණ්ඩුව හදපු කාලේ 2005.

**සභාපතිතුමා:-**

ඔබතුමා දන්නවද අවල ජාගොඩ මැතිතුමා ඉන්නේ කොහෙද කියල.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

මම දන්නේ නෑ.

**සභාපතිතුමා:-**

දැන් ඉන්නේ රනිල් වික්‍රමසිංහගේ සංවිධායකතුමා විදිහට බලන්ගොඩ ආසනයේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ඉතින් හොඳයි. මොකද රනිල් වික්‍රමසිංහ මහත්තයට ඔබතුමාලා සහයෝගය දැක්වූවානේ යහපාලන ආණ්ඩුවේ. අනිවාර්යයෙන්ම 2015 යහපාලන ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ කාලයේත් ඔබතුමාලා උදව් කළා. (ඝෝෂාව) අවල ජාගොඩ මන්ත්‍රීතුමා තමයි මේක යෝජනා කලේ ඒ ගෙනා යෝජනාව වැරදි නම් අපි ක්‍රියා මාර්ගයක් ගමු.

**සභාපතිතුමා:-**

මම මන්ත්‍රීවරුන්ට කියනවා. එක ප්‍රශ්නයකට මන්ත්‍රීවරු දෙපාරක් නැගිටින්න එපා. එහෙම වුණොත් අපට මේක කරන්න වෙන්නෑ. රීති මාලාව ඔබ දන්නවා ඇති.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය :-**

ගයාෂාන් මන්ත්‍රීතුමාට මම විනාඩියක් ගන්නවා. මොකද මන්ත්‍රීතුමා සම්පූර්ණයෙන්ම වැරදි කතාවක් (ඝෝෂාව)

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

එහෙම කොහොමද සභාපතිතුමාට කතා කරන්න.(ඝෝෂාව) රීති පොත කියවන්න. මේකෙ තියෙනවා කිසිම වෙලාවක මන්ත්‍රීවරයෙක් අමතා කතා කරන්න බෑ. වාඩිවෙලා අලුතෙන් කතා කරන්න. සභාපතිතුමා මේකෙ රීති ප්‍රශ්නයක් පැන නැගුණා. එක නිවැරදි කරලා අවස්ථාව දෙන්න.

**සභාපතිතුමා:-**

අනිවාර්යයෙන්ම

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය :-**

ගරු සභාපතිතුමනි, ගයාෂාන් මන්ත්‍රීතුමා මෙහෙම කතාවක් කිව්වා. මේ සම්බන්ධයේදී රාජ්‍ය නිලධාරීන්, මෙතන අපි ඒගොල්ලන්ට චෝදනා කළොත් එහෙම මින් ඉදිරියට ඒගොල්ලන්ගෙන් අපට රාජකාරියක් කර

ගන්න බැරි වෙයි කියලා. ඒක සම්පූර්ණයෙන්ම ඉල්ලා අස්කර ගන්න. මොකද රාජ්‍ය නිළධාරීන් රාජකාරි කරන්න ඕනේ. ගයාෂාන් මැතිතුමාගේ මම ඉල්ලා සිටිනවා ඒ කියපු එක ඉල්ලා අස් කරගන්න කියලා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මම නෙමෙයි එහෙම ප්‍රකාශයක් කළේ. වෙනත් මන්ත්‍රීවරයෙක්. මම ඉදිරිපත් කළේ රාජ්‍ය නිලධාරීන්ට චෝදනා කරන කොට , නිලධාරීන් ඒ කාර්ය කරන්නේ මොකක් හරි ඉල්ලීමක් මත. කිසියම් ප්‍රදේශයක මහජනතාව කරපු ඉල්ලීමක් මත. පළවෙනි අදහස් දැක්වීමේදී ඉදිරිපත් කළේ මම ඒක. දෙවැනි අදහස් දැක්වීමේදී මම ප්‍රකාශ කළේ දේශපාලන අධිකාරියේ කවුද කියන එක නම් කිරීම විතරයි.මගේ ප්‍රකාශයේ ගැටලුවක් නෑ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මම මේක වෙනත් පැත්තකට යොමු කරනවා.තැන් තැන්වල සේවා පියස හැදුවේ ලොකු සංකල්පයක් ඇතුව. මොකද එකම තැනක සිට සියලු අයට පහසුකම් සපයන්න පුළුවන් වෙන්න සේවා පියස නිර්මාණය කළේ. එතකොට සේවා පියස නඩත්තු කිරීම සම්බන්ධව ලොකු ගැටලුවක් වෙලා තියෙනවා. නිලධාරීන් අපි දන්නවා.සේවා පියස තුළ ජල ප්‍රශ්න , වැසිකිළි ප්‍රශ්න ඒවා නිර්මාණය වෙලා තියෙනවා. මොකද අවුරුදු ගානක් වෙනවා, සේවා පියස නිර්මාණය කරලා. දැන් ඒවා තුළ අතුරු ප්‍රශ්න රාශියක් නිර්මාණය වෙලා තියෙනවා. ඒකත් එක්ක තමයි මේ ගැටලු නිර්මාණය වෙලා තියෙන්නේ. ඒ සේවා පියස සම්බන්ධයෙන්.අපේ මේ රුවන්සිරි මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා , ආයතනය තුළට බැහැරව තැන් වල ඉදිකිරීම් කරලා තියෙනවා කියලා. පවරා ගැනීම් වලින් බැහැරව ඉදිකිරීම් කරලා තියෙනවා කියලා. මට හිතෙනවා ඒ පැවති රජයන් තුළ , අදාළ අමාත්‍යාංශයන් තුළ ,අවබෝධයෙන් තොරව කරපු ක්‍රියාවලියක්. සභාපතිතුමනි, යම් යම් ඉදිකිරීම් කරලා තියෙනවා වෙනත් ආයතනයකට නතුවිය යුතු ස්ථානවල. ඒක අපි පිළිගන්නවා. හැබැයි ඒ ඉදිකිරීම් කළේ යම් යම් ආයතන වල අවබෝධයන් තුළ. උදාහරණයක් ලෙස පොළ භූමිය අපේ නිර්මාණය කරලා තියෙනවා. එතකොට සම්පූර්ණ පොළ භූමියෙන් අපේක්ෂා කළේ ආර්ථික මධ්‍යස්ථානයක් හැටියට, ඒ කටයුත්ත කරන්න බැරි වුණා. හැබැයි දැන් ඒකේ ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. පනාවල සංස්කෘතික මධ්‍යස්ථානය අපට අයිති භූමියක තමයි හදලා තියෙන්නේ.ඒක හරි ද දන් නෑ.මං වැරදි නම් නිවරදි කරන්න.සංස්කෘතික මධ්‍යස්ථාන කොටස අදියර දෙකකින් කරලා තිබුණා. දැන් මේ රජය පත්වෙලා සංස්කෘතික මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කළා. විෂය පථය එතකොට තිබ්බේ වෙන අමාත්‍යාංශයක් වෙන්න පුළුවන් .හැබැයි සංස්කෘතික මධ්‍යස්ථානයක් බවට පත්වෙලා තියෙන්නේ. මූලික අදියරේ කටයුතු ආරම්භ කරලා තිබ්බ නිසා තමයි දැන් සංස්කෘතික මධ්‍යස්ථානයක් කෙටි කාලයක් තුළ ඉදිකිරීමට හැකියාවක් ලැබුණේ. ඒ නිසා අමාත්‍යාංශ විෂය පථය දැන් වෙනස් වෙලා ඇති ඉස්සෙල්ලා තිබ්බ අමාත්‍යාංශ වල ඒ අමාත්‍යාංශ එක්ක සාකච්චා කරලා,විදාතා මධයස්ථානය, ආරියදාස මන්ත්‍රීතුමා කිව්ව විදාතා මධ්‍යස්ථානය ඒ කාලයේ ක්‍රියාත්මක වුණා. එතන තිබුණු පහසුකම් පිළිබඳ ගැටලුකාරී තත්ත්වයන් නිසා වෙනත් ස්ථානයකට අරන් ගියා. එතකොට ඒ අදාල අමාත්‍යාංශය හරහා ආයතන අවබෝධය තුළින් තමයි ස්ථානගත කළේ. ඒක පවත්වාගෙන යන ක්‍රමවේදය දැන් මේ පවතින දේටත් නීතිමය රාමුවට ගැළපෙන විදිහට ස්ථාපිත කරන්න පුළුවන්. මං ඒකයි වෙනත් පැත්තකට යොමු කරනවා කිවුවේ. මේවා ගැටලු ඇතිකර ගන්න ඕනෑ මාතෘකා නෙමෙයි. ඒවා අදාළ විෂය පථයන් වලට අදාළව ,අදාළ අමාත්‍යාංශය සාකච්ඡා කරලා ඒක පවරලා ගැනීම හෝ නැත්නම් තවදුරටත් පවත්වාගෙන යන්න. දැන් අපේ උපසභාපතිතුමා කිව්වේ වියලගොඩ ප්‍රජා ශාලාව හදන්න කණු ටිකක් ගහලා තියෙනවා කියලා. ඒක නිවාස සංවර්ධන අධිකාරියට අයත් භූමියක්. එතන ඉදිකිරීම් කරලා තිබෙනවා. දැන් එතුමාට පුළුවන් නිවාස සංවර්ධන අධිකාරියත් එක්ක සාකච්ඡා කරලා ඒ භූමිය පවරගෙන හරි නැවත ඒක වැඩි දියුණු කරල ඉස්සරහට ගෙනියන්න. ඒ වගේ ක්‍රියාමාර්ගයන් වලට ගියොත් මේ නිලධාරීන්ටවත් ,කාටවත් ප්‍රශ්න මතු වෙන එකක් නෑ .

**සභාපතිතුමා:-**

බොහොමත්ම ස්තුතියි.මේ මාතෘකාව දැන් හොඳට ම ඇති.මේකට වාද වෙන්න එපා. පාට කණ්ණාඩියකින් බලන්න එපා. ඕකට අවිධිමත් ලෙස යම්කිසි සිදුවීම් සිදුවුණා කියන එක මම හිතන්නේ. අක්කර 45 ක් වෙන් කර ගෙන තියෙනවනේ , අපිට නොදෙන භූමියක් තියෙනවනේ පිට්ටනිය තියෙන එක. අපට තියෙන ප්‍රශ්නේ කීදෙනෙක් නම් එනවද දන්නෑ. ඒක පවරගත්ත අක්කර 45 හැබැයි. කිසි කෙනෙකුට වන්දියක් දීලා නෑ. අපි හැමෝම දන්නවා.අපි හැමෝම නිහතමානිව.දැන් ඒක වැරදියි. ඒ පිට්ටනිය ගොඩ කරලා තියෙනවා. දැන් එතන අක්කර හැටයි. හැටට වැඩිය ඉල්ලුම්කාරයෝ ඉන්නවා හැත්තෑවක් වත් විතර.නමුත් බෙදලා වෙන් කරන්න බෑ .පිට්ටනිය ගොඩ කරලා ඉවරයි. ලොකු ප්‍රශ්න තියෙනවා. ඒ කාලේ හරියට කරපු නැති නිසා නේ දැන් පත් කරලා තියෙන ආණ්ඩුව තියෙන්නේ. ඒ නිසා මගෙ දකුණු පැත්තෙ ඉන්න අය,ඔයගොල්ලෝ හරියට හරියට වැඩේ කරන්න. ඔයගොල්ලන්ට බලය දීලා තියෙන්නේ අනිත් අය හරියට කළේ නැති හින්දා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

මම අපේ ගරු සභාපතිතුමාට අනේක වාරයක් ස්තුති කරනවා.අන්න හැමදාමත් මම .මම මේ ඔබතුමා උස්සන්න කියනව නෙමෙයි. ඔබතුමා මේ දේ හරියට දකිනවා. ඒක තමයි අපේ දකුණු පාර්ශවය දැන ගන්න ඕනේ කාරණාව.දැන් ඔබතුමා කියනවා වගේ එහෙම දේවල් කරල තියෙන නිසා තමයි ආණ්ඩුවත් පෙරලුනේ. ඒ ආණ්ඩුව පෙරළන පාර්ශවයේ තමයි තමුන්නාන්සේලා ඉන්නේ. අපේ තිබුණු අඩුපාඩුකම් නිසා.(ඝෝෂාව)

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමා , අපි වෙනත් කාරණා වලදී ගමු.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

වෙනත් කාරණා නෙමෙයි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඔබතුමා කලින් අවස්ථාවෙත් නැගිට්ටා .මේක කෝලම් මඩුවක් නෙමෙයි. ඔබතුමාට තව අවස්ථාවක් එනවනේ .

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
උපසභාපතිමා, සභාපතිතුමා කියපු දේ හරි කියල කියන්න ඕනි. නැත්තං අපි ඔක්කොට ම විරුද්ධයි කියලා හිතෙනවානේ. සභාපතිතුමා කිව්වේ අපි අතින් අඩුපාඩුවක් වෙලා තියෙනවා නම් , ඒ නිසා තමයි ආණ්ඩුවක් පත් කලේ. ඒ ගැන අවබෝධයෙන් ඉන්න කියලා ගරු සභාපතිතුමා කිව්වේ. ඒ ගැන හරි කිව්වේ. හරි දේට හරි කියනවා වැරදි දේට වැරදියි කියන්න ඕනේ. එතුමා අගේ කරන්න ඕනේ. ඒකට කෝච්චෝ වෙන්න එපා කවුරුවත්. එතුමා හරි දේ කිව්වේ? ඔබතුමා කෝච්චෝ වෙන්න එපා. හරි දේ කිව්වේ.

ඒ අනුව සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමාගේ **6.13.**භාවිතයෙන් ඉවත් කර ඇති මාරඹේ සේවා පියස නැවත ප්‍රතිසංස්කරණය කර නැවත භාවිතයට ගැනීම සම්බන්ධව සොයා බැලීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා -**
6.14.සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
**6.14.දෙයියාගල සයිවර් කඩේ අසල සිට ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කිරීම.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දෙයියාගල කියන්නේ කඳුකර ප්‍රදේශයක ජීවත්වන ජනතාවක්. ඉතින් ඒ ජනතාවට බොහොම මාර්ග දුෂ්කරතාවය තියෙනවා. ඒ වගේම ඔවුන් මේ දවස්වල පඩි පෙල් මාර්ගයකින් තමා පාසල් ළමුන් සහ ගෙදරට අත්‍යවශ්‍ය භාණ්ඩ අරගෙන යන්නේ. ඇත්තටම මාර්ගය ගොඩක් අබලන් වෙලා තියෙනවා. එම මාර්ගයට අවධානය යොමුකර මාර්ගයේ ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ 6.14.දෙයියාගල සයිවර් කඩේ අසල සිට ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.15.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා:-**
**6.15.ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර අංක 02 හිමි බදුකරු වන කේ.ඩී.විමලා ගුණරත්න මහත්මිය මිය යෑම හේතුවෙන් ඔහුගේ පුතෙකු වන එච්.ඩබ්.ටී.පී.ගුණරත්න යන අයගේ ඉල්ලීම මත ඔහු වෙත පා.පා.කො.01/2023 චක්‍රලේඛය පරිදි පැවරීම සඳහා මම යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, චක්‍රලේඛයේ තියෙනවද මවගෙන් පස්සේ පළමු පුතාට ද දෙවන පුතාට ද කියලා. තව හිමිකරුවෝ ඉන්නව ද , ගැටළුවක් නැද්ද, කොහොමද මේක පවරන්නේ කියලා පොඩි ප්‍රශ්නයක් ආවොත්. පොඩි අදහසක් ආවොත් ඒ තීරණය සභාව අභියෝගයට ලක් කරන්න පුළුවන්. මේක නිවැරදිව සිද්ධ වෙනවා නම් ඒක ගැටලුවක් නෑ .

**සභාපතිතුමා:-**
අපි මහා සභාව කාරක සභාවක් බවට පත් කරමු.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට යෝජනා කරමි

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒම යොජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම මෙතැන්සිට කාරක සභාව මහා සභාවක් බවට යෝජනා කරමි.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යොජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව ගරු සභාපතිතුමාගේ 6.15.ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර අංක 02 හිමි බදුකරු වන කේ.ඩී.විමලා ගුණරත්න මහත්මිය මිය යෑම හේතුවෙන් ඔහුගේ පුතෙකු වන එච්.ඩබ්.ටී.පී.ගුණරත්න යන අයගේ ඉල්ලීම මත ඔහු වෙත පා.පා.කො.01/2023 චක්‍රලේඛය පරිදි පැවරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.16.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා:-**

**6.16.ඇහැලියගොඩ වෙළඳ සංකීර්ණයේ බිම් මහල අංක 16 හිමි බදුකරු වන වයි.ඩබ්.වීරවර්ධන මහතා මිය යෑම හේතුවෙන් ඔහුගේ පුතෙකු වන වයි.චෛතිය චාමින්ද වීරවර්ධන යන අයගේ ඉල්ලීම මත ඔහු වෙත පා.පා.කො.01/2023 චක්‍රලේඛය පරිදි පැවරීම සඳහා මම යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව ගරු සභාපතිතුමාගේ 6.16.ඇහැලියගොඩ වෙළඳ සංකීර්ණයේ බිම් මහල අංක 16 හිමි බදුකරු වන වයි.ඩබ්.වීරවර්ධන මහතා මිය යෑම හේතුවෙන් ඔහුගේ පුතෙකු වන වයි.චෛතිය චාමින්ද වීරවර්ධන යන අයගේ ඉල්ලීම මත ඔහු වෙත පා.පා.කො.01/2023 චක්‍රලේඛය පරිදි පැවරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.17.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා:-**
**6.17.ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා පොදු වෙළඳ සංකීර්ණය පිහිටි ගොඩනැගිල්ලෙහි ,ඇහැලියගොඩ ජාතික පාසලට පිටුපා ඇති හිස් බිම් තීරුව කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොමැත.වෙළඳ සංකීර්ණය බිම් මහලෙහි මෙම බිම් තීරුවට මායිම්ව ඇති කඩ කාමර, සභාව සතු මෙම බිම් තීරුව ප්‍රයෝජනයට ගෙන පිටුපසට පුළුල් කළ හැකි නම් ඊට සමගාමීව පළමු මහල මෙන්ම ප්‍රාදේශීය සභාව පිහිටි තෙවන මහල ද පුළුල් වී මහල ද පුළුල් කළ හැක.එමඟින් අපගේ වෙළඳ ආයතන පුළුල් වී ව්‍යාපාර කටයුතු දියුණු කිරීම මෙන්ම ඔබ ආයතනයට ද පුළුල් ඉඩක් මෙන්ම අමතර ආදායමක් ද ලබා ගත හැක. (ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා නව වෙළඳ සංගමයේ යෝජනාවකි.)**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කලින් සභාවේදී මේ වගේම යෝජනා දෙකක් ආවා. පළමුවෙනි වර යෝජනාව අපේ පැත්තේ මන්ත්‍රීවරුන් තමයි ගෙනාවේ. හැබැයි යෝජනාව පරාද කරන්න සිද්ධ වුණා. මොකද ඒ යෝජනාවේ තිබුනේ ජාතික පාසලට සාපේක්ෂව කඩ කාමර ඉදිකිරීම. ඒකෙ කඩ කාමර ඉදි කරහම පාරිභෝගිකයෝ වෙන්නේ පාසල් ශිෂ්‍යයෝ. ඒක හින්දා අපි ඒක පාසලත් එක්ක කතා කරලා, ඒ යෝජනාව පරාද කරන්න සිද්ධ වුණා. උපසභාපතිතුමාට මතක ඇති. ඒ තුළින් ජාතික පාසලට අනවශ්‍ය හානියක් වෙනවා කියල අපි දැකපු නිසා. ඊට පස්සේ අවුරුදු එකහමාරකට පස්සේ තවත් යෝජනාවක් ගෙනාවා මේ වගේම මේ ගොඩනැගිල්ල පුළුල් කරන්න. ඒ වෙලාවෙදිත් අපිට බොහොම අමාරුවෙන් , ඒ වෙලේ පරාජය කරන්න බැරි වුණා. ධනරත්න මන්ත්‍රීතුමාලා අපි ඔක්කොම පාසල වෙනුවෙන් ඒ වෙලාවෙ පෙනී ඉන්න සිද්ධ වුණා. මොකද අපි මෙතන භූමිකා කීපයක් රඟපානවා. එක වෙලාවකට පාසල වෙනුවෙන් පෙනී සිටින්න වෙනවා. මන්ත්‍රීවරයෙක් විදිහට පෙනී සිටින්නත් වෙනවා. ඒක හින්දා අවුරුදු එකහමාරකට කල් දා ගත්තා ඒ වෙලාවේ. ආයෙත් මේ යෝජනාව ඇවිල්ලා තියෙනවා. මේක මම හිතන්නේ මගේ පෞද්ගලික කැමැත්ත නම් මේ වෙලාවේ මේ යෝජනාවට මට එකපාර එකඟ වෙන්න බෑ. දීර්ඝ සාකච්ඡාවකින් පස්සේ අපේ පාසලත් එක්ක කතා කරලා , මේ නව වෙළෙඳ සංගමය යෝජනාවක් එයාලගේ අදහස් මොනවද දන්නේ? කොයි පැත්තටද දන්නෑ මේකේ දොරවල් දාන්නේ? ඊට පස්සේ තාක්ෂණික නිලධාරීන් එක්ක කතා කරන්න ඕන. මේ ගොඩනැගිල්ල තවදුරටත් පුළුල් කරන්න පුළුවන්ද? ගොඩනැගිල්ල පුළුල් කරන්න අවකාශයක් ලබා දීලා තිබෙනවාද? පුළුල් කිරීම තුළින් කාලයක් යද්දී , ඒ පුළුල් කරපු කොටස කඩාගෙන වැටෙන්නත් ඉඩ තියෙනවා. හරියට ඒක තක්සේරු කර ගත්තේ නැත්නම්, ඒක හින්දා මේ යෝජනාව එක සැරේම ස්ථිර කරන්නැතුව දීර්ඝ සාකච්ඡාවකින් පස්සේ මේ යෝජනාව සම්මත කර ගැනීම සුදුසුයි කියලා තමයි මගේ නම් අදහස.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ දිලීන් මන්ත්‍රීතුමා කිව්වා වගේ උපසභාපතිතුමාට මතක ඇති මේ යෝජනාව. මීට කලින් , එතකොට ඊට අමතරව මේවා කතා කරන්න ගියාම මේ හැම දේකටම සභාපතිතුමා යම් යම් කාරණා මතුවෙනවා. කවුරුත් සිත් අවුල් කරගන්න එපා. අපි දන්නවා ඇහැලියගොඩ ජාතික පාසලේ සමස්තය ඔබතුමාගේ ජාතික ජන බලවේග ආණ්ඩුව පත් කර ගන්න ලොකු කැප කිරීමක් කළා.ගරු සභාපතිතුමා මේකට හෘද සාක්ෂි දරනවා. මේවා කතා කරන්න ඕනි. සභාපතිතුමා, කවුරු හරි කියනවනම් කතා කරන්න එපා කියලා ඒක කතා කරන්නේ කොහෙද? මේවා සභාවේ ඇරෙන්න. එතකොට අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් ලොකු කැප කිරීමක් කරා. පාසලේ සමස්ත පද්ධතියම වැඩ කළා. අපි ඒකට කිසි ප්‍රශ්නයක් දැම්මේ නෑ.අපිත් ඒකට එකඟයි.ඒ වෙලාවේ තිබ්බ බලවේගයත් එක්ක.ඒක හරි. හැබැයි ඔබතුමා එක්ක පෞද්ගලිකව කතා කරන්න ඇති. අපි මේ අනවශ්‍ය ප්‍රශ්නයක් කතා කරන්නේ. හොඳට මතක තියා ගන්න. හොඳට තේරුම් ගන්න. මම මේ කියන කාරණාව.මේවා ද්වේෂ සහගතව කතා කරන කාරණා නෙමෙයි. අත්දැකීමෙන් මේ කතා කරන්නේ. හොඳට තේරුම් ගන්න .ගෙදර ගිහිල්ලා කොට්ටේ උඩ ඉද්දි , ඇඳේ කල්පනා කරන්න, මෙන්න මෙහෙම දෙයක් මේ යකා කිව්වා කියල. ඒ නිසා ගරු සභාපතිතුමා, දැන් ඔබතුමාට මහේෂ් උපසභාපතිතුමාට, අපේ මන්ත්‍රීවරුන් වැඩි පිරිසක් අපේ ජාතික පාසලේ ශිෂ්‍යයෝ. එතකොට මේ ඉස්කෝලෙ යෝජනාවක් ආවා. ඒ ආවට පස්සේ ගරු සභාපතිතුමාට, උපසභාපතිතුමාට පුද්ගලිකව කතා කරලා ඔබතුමාලා එක්ක වැඩ කරපු අපේ සහෝදරයෝ අපේ පාසලේ ආදි ශිෂ්‍ය සහෝදරයෝ මට වඩා බාල සහෝදරයෝ ඒ යෝජනාව ගෙනාවා. එතකොට දැන් ඒ සාකච්ඡාව යම් මට්ටමක යන අතරතුරේ තමයි ගරු සභාපතිතුමනි, මේ යෝජනාව නැවත ඔබතුමාට දැම්මේ. අපට කිසිම ප්‍රශ්නයක් නෑ. අපේ සභාවේ (ඝෝෂාව ) ගැටලුවක් නැහැ. හැබැයි මෙතනදි ගැටළුවක් මතුවෙනවා. ඇහැලියගොඩ ජාතික පාසල හා අපි අතර. අපේ දිලීන් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි ඇයි පාසලට විරුද්ධව යෝජනා ගේන්නේ

කියලා, ඒ කට්ටිය ඒ පැත්තෙන් හිතන්න පුළුවන්. අපේ ආරියදාස මැතිතුමාට මේ ගැන අවබෝධයක් තිබෙනවා. ඉස්කෝලෙක විදුහල්පතිවරයෙක් හැටියට .අපේ වගකීමක් තමයි, අපි සියලු දෙනාම අපේ ආදායම් මාර්ග වැඩි කර ගන්න අපි යෝජනා ගේන්න ඕන. ඒක සාධාරණයි. හැබැයි මෙතන ගැටුමක් ඇති කර ගන්නේ නැතුව යම් සාකච්ඡා මාර්ගයෙන් එකඟතාවයට ඇවිල්ලා යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරමු. අපේ දිලීන් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි 2018 සභාවේ මහේෂ් උපසභාපතිතුමාට මතක ඇති, අපි මාස හයක් කල් අරගෙන අවුරුදු එකහමාරකට කල් අරගෙන ඒ වැඩි පිළිවෙල අපි ක්‍රියාත්මක කළා. මේ වගේ අර්බුදයක් ඇතිකර ගන්නේ නැතිව. විශේෂයෙන්ම මේ ප්‍රශ්න වැඩියෙන්ම බලපාන්නේ ජාතික ජන බලවේගය ආණ්ඩුවට. ඒ සියලු දෙනාම අපි නම් වශයෙන් කියන්න අවශ්‍ය නෑ. අපේ ආරියදාස මන්ත්‍රීතුමාට උදව් කරපු ප්‍රධානම චරිත මේකෙ හිටියා. ඇයි අපි මේ වගේ තීන්දු ගන්නේ. හොඳට හිතලා බලලා ගන්න මේ තීන්දුව. මම මේ ඇහැළියගොඩ ජාතික පාසලේ ශිෂ්‍යයෙක් විදිහට කියන්නේ. නැත්නම් මට කිසිම සම්බන්ධයක් නෑ මේ වැඩවලට. ඒක නිසා මේ තීන්දුව තව පොඩ්ඩක් කල් තියලා , අපේ නිශාන්ත මහත්තයත් ඇවිත් ලා ඉන්නවා. ඔබතුමා නිවැරදි තීන්දුවක් ගනියි කියල මම විශ්වාස කරනවා .ඔබතුමාල කිව්වොත් එහෙම මේකට අපි බෙදීමක් යන්න ඕනේ කියලා ජයග්‍රහණය කරන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. මම හිතන්නේ ඔබතුමාගේ වම් පාර්ශවයේ ඉන්නේ ඒ මතය කියල, මම විශ්වාස කරනවා. මේ ඇහැළියගොඩ ජාතික පාසලේ ශිෂ්‍යයෝ ඉන්නේ ඔක්කොම. ඒ නිසා ඔබතුමා ඉතාමත් නිවැරදිව හොඳට කල්පනා කරලා තීන්දුවක් ගන්න කියලා අදහසක් විදිහට ඉදිරිපත් කරනවා .

**සභාපතිතුමා:-**
මේක ජාතික පාසලත් එක්ක තියෙන කතන්දරයක් නෙමෙයි. මේක අපේ සභාවට තියෙන කතන්දරයක්. මේක අපට පැහැදිලි කරලා දෙයි මහා සභාව කාරක සභාවක් බවට පත් කරන්න .

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට යෝජනා කරමි.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒම යොජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම මෙතැන්සිට කාරක සභාව මහා සභාවක් බවට යෝජනා කරමි.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යොජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි කාරක සභාවේදී යෝජනා කරගත් විදියට අපේ ජාතික පාසලට හානියක් වෙන්නෙ නෑ කියලා තමයි කාරක සභාවේ කතා වුණේ. ඒ වගේම තාම කීමනි ලබා ගැනීම පිළිබඳ අදහසක් නෑ. ඒ අදහසත් එක්ක ඊළඟ සභා වාරයේදී ඔබතුමාගෙන්, මේ පිළිබඳ තවත් විස්තරාත්මක පුළුල් විස්තරයක් අපි බලාපොරොත්තු වෙනවා මේ ඉදිකිරීම් සම්බන්ධව. තව දෙවැනි තට්ටුවේ අය ,පළවෙනි තට්ටුවේ අය ඒ කීමනි දෙන්න සූදානම්ද කියන එක අපි දන්නේ නෑ. විශ්වාසයක් නෑ. ඒ පිළිබඳ වැඩි පැහැදිලි කිරීමක් ඉදිරි සභා වාරයකදී බලාපොරොත්තු වෙනවා

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපි තීරණය ගත්තොත් සභාපතිතුමනි , අපි කීමනි ගන්න විදිහ , කාර්යාලය පුළුල් කරන විදිහ,කාර්මික නිලධාරී මහත්තයට කියලා ප්ලෑන් එකක් එක්ක ඊළඟ සභා වාරයේදී ඉදිරිපත් කරනවා.

ඒ අනුව සභාපතිතුමාගේ 6.17.ඇ/ප්‍රා.සභා පොදු වෙළඳ සංකීර්ණය පිහිටි ගොඩනැගිල්ලෙහි, ඇහැළියගොඩ ජාතික පාසලට පිටුපා ඇති හිස් බිම් තීරුව කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොමැත.වෙළඳ සංකීර්ණය බිම් මහලෙහි මෙම බිම් තීරුවට මායිම්ව ඇති කඩ කාමර,සභාව සතු මෙම බිම් තීරුව ප්‍රයෝජනයට ගෙන පිටුපසට පුළුල් කළ හැකි නම් ඊට සමගාමීව පළමු මහල මෙන්ම ප්‍රාදේශීය සභාව පිහිටි තෙවන මහල ද පුළුල් කළ හැක.එමගින් අපගේ වෙළඳ ආයතන පුළුල් වී ව්‍යාපාර කටයුතු දියුණු කිරීම මෙන්ම ඔබ ආයතනයට ද පුළුල් ඉඩකඩක් මෙන්ම අමතර ආදායමක් ද ලබා ගත හැක.(ඇහැළියගොඩ ප්‍රාදේශීය සභා නව වෙළඳ සංගමයේ යෝජනාවකි.) යන යෝජනාව කීමනී අය කර ගන්නා ආකාරය,කාර්යාලය පුළුල් කරන ආකාරය ද ඇතුළත්ව ඉදිකිරීමට අපේක්ෂිත ගොඩනැගිලි සැලැස්ම සමඟ ඉදිරි සභා වාරයකට යොමු කිරිමට තීරණය වු යෝජනාව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් ඉදිරිපත් කළ අතර සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සභාපතිතුමා:-**
6.18.සභික එම් චන්ද්‍රදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.පී.චන්ද්‍රදාස මැතිතුමා:-**
**6.18.බෝපැත්ත ප්‍රජා ශාලාව අසලින් ඇති මනන්නගේ වත්තට යන මාර්ගයේ දැනට ඇති පැති බැම්මේ ඉතිරි කොටස සම්පූර්ණ කිරීම මම යෝජනාකරමි.(මෙය නිවාස 30කට පමණ යන මාර්ගයකි.)**

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එම්.පී.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ මාර්ගය සංවර්ධනය කරලා තියෙන මාර්ගයක්. පැති බැම්මක් ඉදිකරලා තියෙනවා. ඒ පැති බැම්මේ අඩි දහයක පමණ කොටසක් ඉතුරු වෙලා තියෙනවා. හරියටම ඒ මාර්ගයේ මැද කොටස.ඒ මාර්ගයේ නිවාස 30 පමණ තියෙනවා.ඒ මාර්ගයේ මේ මැද කොටස නැති නිසා මාර්ගය දැන් ඉරිතලල ගිහින්

තියෙනවා. දෙපැත්තෙන්ම පැති බැම්ම තියෙනවා.ඒ නිසා මේ පැති බැම්ම ඉතිරි කොටස සංවර්ධනය කරලා දෙන ලෙසට මම යෝජනා කරනවා.

ඒ අනුව එම්.පී.චන්ද්‍රදාසමැතිතුමාගේ **6.18.**බෝපැත්ත ප්‍රජා ශාලාව අසලින් ඇති මනන්නගේ වත්තට යන මාර්ගයේ දැනට ඇති පැති බැම්මේ ඉතිරි කොටස සම්පූර්ණ කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (මෙය නිවාස 30 කට පමණ යන මාර්ගයකි.)

**සභාපතිතුමා:-**
6.19.සභික එම් චන්ද්‍රදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.පී.චන්ද්‍රදාස මැතිතුමා:-**
**6.19.බෝපැත්ත දිද්ද වසමට අයත් බෝපැත්ත පොදු සුසාන භූමිය වටා දෙපස ඇති මාර්ග දෙකෙහි එක් මාර්ගයකට කණු දෙක බැගින් මාර්ග දෙකෙහි කණු 04 ක් සිටුවා වීථි පහන් 04 ක් සවි කිරීම සුදුසු බව මම යෝජනා කරමි.**

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එම්.පී.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 1984 බෝ පැත්ත එක්සත් ජාතික පක්ෂ ශාඛා සංවිධානයේ ඉල්ලීම පරිදි හිටපු අමාත්‍ය ආචාර්ය විමල් වික්‍රමසිංහ මැතිතුමාගෙන් තමයි අපි මේ සුසාන භූමිය ලබා ගත්තේ.නමුත් අද වෙනතුරු මේ සුසාන භූමිය රාත්‍රී කාලයේදී ඝණ අන්ධකාරයි. මේ සුසාන භූමියේ එක මායිමක් වෙන්නේ උඩුමත්ත බෝපැත්තේ සිට උඩුමත්ත දක්වා ගමන් කරන මාර්ගය. අනිත් මායිම වෙන්නේ අලියාමලහේන ප්‍රදේශයට ගමන් කරන මාර්ගය. එතකොට මේ සුසාන භූමිය පිහිටලා තියෙන්නේ මේ මාර්ග දෙක මායිම් වන පරිදි මැද කොටසේ. මෙම මාර්ගවල රාත්‍රී කාලයටත්, දිවා කාලයටත් සෑහෙන්න පිරිසක් ගමන් කරනවා. ඒ වගේම තවත් වැදගත් අවස්ථාවක් තියෙනවා මේ මාර්ගයේ. බෝපැත්ත ඇඟලුම් කම්හලට යන්නෙත් මේ අලියාමල හේනට යන මාර්ගයේ. එතකොට තව නොබෝ දිනකින් මේ ඇඟලුම් කම්හල විවෘත වෙනවා. ඇඟලුම් කම්හල විවෘත උනාට පස්සේ මේ මාර්ගයේ කාන්තාවන් සහ තරුණ ගෑණු ළමයි රැකියාව සඳහා ගමන් කරනවා .මේ රැකියාවන් සඳහා ගමන් කිරීමේ දී සේවා මුර යටතේ වැඩ කරන කොට රාත්‍රියේ කාලයෙත් මේ අයට ගමන් කරන්න සිද්ධ වෙනවා. එතකොට මේ ප්‍රදේශයම තවම පවතින්නේ ගණ අන්ධකාරයේ රාත්‍රි කාලයේ.මේ ඝණ අන්ධකාරයේ පවතින ගැනක් නිසා,සොරුන්ට දූෂිතයන්ට මංකොල්ලකාරයින්ට හොඳම තෝතැන්නක් වෙනවා, රාත්‍රී කාලය. ඒක නිසා මේ කටයුත්ත ඉතා ඉක්මනින් ඉටුකර දෙන හැටියට මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික එම්.පී.චන්ද්‍රදාස මැතිතුමාගේ**6.19.**බෝපැත්ත දිද්ද වසමට අයත් බෝපැත්ත පොදු සුසාන භූමිය වටා දෙපස ඇති මාර්ග දෙකහි එක් මාර්ගයකට කණු දෙක බැගින් මාර්ග දෙකෙහි කණු 04 ක් සිටුවා වීථි පහන් 04 ක් සවි කිරීම සුදුසු බව වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.20.සභික එම්. චන්ද්‍රදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.පී.චන්ද්‍රදාස මැතිතුමා:-**
**6.20.බෝපැත්ත වෙලන්ගල්ල මාර්ගයේ බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ ජයසිරි මහතාගේ නිවස අසලින් ඇති අතුරු මාර්ගයක් වන ලොට් අංක 22 අඹේවත්ත පාර ,මෙය අරඹේවත්ත ලෙස නිවැරදි විය යුතුයි. ආරම්භයට බෝක්කුවක් දමා සුදුසු ක්‍රමයකට සංවර්ධනය කිරීම සුදුසු බව මම යෝජනා කරමි.(මෙය පවුල් 07 කට පමණ ප්‍රයෝජනවත් වන මාර්ගයකි.)**

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එම්.පී.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි , මෙම මාර්ගය පවුල් හතක් පමණ ප්‍රයෝජනවත් වන මාර්ගයක්. එම නිසා ඒ සංවර්ධනය කර දෙන හැටියට මම යෝජනා කරනවා .

ඒ අනුව සභික එම්.පී.චන්ද්‍රදාස මැතිතුමාගේ **6.20.**බෝපැත්ත වෙලන්ගල්ල මාර්ගයේ බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ ජයසිරි මහතාගේ නිවස අසලින් ඇති අතුරු මාර්ගයක් වන ලොට් අංක 22 අරඹේවත්ත පාර ආරම්භයට බෝක්කුවක් දමා සුදුසු ක්‍රමයකට සංවර්ධනය කිරීම සුදුසු බව වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(මෙය පවුල් 07 කට පමණ ප්‍රයෝජනවත් වන මාර්ගයකි)

**සභාපතිතුමා:-**
6.21.සභික ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
**6.21.රයිසින් ග්‍රවුන්ඩ් පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, රයිසින් ග්‍රවුන්ඩ් පිවිසුම් මාර්ගයට ඩයලොග් ගම්මානය, සුද්දගෙවත්ත යන ගම්මාන වලට යන ප්‍රධාන පාර තමයි රයිසින් ග්‍රවුන්ඩ් ප්‍රවේසම් මාර්ගය කියල සඳහන් කරන්නේ. ඒක හදල තියෙන්නෙ

පොඩ්ඩයි. ඒ නිසා වර්ෂා කාලයේදී එක පැත්තක තියෙන ගෙවල් වලට සම්පූර්ණයෙන්ම උඩින් වතුර ගලාගෙන යනවා. ඒ (පැහැදිලි නෑ) තියෙනවා පිවිසුම් මාර්ගය අසල තියෙන නිවෙස් වලට. .මං යෝජනා කරනවා සියලුම මාර්ග වලට පිවිසෙන තැන නිසා, ගැට්ටක් වගේ හදල තියෙන් එම පාර සංවර්ධනය කරලා දෙන්න කියලා .

**සභික එම්.පී.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගයානි මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාවට මං දිගුවක් වදිහට ඉදිරිපත් කරනවා. ඒ මාර්ගයේ ඇත්තටම වර්ෂා කාලයේ වතුර එකතු වෙන බව මට කියලා තියෙනවා දෙමාපියෝ,අපේ දරුවෝ පාසල් යනකොට මේ සපත්තුවට උඩින් වතුර යනවා. පාසල් ගිහාම සපත්තුත් තෙමිලා, මේස් එකත් තෙමිලා, පාසල් කාලය නිමවනතුරු දරුවන් මේ තත්වයේ ඉදල තමයි එන්නෙ කියලා.මේ මාර්ගයේ සකස් කිරීමේ විශේෂත්වයක් තියෙනවා කාණු පද්ධතිය.ඒ නිසා මේ කාණු පද්ධතිය සකස් කිරීම සංවර්ධනයත් සමඟ ඉතාම සුදුසු කාර්යයක් බවට මම යෝජනා කරනවා.

ඒ අනුව සභික ගයානි බුද්ධිකා මැතිණියගේ **6.21.**රයිසින් ග්‍රවුන්ඩ් පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.22.සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
**6.22.පනාවල පාර , විජේකමල් මාවත ඉතිරි කොටස කොන්ක්‍රීට් කර ප්‍රතිශංස්කරණය කිරීම සුදුසු බව මම යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේක විලේගොඩ, පනාවල පාරේ ,විජේකමල් මාවත කොන්ක්‍රීට් කර ප්‍රතිසංස්කරණය කිරීම තමයි මම යෝජනා කරලා තියෙන්නේ. ඒකෙ මං හිතෙන්නේ, කොටස් දෙකකින් ප්‍රතිසංස්කරණය කරලා තියෙනවා. තව මැද අඩි තිහක වගේ ප්‍රමාණයක් තියෙනවා. මෙතනින් ගෙවල් දොළහකට වගේ යන්න පුළුවන්. ඒක ප්‍රතිසංස්කරණය කරදීම තමයි මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. ඒක හැකි ඉක්මනින් කර දෙන ලෙස මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි , මේ විජේකමල් මාවත කියන්නේ හිටපු විපක්ෂ නායක මන්ත්‍රීවරයෙක්ගේ නමින් තමයි නම් කරලා තියෙන්නේ. මං හිතන්නේ සමන්සිරි මන්ත්‍රීතුමාගේ බාප්පා. විශාල ඥාති පිරිසකුත් ඉන්නවා ඒ ප්‍රදේශයේ.මේ පාර සංවර්ධනය කළහොත් , ආර්ථික වශයෙන් (පැහැදිලි නෑ) පිරිසක් තමයි මේ ප්‍රදේශයේ ජීවත්වන්නේ. ඒ නිසා ඒ පාර සංවර්ධනය කිරීම උචිතයි. සුළු ප්‍රමාණයක් තියෙන්නේ වාහනවලට එහෙම දැඩි ලෙස බලපානවා මේ සංවර්ධනය කරන්න ඕනේ කොටස. එය සංවර්ධනය කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මන්ත්‍රීතුමාගේ **6.22.** පනාවල පාර විජේකමල් මාවත ඉතිරි කොටස කොන්ක්‍රීට් කර ප්‍රතිසංස්කරණය කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.23 සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
**6.23.විලේගොඩ සුපිංගියාවත්ත මාර්ගයට අදාළ පැති බැම් සකස් කර මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බව මම යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේකෙත් පවුල් විස්සක් පමණ ජීවත් වන ප්‍රදේශයක්. මේකේ තියෙන ගැටළුව තමයි ආරම්භයේදී පාර කොන්ක්‍රීට් කරලා තියෙනවා. පාලමකුත් දාලා තියෙනවා. නමුත් පාලම පොඩ්ඩක් පටු යි. එතන අපි පාලමට උඩින් කණු දෙකක්වත් ගහලා වාහනයක් හරව ගන්න පුළුවන් විදියට හදල පැති බැම්මේ යම්කිසි කොටසක් සංවර්ධනය කරලා තියෙනවා. ඉතිරි කොටස සංවර්ධනය කරන්න තියෙනවා. ඒ ටික සංවර්ධනය කරේ නැත්නම් අර කොන්ක්‍රීට් කරපු පාරත් කැඩිලා යන්න පුළුවන්. ඒ ටික කරලා,ඉදිරියට ඉතුරු කොටස තමයි කොන්ක්‍රීට් කරන්න තියෙන්නේ. ඒක මං හිතන්නේ , අපේ සංවර්ධන,අතුරලිය මන්ත්‍රීතුමත් ආවා, සංවර්ධන යෝජනාවල අපි ප්‍රමුඛතාවයට අරන් තියෙනවා,දෙවෙනි යෝජනාවට. මම හිතන්නේ මේකට මේ වසරේ මුදල් ලැබෙයි කියලා බලාපොරොත්තුවකුත් තියෙනවා, අපේ පළාත් සභා ප්‍රතිපාදන වලින්. ඒක ලැබෙන තෙක් තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සමන්සිරි මන්ත්‍රීතුමා කිව්ව වගේ එතන පටු කොටසේ බෝක්කුවක් එක්ක අනතුරු වෙච්ච් අවස්ථාත් තියෙනවා. මොකද ඒක පටුයි ගොඩක්. සංවර්ධනය වෙනවා කියන්නේ ,පාර තවත් පුළුල් වෙන්න ඕනි. ඒකෙ ජලය බැස යන කොටසේ තව පාර්ශ්ව දෙකක ඉඩම් විශාල ලෙස බාදනය වෙනවා. ඒ නිසා ඒ

පැති බැම්ම බඳිනකොට එක පැත්තක පැති බැම්ම බැඳලා කරන්න පුළුවන් නම් ගොඩක් උචිතයි කියලා යෝජනා කරනවා .

ඒ අනුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මන්ත්‍රීතුමාගේ **6.23.**විලේගොඩ සුපිංගියාවත්ත මාර්ගයට අදාළ පැති බැම් සකස් කර මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.24.සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ යෝජනාව

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
**6.24.විලේගොඩ , ගල් ගොරඩි වත්ත මාර්ගයේ පැති බැම්ම සකස් කිරීම සුදුසු බව මම යෝජනා කරමි. මෙය ගල්ගොඩේවත්ත ලෙස නිවැරදි විය යුතුයි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාවත් මම හිතන්නෙ පවුල් පහළොවක් පමණ ප්‍රතිලාභීන් ප්‍රයෝජනයට ගන්න මාර්ගයක් .මේ මාර්ගයේ කොන්ක්‍රීට් දාලා තියෙනවා. නමුත් එතන පොඩි බෑවුමක් තියෙන නිසා ඒ පැත්තේ පැති බැම්ම සකස් නොකර නම්, මං හිතන්නේ චන්ද්‍රිකා මහත්මියගේ නිවස අසලින් තමයි යන්නේ. පැති බැම්මේ යම්කිසි කොටසක් හදලා තියෙනවා. ඉතිරි කොටස සංවර්ධනය කළොත් ඒ මාර්ගය බාදනය වෙන එක වළක්වාගෙන ඉදිරියට මාර්ගය ප්‍රයෝජනයට ගන්න පුළුවන්.නැත්නම් අපි කොන්ක්‍රීට් දාලා තියෙන මාර්ගය උනත් කැඩිලා යන්න පුළුවන්. ඒක තමයි මම ඔබතුමාට යෝජනා කරන්නේ .

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සමන් සිරි මන්ත්‍රීතුමාගේ යෝජනාවේ මේක පැතිබැම්ම තවත් පොඩ්ඩක් නිර්මාණය කරන්න තියෙනවා. නැත්තං ඒ බෑවුමේ ස්වභාවයත් එක්ක පාර කැඩී යාමේ දැඩි අවධානමට ලක්වෙලා තියෙන කොටස.ඒත් එක්කම උඩ කොටස නාය අවදානමට ලක්වෙලා. නිවාස කීපයක් ඉවත් කරලා තියෙනවා. ඒ බලපෑමත් මේ පැතිබැම්ම ඉක්මනින් බැන්දේ නැතොත් , ඒ බලපෑමත් මේකට බලපෑමේ හැකියාවක් තියෙනවා .

ඒ අනුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මන්ත්‍රීතුමාගේ **6.24.**විලේගොඩ ගල්ගොඩේවත්ත මාර්ගයේ පැති බැම්ම සකස් කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.25.සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ යෝජනාව

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
**6.25.ගැටහැත්ත පොළ භූමිය සෞඛ්‍ය අනාරක්ෂිත හා අපිළිවෙළ ඉවත් වන පරිදි සංවර්ධනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම සුදුසු බව මම යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගැටහැත්ත පොළ ප්‍රදේශ කිහිපයකටම වැදගත් තැනක්.ගැටහැත්ත ,මීන්නාන , වලව්ට ,දෙහිගහපිටිය ,රන්පුරගම,ඒ ප්‍රදේශ ඔක්කොටම මධ්‍යස්ථානයක්.මේ පොළ හරිම අක්‍රමවත් සහ අපිරිසිදුයි. ඒ වගේ ම වෙළඳාම ගත්තහම ඒක සෞඛ්‍ය ආරක්ෂිත නෑ .ඒකේ මාළු වෙළඳාම් පවා මහපාරේ (පැහැදිලි නෑ) මාළු වෙළඳාම් පවා කරනවා , අපිරිසිදු බිමක තමයි වෙළඳාම් කරන්නේ.සමහර වෙලාවට මේ එළවළු පාවා සෝදන්නේ මේ වැසිකිලි පද්ධතිය ආශ්‍රිත වතුර අරන් තමයි සෝදන්නේ.පොල භූමියෙන් භාගයක් පමණ භාවිතා කරන්නේ වාහන නවත්තන්න.ඉතුරු භාගයක් විතර තමා වෙළඳාම සඳහා භාවිතා කරන්නේ. ඉක්මනට මේ පොල භූමියේ තියෙන කටයුතු පිළිවෙලකට පිරිසිදුව සිදු සකස් කිරීම සඳහා මම යෝජනා කරනවා. ලේකම්තුමත් ඒ ප්‍රදේශයේ ඉන්නේ. එතුමත් ඇතුළුව,මේ වැඩ කටයුතු ක්‍රමවත්ව සිදු කිරීමට කමිටුවක් පත් කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගැටහැත්ත නගරය , උප නගරයක් වගේ තියෙන්නේ. මේක සංවර්ධනය කරලා ඉදිරියට සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් බවට පත්කර ගන්න ලොකු උත්සාහයක් දරනවා. පොළ භූමිය ඉතාම වැදගත්. පොළ භූමිය පිළිවෙළකට ගන්න ඕනේ .අපිළිවෙලට තමයි යන්නේ. පිළිවෙලකට හදලා ජනතාව වැඩිපුර එතනට ගෙන්නල සභාවටත් වැඩි ආදායමක් ලැබෙන විදිහට අපිට වැඩපිළිවෙලක් සකස් කරන්න මේ කමිටුවට හැකි වෙයි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව සභික අයි.එච්.රණවීර මන්ත්‍රීතුමාගේ **6.25.**ගැටහැත්ත පොල භූමිය සෞඛ්‍ය අනාරක්ෂිත හා අපිළිවෙළ ඉවත් වන පරිදි සංවර්ධනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.26.සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ යෝජනාව.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**

**6.26.දියුරුම්පිටිය නිවහල් මාවතේ ප්‍රභාත් මහතාගේ නිවස අසල මාර්ගයේ කොටසක් කඩා වැටී ඇති බැවින් එම ස්ථානයේ පැති බැම්මක් බැඳීම සුදුසු බව මම යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය.:-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මේ මාර්ගයේ ලොකු වතුර පාරක් යන නිසා තමයි මේ කැඩිල තියෙන්නෙ. මම හිතෙන්නේ එතන ලොකු වාහනයක් ගිහිල්ලා පැත්තක් කඩා වැටිලා තියෙන්නේ.වැහි කාලෙට මෙතනින් යන ජල කඳ ඉතා විශාලයි ඒ ජල කඳ නිසා ගෙවල් තුන හතරක් පවා යට වෙනවා. ඒ වතුර පාරට මේ මාර්ගය මුළුමනින් කැඩී යන්න පුළුවන්. එහෙම වුණොත් විශාල වියදමක් ඒ වෙනුවෙන් දරන්න වෙනවා. ඒක නිසා හැකි ඉක්මනින් මේ බැම්ම සකස් කරගන්න පුළුවන්නම්, වෙන්න පුළුවන් ලොකු විනාශයක් සහ වියදමක් අවම කරගන්න පුළුවන් කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව සභික අයි.එච්.රණවීර මන්ත්‍රීතුමාගේ **6.26.**දියුරුම්පිටිය නිවහල් මාවතේ ප්‍රභාත් මහතාගේ නිවස අසල මාර්ගයේ කොටසක් කඩා වැටී ඇති බැවින් එම ස්ථානයේ පැති බැම්මක් බැඳීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

6.27.සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණියගේ යෝජනාව

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**

**6.27.මීටිපොල කොට්ඨාශයේ නැදුරන හවංකැටිය ගොඩැල්ල පාරේ ඇති පාලම ඉතා අබලන් තත්වයේ පවතී.එය වෙල් යාය මැද පිහිටා ඇති ඇළ මාර්ගයේ පාලම බැවින් වෙලෙන් එගොඩ ජීවත් වන මිනිසුන්ට වැසි කාලවලදී යාමට ඒමට ඉතා අපහසු තත්වයක් වී ඇත.මෙම පාලම පිළිසකර කර දී අපහසුතාවයෙන් මුදවා දෙන මෙන් මම යෝජනා කරමි.**

**සභික ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා.:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**

ගරු සභාපතිතුමනි, නැදුරණ හවංකැටිය ගොඩැල්ලවත්ත පාරේ වෙල්යායක්.වෙල්යාය මැද තමයි මේ ඇළ මාර්ගය මැදින් පොඩි පාලමක් දාලා තියෙන්නේ. ඒ පාලමේ අත් වැටක් කලින් තිබිලා තියෙනවා. සභාපතිතුමනි, දැන් මේ වෙනකොට අත්වැට කැඩිලා, අත්වැට නැහැ. දෙපැත්තෙ ඉවුරු දෙක හේදිලා ගිහිල්ලා .ඉතා අවදානම් තත්ත්වයක තමයි මේ පාලම තියෙන්නේ. වැහි කාල වලදී යටවෙන ප්‍රදේශයක්. එතකොට ගොඩට මිනිස්සුන්ට යන්න විදිහක් නෑ , මේ පාලම කඩාගෙන ගියොත්. දැනට ඉතා අබලන් තත්ත්වයේ තමයි තියෙන්නේ. ගම්වාසීන්ගේ ඉල්ලීමක් තමයි මම යෝජනා කරන්නේ .

ඒ අනුව සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණියගේ **6.27.**මීටිපොල කොට්ඨාශයේ නැදුරන හවංකැටිය ගොඩැල්ල පාරේ ඇති පාලම ඉතා අබලන් තත්ත්වයේ පවතී.එය වෙල් යාය මැද පිහිටා ඇති ඇළ මාර්ගයේ පාලම බැවින් වෙලෙන් එගොඩ ජීවත් වන මිනිසුන්ට වැසි කාලවලදී යාමට ඒමට ඉතා අපහසු තත්ත්වයක් වී ඇත.මෙම පාලම පිළිසකර කර දී අපහසුතාවයෙන් මුදවා ගැනීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**

6.28.සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

**6.28.විලේගොඩ සුසානාගාරයේ මිහිදන් කිරීම සඳහා වෙන් කර ඇති කොටසේ ඇති කළුගල ඉවත් කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, විලේගොඩ සුසානාගාරයට අයිති භූමිය තුළ සුසානාගාරය ඉදිකිරීමෙන් පසුව කොටසක් වෙන් වෙලා තියෙනවා, මිහිදන් කිරීමේ කටයුතු සඳහා. ඒකෙ විශාල වශයෙන් කළුගල් ප්‍රමාණයක් තමයි දැන තියෙන්නේ.අදියරෙන් අදියර සංවර්ධනය කරනකොට ඒ කළුගල් ටික ඉවත් කළොත් භූමිය අපිට පාවිච්චි කරන්න පුළුවන් භූමිදාන කටයුතුවලට. එතෙන්දි කළුගල් ටික ඉවත් කරලා,ඒ කළුගල් ටිකෙන් අපට ග්‍රාමීය සංවර්ධන කටයුතුවලටත් පාවිච්චි කරන්න පුළුවන් ,ඉදිරි සංවර්ධන කටයුතුත් තියෙන නිසා, පාවිච්චි කරන්නත් පුළුවන් සංවර්ධන කටයුතු තවත් තියෙන නිසා. ඒ කළුගල් ටික ඉවත් කරන්න ක්‍රමවේදයක් තමයි මම යෝජනා කරන්නේ.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.:-**

ගරු සභාපතිතුමනි, අතුරලිය මන්ත්‍රීතුමා ගෙනා ඒ යෝජනාව කාලෝචිත යෝජනාවක්. මං හිතන්නේ ආදාහනාගාරයක් හැදීම පිළිබඳ අපි හිටපු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනේ. එතනදි අපේ මරණාධාර සමිති, සියලුම සමිති වලින් යෝජනා වුණා ඔය කළුගල් තියෙන තැන කඩලා හදන්න පුළුවන් නම් හොඳයි කියලා. නමුත් තිබුණු ප්‍රතිපාදන මදිකම නිසා ඔය ආකාරයෙන් හරි අපි ආදාහනාගාරයක් සෑදීම පිළිබඳව හිටපු සභාපතිතුමා ඇතුළු සභිකයන්ට ස්තුතිවන්ත වෙන්න ඕනේ. නමුත් අතුරලිය මන්ත්‍රීතුමා කිව්ව කතාව තමයි

,දැන් අපිට මිනියක් මිහිදන් කරන්න ගෙනිච්චාම යම්කිසි ගැටලු තියෙනවා. අපට, ඒ කියන්නේ ආදාහනය කරන්න බෑ , භූමිදානය කරන්න අවශ්‍ය වෙන ඒවා. ඒවායේදී අපිට ස්ථානයක් නෑ ඇත්තටම. අපි වලක් කපන්න ගියොත් අපිට කලින් භූමිදානය කරපු ඒවගේ කොටස් අහුවෙනවා. සමහර ඒව පතල් කපනවා වගේ තට්ටු බැහැලා තමයි ඒක භූමිදානය කරගන්නේ. අපට භූමි දානය කරනකොට ලොකු ගැටලුවක් මතුවෙනවා, දවසක් විතර යනවා ඒ වල කපා ගන්න. ඉතින් අපිට ඉතුරු වෙලා තියෙන්නේ කළුගල් තියෙන භූමිය තමා. අනිත් ටිකේ අපි ආදාහනාගාරය හදලා තියෙන්නේ. මෙන්න මේ කළුගල කඩල අපි ඉදිරියේදී ඒක සංවර්ධනය කිරීමටත් බලාපොරොත්තු වෙනවා. මේකේ ටයිල් ටික අල්ලලා ඉතුරු වැඩ කටයුතු ටික මේ වසර නිමවීමට කලින් ඉවර කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ කළුගල කඩලා ගත්තොත් අපට සංවර්ධන කටයුතුවලටත් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. එතුමා ඉදිරිපත් කරපු යෝජනාව කාලෝචිත යෝජනාවක් .එම යෝජනාව හැකි ඉක්මනින් ඉටු කර දෙන මෙන් සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික ඒ.ටී.සී.අතුරලියමන්ත්‍රීතුමාගේ **6.28.**විලේගොඩ සුසානාධාරයේ මිහිදන් කිරීම සඳහා වෙන් කර ඇති කොටසේ ඇති කළුගල ඉවත් කිරීමයෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.29.සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
**6.29.බටුහේන කළුගල්දෙනිය මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි , බටුහේන, කළුගල්දෙනිය මාර්ගය,බටුහේන මාර්ගයට වම් පැත්තෙ මාර්ගයක්. නිවෙස් පහක් පමණ පිරිසක් එය භාවිතා කරනවා. ත්‍රිවිල් එකකවත් යන්න බැරි විදිහට පාර කැඩී බිඳී ගිහින් තියෙනවා. ඒත් එක්කම ආර්ථික වශයෙන් විශාල වශයෙන් තේ වගා කරුවන්, රබර් ,කුරුඳු වගාවල නිරත වෙන විශාල පිරිසක් මේ ගමන් මාර්ගය ප්‍රයෝජනයට ගන්නවා. අසනීපයක් වෙච්චි මොහොතක පවා ත්‍රිවිල් එකක් ගමන් කරන්න බැරි තත්ත්වයක තමයි දැන් තියෙන්නේ. පසුගිය රජයන් කාලයේ කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීම නිසා , ඒ මාර්ගය පිරිසකර කරන්න හැකියාව ලැබුණේ නෑ. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරනවා , එම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙසට.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, අපේ පොල් පෝරනය කලින් තිබිලා තිබුණේ ඔය ස්ථානයේ. ගරු සභාපතිතුමා, ගිහිල්ලා එක නිරීක්ෂණය කළා. ඒ යනකොට තියෙන මාර්ගයේ වම් පැත්තට තියෙන මාර්ගය තමයි අතුරලිය මන්ත්‍රීතුමා යෝජනා කරලා තියෙන්නෙ.දැනට බටුහේන මාර්ගය සංවර්ධනය කිරීමට අපේ සංවර්ධන යෝජනා ක්‍රමවල නැගෙනහිර විලේගොඩ වසමේ පළමුවෙන්ම තියෙන්නේ. ඒ බටුහේන මාර්ගය.බටුහේන මාර්ගය සංවර්ධනය කරන අතරතුර ඔය අතුරු මාර්ගය වශයෙන් ගෙවල් පහකට පමණක් යන්න තියෙන මාර්ගයත් සංවර්ධනය කිරීම ඉතාමත් සුදුසුයි කියලා මමත් යෝජනාව අනුමත කරනවා .

ඒ අනුව සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ **6.29.**බටුහේන කළුගල් දෙනිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.30 සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
**6.30.බෝපැත්ත මාර්ගයේ 290 - කෑ/ඉහලගම එම්.එම්.තිලකරත්න මහතාගේ නිවස අසල කාණු පද්ධතිය සැකසීම හා දුරකතන රැහැන් ඇද ඇති කණුව නිසි පරිදි ස්ථානගත කිරීම සඳහා යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර්මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ කොටස අයිති වෙන්නේ නගර කොට්ඨාශයට .මෙතන තිලකරත්න මහතාගේ නිවස අසල කාණුව ක්‍රමාණුකූලව හදල නෑ. ඒක නිසා අර දුරකථන රැහැන් ඇදලා තියෙන කණුව නිසි පරිදි ස්ථානගත වී නැති නිසා එතන මාර්ගය පටු වෙලා තියෙනවා. එතන නිරන්තරයෙන්ම රථ වාහන අනතුරුවලට භාජනය වන තැනක් බවට දැන් පත් වෙලා තියෙනවා. ඒකත් එක්කම එතන බෝක්කුවක් තියෙනවා .බෝක්කුවත් පළල් කරලා පුලුවන්නම් හොඳයි. ඔබතුමා නිරීක්ෂණයකට ගිහිල්ලා, අදාල තැන් වලට යොමු කරන්න පුළුවන් නම් මේ අදහස වඩාත් උචිතයි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව සභික ඒ.ටී.සී.අතුරලිය මන්ත්‍රීතුමාගේ **6.30.**බෝපැත්ත මාර්ගයේ 290- කෑ/ඉහලගම එම්.එම්.තිලකරත්න මහතාගේ නිවස අසල කාණු පද්ධතිය සැකසීම හා දුරකතන රැහැන් ඇද ඇති කණුව නිසි පරිදි ස්ථානගත කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.31.සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමාගේ යෝජනාව.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**

**6.31.යකුදාගොඩ ග්‍රාම සේවක වසමේ , යායපාරේ මහේෂ් මහතාගේ නිවස අසල සිට සරණපාල මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ අබලන් කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමනි. මේක කොන්ක්‍රීට් කරලා වැඩ නිම කරලා තියෙන පාරක්. ඇත්තට ම මේකෙ මීටර් 50ක් වත් නෑ.පොඩි ප්‍රමාණයක් තියෙන්නේ.ඒක ඉතා කඩිනමින් සංවර්ධනය කරලා දෙන්න කියලා ඉල්ලනවා. ඒ වගේම ආරියදාස මන්ත්‍රීතුමා දන්නවා,ඒ හරියෙ සම්පූර්ණයෙන්ම ඉන්නෙ එන්.පී.පී.එකට උදව් කරපු අය.එ හින්දා ආරියදාස මන්ත්‍රීතුමාගේ යෝජනාවක් විදිහට කරලා,එහෙට ගියහම අපෙත් හිතවත්තු හිටියා.ඒ වුණාට අපිට වැඩ කරලා දුන්නෑ. ඇත්තටම ආරියදාස මන්ත්‍රීතුමාට මුළු ගමම වැඩ කළා. ඒ නිසා ඉතා ඉක්මනින් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා

**සභික එච්.ආරියදාස මැතිතුමා.:-**
එතුමා කියපු එක හරියටම හරි.

**සභාපතිතුමා:-**
ඒ යෝජනාවට මටත් තියෙනවා ඌන පූර්ණයක් කරන්න.යායපාරේ මේ ගෙදරට ගියා.එතෙන්දිත් මහේෂ් මහත්මයා මාත් එක්කත් කතා කරලා කිව්වා.ඔය පාර කරල දෙන්න කියලා.මටත් ඕක මතක් වුණා.

ඒ අනුව සභික පී.මාලින්ද මුදන්නායක මන්ත්‍රීතුමාගේ **6.31.**යකුදාගොඩ ග්‍රාමසේවක වසමේ යාය පාරේ මහේෂ් මහතාගේ නිවස අසල සිට සරණපාල මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ අබලන් කොටස සංවර්ධනය කිරිමයෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.32.සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමාගේ යෝජනාව

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
**6.32.තොරණගොඩ බටුකොටුව කොහිලදෙනිය මාර්ගයේ මීටර් 50 ක පමණ කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටියමැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔබතුමා දැනුවත් ද දන්නෑ බටුකොටුවට ඇතුල් වන මාර්ගයට ගිහිල්ලා, ළිඳ හරියේ ඉඳන් මීටර් 20ක් තිහක් වගේ පොඩි ප්‍රමාණයක් තියෙන්නේ. පවුල් විස්සක් තිහක් අතර ප්‍රමාණයක් මේ මාර්ගය භාවිතයට ගන්නවා.වැහි කාලෙට යන්න බෑ.වැහි කාලෙට පාසල් ළමුන්ටවත් යන්න අපහසුයි. ගල් ගොඩක් වගේ තියෙන්නේ ඒ ටික.ඉතා කඩිනමින් සංවර්ධනය කරලා දෙනවනම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි, ඔය කියන පාර තියෙන්නේ මගේ වසමේ. මගේ ගෙට පිටුපස්සෙන් තියෙන පාර. ඕකේ පාර විතරක් නෙමෙයි, ගරු සභාපතිතුමනි. එතන යන කුඩා පාලම් දෙකත් ගිලා බැහැලා තියෙන්නේ. ඒ පාලම් දෙකත් අලුත්වැඩියා කරලා ඒ පාර කොටස සංවර්ධනය කරන්න ඕන. දෙපැත්තම කොන්ක්‍රීට් කරලා තියෙනවා. මැද වළවල් හැරිලා. දෙපැත්තෙ කාණු ගොඩවෙලා. කාණුවල මිනිස්සු තාප්ප බැඳලා. ඒ වගේ ප්‍රශ්නයක් තියෙනවා ඒ පාර කැඩෙන්න හේතුවත්. අපේ ග්‍රාමීය සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතාවය මත නමවෙනි ස්ථානයට ලැයිස්තුගත කරලා තියෙන පාරක් ඕක.

ඒ අනුව සභික පී.මාලින්ද මුදන්නායකමන්ත්‍රීතුමාගේ **6.32.**තොරණකඩ බටුකොටුව කොහිලදෙනිය මාර්ගයේ මීටර් 50 ක පමණ කොටස සංවර්ධනය කිරිමයෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.33.සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමාගේ යෝජනාව

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
**6.33.මැදපිටිය මුල්ලක්කන අමුණ ළඟ පිහිටා ඇති අනාරක්ෂිත පාලම අළුත්වැඩියා කොට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ පාලම නාකන්දල මැණික් දොළ මාර්ගයේ මායිම් කොටගත් පාරේ තියෙන පාලමක්..අවුරුදු ගානකින් මේ පාලම සංවර්ධනය වෙලා නෑ. මම හිතන්නේ අපේ උපසභාපතිතුමන් දැනුවත් ඇති ඒ පාලම ගැන. ගරු සභාපතිතුමනි , එම පාලම දැන් දිරාපත් වෙමින් පවතිනවා. ඉතා කඩිනමින්

සංවර්ධනය කළ යුතුයි. නැත්නම් අලුතෙන් පාලමක් දාලා හදන්න වෙනවා. දැන්මම සංවර්ධනය කළහොත් කෙටි මුදලකින් සංවර්ධනය කරගන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

ඒ අනුව සභික පී.මාලින්ද මුදන්නායකමන්ත්‍රීතුමාගේ**6.33.**මැදපිටිය මුල්ලක්කන අමුණ ළඟ පිහිටා ඇති අනාරක්ෂිත පාලම අලුත්වැඩියා කොට සංවර්ධනය කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.34.සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ යෝජනාව

**සභික ඒ.එස්.එම්.මිස්බාග්මැතිතුමා:-**
**6.34.මෝරගල පල්ලිය අසල ප්‍රධාන මාර්ගයේ සුදු ඉර මැකී ඇති බැවින් නැවත ස්ථාපනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාග්මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම සුදු ඉර පල්ලියේ දහම් පාසල් ළමුන් සෑහෙන ප්‍රමාණයක් මාරු වෙන තැනක්. මීට කලින් තිබ්බව එකක්. ඒක මැකිලා දැන් හුඟක් කාලයක් වෙනවා.එතන කහපාට බෝඩ් එකකුත් තියෙනවා පදිකයන් මාරු වෙන ස්ථානයක් කියලා.නමුත් එතන ඉරක් නැහැ.ඒ හින්දා ඒක සුදුසු තැනට යොමු කරලා,මේක තිබ්බ්වි විදිහට සුදු ඉර ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා -**
මේ යෝජනාව හොඳ යෝජනාවක්. මේ වගේ යෝජනා මන්ත්‍රීතුමා ගේනකොට මට පුද්ගලිකව දුන්නනම්, මොකද මේක RD එකෙන් කරන්න ඕන එකක්. RD එකට මම කියලා ඇහැලියගොඩ නගරයේ කාණු පද්ධතිය සුද්ද කරලා දෙන්න කියලා, නමුත්රණවීර මන්ත්‍රීතුමාගේ ඉල්ලීමක් එක්ක ,අපි ඒක ගැටහැත්තෙ ඉඳන් සුද්ද කරගෙන යනවා. මේ වගේ යෝජනා කාලෝචිතයි. නමුත් අපිට කරගන්න පුළුවන් දෙයක් නෙමෙයි. ප්‍රධාන මාර්ගය RDඑකේ. මම මේක පදනම් කරගෙන RD එකට මේක යොමු කරන්නම්.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,මම මේක ඔබතුමාට පුද්ගලිකව ඉදිරිපත් කළේ නෑ. මෙතුමා කිව්ව කාරණයටම එකතුවක්. ප්‍රාථමික විද්‍යාලය ඉදිරිපිටත් තියෙනවා බෝ ගහ අසල පාර පනින ස්ථානයක්. ඒකෙත් සුදු ඉර මැකිලා තියෙන්නෙ.RDඑකට කියලා ඉක්මනට ප්‍රතිසංස්කරණය කරලා දෙනවා නම් හොඳයි. දරුවෝ එතනින් පාර පනිනවා.වාහන වේගයෙන් යන නිසා අනතුරු බහුලව සිදුවන ස්ථානයක් ඒක. ඒ වගේම සුදු ඉර මැකිච්ච ස්ථාන තුන හතරක්ම තියෙනවා. අපි ඒක ඔබතුමාට පුද්ගලිකව දෙන්නම්. ඒක ප්‍රතිසංස්කරණය කරල දෙන්න මාර්ග සංවර්ධන අධිකාරියත් එක්ක කතා කරලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,මේකට සාමාන්‍යයෙන් සභාවේ මන්ත්‍රීවරයෙක් කතා කළාම,ඒ සභාවේ යෝජනා ස්ථිර වුණහම ,අපි කලින් සභාවලත් මෙය සභාවේ තීරණයක් විදිහට යවනවා. මේ ගැන සලකා බලලා මේ ඉක්මනින් කරලා දෙන්න කියලා. එහෙම තීරණයක් බලාපොරොත්තුවෙන් තමයි, මෙතුමන්ලා, අපි යෝජනා ඉදිරිපත් කරන්නේ. අපි ඒක සභාවෙන් බලාපොරොත්තු වෙනවා. අපේ ගමේ තියෙන යෝජනා අදාල අංශවලට සම්බන්ධීකරණය කරලා ඒක ඉෂ්ට කරයි කියල .ඒ අපේක්ෂාවෙන් තමයි යෝජනා ඉදිරිපත් කරන්නේ .

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,ප්‍රාථමික විද්‍යාලය ඉස්සරහ කාණුවේ කොන්ක්‍රීට් ලෑලි දෙකක් වැටිලා තියෙනවා. ළමයින් එතන වැටිලා තියෙනවා. ඒකත් සකස් කර දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි,ගැටහැත්ත කොන්ක්‍රීට් කැලි අයින් කරලා සුද්ද කරාට පස්සේ, ඒ ලෑලි නැවත දානකොට පිළිවෙලකට වැටිලා නැතුව තියෙනවා. මං ගැටහැත්තෙ බැජකුවට යන නිසා දැක්කේ.හෝල්ට් එකේම ලොකු වළවල් තියෙනවා.ඉස්කෝලේ ළමයි එතනින් තමයි බස් එකට නගින්න එන්නේ. ගොඩක් ඇරිච්චි ඒවා තියෙනවා. ඒ ගැන බලලා සකසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා ,**
අපේ රණවීර මන්ත්‍රීතුමා ඒකට පොඩ්ඩක් මැදිහත් වෙන්න. හැකි ඉක්මනින් යථා තත්ත්වයට පත් කරන්න.

ඒ අනුව සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ **6.34.**මෝරගල පල්ලිය අසල ප්‍රධාන මාර්ගයේ සුදු ඉර මැකී ඇති බැවින් නැවත ස්ථාපනය කිරීම යෝජනාව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.35.සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ යෝජනාව.

**සභික ඒ.එස්.එම්.මිස්බාග්මැතිතුමා:-**
**6.35.**වෑකඩ නාලක මහතාගේ නිවස අසල සිට ඉක්බාල් මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම **සුදුසු බවට යෝජනා කරමි. (**මීටර් 20ක්)

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාග්මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෝරගල වැකඩ ප්‍රදේශයේමීටර් 20ක් වගේ තියෙන්නෙ. ඒ පාර විතරයි, අඩුපාඩුවක් වෙලා තිබුණේ. එතනින් යන මිනිස්සු හරි අපහසුතාවයට පත්වෙනවා. හරි අමාරුවෙන් යන්නේ. බයිසිකලයකින්වත් යන්න බෑ එතන. ඔබතුමා ඒකට මුල් තැනක් දෙන්න කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව සභික ඒ.එස්.එම්.මිස්බාග්මන්ත්‍රීතුමාගේ**6.35.**වැකඩ නාලක මහතාගේ නිවස අසල සිට ඉක්බාල් මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම (මීටර් 20 ක්) යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.36.සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ යෝජනාව

**සභික ඒ.එස්.එම්.මිස්බාග්මැතිතුමා:-**
**6.36.මෝරගල හන්දියේ සිට ක්‍රීඩා පිටියේ ගේට්ටුව දක්වා කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට යෝජනා කරමි.**

**සභික පී.ඩිල්ෂාන් කාවින්දමැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාග්මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම මෝරගල ක්‍රීඩා පිටියට යන පාර හරි දුෂ්කර පාරක්. ඔබතුමාල පොඩ්ඩක් ගිහිල්ල බලන්න, එතනින් ළමයි ඔක්කොම ඒ පාරෙන් තමයි යන්නේ. ගේට්ටුව දක්වා යනකන් හරිම අබලන් වෙලා තියෙන්නේ.බයිසිකලයකටවත් යන්න බෑ. දවසක ගිහිල්ලා පරීක්ෂා කරලා බලන්න එච්චර දුෂ්කරයි. කොන්ක්‍රීට් කරලා දාලා හරි තාර දාල හරි පාර හදාගන්න මම මගේ යෝජනාව යොමු කරනවා.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි, මං හිතන්නේ මට සභාවට ඇවිත් මුලින්ම යෝජනාව දැම්මෙ හොරගොඩ, මෝරගල පාර කියලා.මේ පාර .මං හිතන්නේ පිට්ටනිය දක්වා නෙමෙයි, එතන පාරට ගියපාර ලක්ෂ දහයක් වෙන්වෙලා තිබුණා. කොන්ත්‍රාත්කරුවෙකු නැති හේතුන් මත ඒක කරගන්න බැරි වුණා. එම පාරේ දිනකට පන්සීයක්, දාහක් වගේ පිරිසක් යනවා. විලේගොඩ , අංකිරිපොත්ත,මෝරගල,හොරගොඩ ඒ වගේ ලොකු ජනතාවක් යන පාරක්. ඒ පාරේ සභාපතිතුමා එතන පාලම , මම හිතන්නේ අපේ මන්ත්‍රීවරයත් ගිහින් බැලුවා. ඒකෙ තියෙනවා කැඩී ගිය බෝක්කුවකුත් එක්කලා.බෝක්කුව ගිලා බැහැල තියෙනවා.ඒ හින්දා ඒක විශේෂ අවධානයක් යොමු කරලා කරන්න කියලා කියනවා. මේක පිට්ටනියට එන්න අතුරු මාර්ගයක් විදියට සංවර්ධනය කරන්න තිබ්බ පාරක්. ඒ වගේම යන්නම බෑ.මේ වෙනකොට බයික් එකක් නෙමෙයි. පයින් වත් යන්න බෑ. වැස්ස වෙලාවට නම් මම හිතන්නේ අපේ ගාමන්ට් යන , ඉස්කෝලෙට යන උඩුමත්ත ඉස්කෝලෙට යන ළමයින්ට එහෙම යන්නම බැරි මට්ටමක් තියෙන්නේ. ඒකට විශේෂ අවධානයක් යොමු කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මං හිතන්නේ මෝරගල ක්‍රීඩා පිට්ටනිය ප්‍රයෝජනයට ගැනීමේදී මේ මාර්ගය ඔස්සේ තමයි මං හිතන්නේ VIP කණ්ඩායම් රැගෙන එන්නේ.VIP ඔබතුමාටත් හොඳ නෑ. VIPකියන අදාල කොටස වැඩිපුරම පිවිසුම් මාර්ගය ලෙස භාවිතා කරන්නේ, මේ පැත්තෙන් . හැම උත්සවයකටම ආරාධිත අමුත්තන් කැඳවන්න ප්‍රවේශය ගන්නේ, ඒ මාර්ගය ඔස්සේ පිටවීම හා ඇතුල්වීම ගොඩක් දුරට සිදුවෙන්නේ එතනින්.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි,VIP?

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම අදහස් කළේ , උත්සවයට පැමිණෙන ප්‍රධාන ආරාධිත අමුත්තන් .කෙටි කරලා කිවුවේ.වචන කෙටි කරලා කියන්න කිව්වා. ඒ පරමාර්ථයෙන් තමයි කිව්වේ.

**සභික පී.ඩිල්ෂාන් කාවින්දමැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, මිස්බාග් මන්ත්‍රීතුමා කළ යෝජනාවට මමත් එකතුවක් කරනවා. මොකද ඒ මාර්ගය දැන් මම හිතන්නේ ,ගොඩක් කල් ඉඳන් තමයි කැඩිලා තියෙන්නේ. ඒ පාරේ වත්සලා මන්ත්‍රීතුමිය කිව්වා වගේම පයින්වත් යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. මොකද ලොකු වලවල් තියෙනවා. වැස්ස දවසට එහෙම කොහොමත්ම යන්න බෑ. ඒ පාර එතනින් එහාට. මන්ත්‍රීතුමිය කලින් යෝජනාවට දාලා තිබුණා.එතන බෝක්කුව පැත්තක් ගිලා බැහැල තියෙන්නේ.මමත් එතන පොඩ්ඩක් බැහැලා බැලුවා. පොඩි සිලින්ඩරයක් වගේ එකක් දාලා තියෙන්නේ. වහින පළාතක් හින්දා ලොකු වාහනයක් එහෙම දන්නේ නැතුව ගියොත් , එහෙම එතන වලක් තියෙන්නේ. එතන වලට වැටෙන්න පුළුවන් හින්දා, ඒක කඩිනමින් අපිට කරල දෙන්න කියලා ඉල්ලා සිටිනවා .

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, කවද හරි ඒ වැඩසටහන , යෝජනාව ක්‍රියාත්මක වෙනකන් අපි සභාවේ මාර්ග කම්කරුවන් දාලා, එතනින් යන්නම බෑ, මානා ගස් ටික පාරේ තියෙන්නේ.ශ්‍රමදානයක් එහෙමත් කළා.කරාට දැන් ඒකෙ යන්න බෑ. මම ඊයේ ගියා යන්න බෑ. පාරේ අඩි 10 වුණාට, අඩි තුනයි යන්න පුළුවන් තියෙන්නේ.අඩි පාරක් වගේ පේන්නේ. අපිට ඒක ඉක්මන් කරගන්න පුළුවන්නම් හොඳයි.

ඒ අනුව සභික ඒ.එස්.එම්.මිස්බාග්මන්ත්‍රීතුමාගේ **6.36.**මෝරගල හන්දියේ සිට ක්‍රීඩා පිටියේ ගේට්ටුව දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.37.සභික දිලින් කරුණාපාල මැතිතුමාගේ යෝජනාව

**සභික දිලින් කරුණාපාල මැතිතුමා.:-**
සභාපතිතුමනි, මෙන්න මේ යෝජනාවට තමයි දිගින් දිගටම පහුගිය දවස්වල අපි පයිට් කළේ මේ යෝජනාව මේකට දාන්න කියලා.කොහොම හරි මේපාර මේ න්‍යාය පත්‍රයට මේ වෙනකොට මයෝජනාව ඇවිත් තියෙනවා.

**6.37.මෝරගල සිට පැල්පිටිය හරහා ඉද්දමල්ගොඩ මාර්ගය කාපට් කිරීම සඳහා අදාළ අංශවල අවධානය යොමු කරවා ගැනීමට යෝජනා කරමි..**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, මම දන්නව මේක ප්‍රාදේශීය සභාවේ කාර්යයක් නෙමේ. නමුත් මේ මාර්ගය ඉතාමත් අබලන් තත්ත්වයේ අද වෙනකොට පවතින්නේ. අපිට දැනගන්න ලැබුණා ,මේ ආණ්ඩුවෙන් ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා.ගනේගොඩ ප්‍රදේශයේ පැති බැම්මක් කඩා වැටිලා තියෙනවා. නාය ගිහින් තියෙනවා. ඒ සඳහාත් ප්‍රතිපාදන වෙන්වෙලා තියෙනවා කියලා ආරංචියි. ඊට අමතරව තව බෝක්කු තුනක් අපට ප්‍රතිසංස්කරණය කරන්න අවශ්‍යතාවය තියෙනවා. හැබැයි මෙවර පළාත් සභාවේ ආණ්ඩුකාරතුමිය හරහා වෙන් වෙච්චි මුදල්, මෙම මාර්ගය සඳහා ප්‍රමුඛතාවය හම්බෙලා නෑ කියලා ආරංචිය අපිට ඇවිල්ලා තියෙනවා.කෙසේ වෙතත් රුපියල් මිලියන 646 ක මුදලක් රත්නපුර දිස්ත්‍රික්කයසඳහා පළාත් සභාවෙන් වෙන්වෙලා තිබුණත්, මෙම පළවෙනි අදියරට අවශ්‍යයි මිලියන 30ක්. නැත්නම් ලක්ෂ 300ක් අවශ්‍යයි ,පළවෙනි අදියර නිම කරන්න. නමුත් ඇහැලියගොඩ ආසනයේ කිසිම මාර්ගයක් , පළාත් මාර්ගයක් කාපට් කරන්න හෝ ප්‍රතිසංස්කරණය කරන්න ,කාපට් කරන්න මෙම මුදල් වෙන් වෙලා නෑ කියන එක අපට දැනගන්න හම්බුනා. ඉතින් අපට ඒක කණගාටුදායක ආරංචියක්. අපි විශ්වාස කරනවා මේ ඇහැලියගොඩ ආසනය නියෝජනය කරන ඔබතුමන්ලා ,අපේ ආසන සංවිධායකතුමා ඇමතිවරයෙක්, තවදුරටත් මැදිහත් වෙලා මේ මාර්ග සංවර්ධනය කරන්න ප්‍රමුඛතාවය ලබාදෙයි කියලා. නමුත් ඒ අඩුව අපි දකිනවා. කෙසේ වෙතත් මම අද ඉල්ලනවා ගරු සභාවෙන් ,සභාපතිතුමනි, පරිපූරක ඇස්තමේන්තුවක් යොමු කරවල හරි මේ වර්ෂයේ මෙම මාර්ගය පළවෙනි අදියර හරි ආරම්භ කරන්න පොඩි උත්සාහයක් යොදන්න අපිට අවශ්‍ය වෙන්නේ. අපි තාක්ෂණ නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා අපට කිව්වෙ කෝටි තුනක වගේ මුදලක් අවශ්‍යයි කියලා. ඒ මුදල පරිපූරක ඇස්තමේන්තුවකින් හරි මෙම වර්ෂය තුළ ආරම්භ කිරීමට ලබා දෙන්න කියලා යෝජනාව මම මේ අවස්ථාවේදී කරන්න කැමතියි.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, අපේ දිලින් කරුණාපාල මන්ත්‍රීතුමා කියපු එක හරි. මේ පාරේ කොටසක් මගේ කොට්ඨාසයටත් අයිති වෙනවා . මේ වෙනකොට මම දැනුවත් කරන්න ඕනි, මගේ වසම ගනේගොඩට අයිති වන විදිහට ලක්ෂ පනස් නමයක් මුදලක් මේ වෙනකොට පළාත් සභාවෙන් වෙන් කරගන්න පුළුවන් වුණා. නාය ගිය පැතිබැම්මයි, එතන තියෙන බෝක්කුව පළල් කරගන්න. ඊට අමතරව ඔබතුමා කිව්වා, කාපට් පාරවල් මේ වෙනකොට එකක්වත් අපට කරගන්න බැරි වුණා කියලා. මේ වෙනකොට ආසනය තුළ පාරවල් තුනක් අපට අනුමත වෙලා ටෙන්ඩර් කෝල් කරලා තියෙන්නේ. මේකත් අපි ප්‍රමුඛගත කරලා තියෙන එකක්. මේක ඊළඟ අදියරේදී අපිට හම්බවෙන පාරක් තමයි කාපට් කරන්න. ඔය පැල්පිටිය මාර්ගය. මොකද අපි, අපේ සභාපතිතුමත්, උපසභාපතිතුමත් නිරන්තරයෙන් මේකට උනන්දු වන පාරක්. ඒ නිසා ඔබතුමා හිතන්න එපා මොනම හේතුවක් නිසාවත් මේ පාර අමතක කරලාවත්, අපට පැල්පිටිය නැති වුණා කියලා. එහෙම අර සමාජ මාධ්‍යයේ තියෙනවා මම දැක්කා. කියපු අයටත් මම කිව්වා එහෙම හිතන්න එපා කියලා. මොකද මමත් මේකට මගේ කොට්ඨාසයේ නොවුනත්, මට අදාල පාරක් නිසා මමත් මේකට මැදිහත් වෙනවා. නිතරම අපිඋපසභාපතිතුමාටත් මේක දැනුවත් කරනවා ඉක්මනට කරගන්න ඕනේ කියලා.අපිට අපේ ඇමතිතුමාට ඒ ලේකම්තුමාලටත් අපි කියලා ඔවුන් මේ වෙනකොට ප්‍රමුඛතා ගත කරලා තියෙනවා. ඊළඟ එන අපට කාපට් මාර්ගය ,පැල්පිටිය මාර්ගය බවට පත් කිරීමට කටයුතු සූදානම් වෙලා තියෙනවා කියලා මම ප්‍රකාශ කරනවා. ඒ නිසා ඒ ගැන සුභවාදී බලාපොරොත්තුවෙන් ඉන්න කියලා මේ අවස්ථාවේ මම දැනුවත් කිරීමක් විදිහට කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ දැනුවත් කිරීමට පුළුවන්කමක් තියෙනවා නම්, ඒ ටෙන්ඩර් දාපු පාරවල් තුන ගැන කියන්න.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම්මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, එක පාරක් හේවායින්න , කොස්හේන මාර්ගය ලක්ෂ 228ක පාරක් .ඒක මගේ කොට්ඨාශයේ එකක්.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, අනික් පාරක් තමයි නැදුරන කොස් ගස් හන්දියේ සිට බතල කොටුව හරහා කිරිපෝරුව හරහා යන පාර සංවර්ධනය කිරීම. ඒකෙ මුදල මිලියන 13.60 යි.ඊළඟ පාර තමයිකීනගහවිල කනුග්ගල්ල පාර සංවර්ධනය කිරීම.මිලියන 13.60 යි. එම මාර්ග තුන තමයි..

**සභාපතිතුමා:-**
බොහොම ස්තුතියි.දිලීන් කරුණාපාල මන්ත්‍රීතුමා කිවුව වගේ පැල්පිටිය පාර විශේෂ,මොකද අපි හැම පාරක්ම නිරීක්ෂණය කරනකොට අපිටත් තේරෙනවා පැල්පිටිය පාර හදන්න ඕනි කියලා. මං ඊයේ ප්‍රධාන අමාත්‍යාංශයට ගියා. ඇත්තටම මම පැල්පිටිය ගැන ඇහුවාමං. මේ දැනුත් කෝල් එකක් ගත්තේ එතන ඉන්න නිලධාරියෙකුට. ඇත්තටම මේ අවුරුද්දේ පුළුවන් වෙන කතාවක් කිව්වා. අපි කිව්වා පැල්පිටිය කාපට් කරමු කියලා. අපි මේක බලමු මන්ත්‍රීතුමා මේ අවුරුද්දෙ කරගන්න.

**සභික එච්.ආරියදාස මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, යායාපාර , දන්දෙනිය මම හැමවෙලේම කතා කරන පාර. ඒ පාර කාපට් කරගන්න ඕනි කියන එක. ඒ මිනිස්සුන්ගේ පළවෙනි ඉල්ලීම ඒක. වෙන මොකුත් ඒ මිනිස්සුන්ට ඕන් නෑ. මොකද ඒක තමයි නගරයට තියෙන ළඟම විකල්ප මාර්ගය. ඒකටත් අවධානය යොමු කරන්න කියලා මම හැමදාම ඒ වෙනුවෙන් කතා කරනවා. මගේ නෙමෙයි. ඇහැලියගොඩ තියෙන ළඟම තියෙන විකල්ප මාර්ගය. ඒකට අවධානය කරන්නම ඕනි තැනක්. පහුගිය කාලේ පහුගිය රජයන් ඔක්කොම උත්සාහ කරනවා එක කරන්න.එක නිසා,මේ දිලීන් මන්ත්‍රීතුමාගේ එකට විරුද්ධව කතා කරනව නෙමෙයි. ඒකත් අනිවාර්යයෙන්ම විය යුතු එකක්. මේකත් අනිවාර්යයෙන්ම විය යුතු එකක්. ඒක නිසා සභාවේ ඔක්කොටම දැනුවත් වෙන්න මම කියන්නේ, ඒකටත් අවධානය යොමු කරන්න කියලා. මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අස්ගහුල පාර මාර්ගයත් කාපට් අතුරන්න පුළුවන්නම් හොඳයි. ඒකත් කැඩිලා ගංවතුර කාලෙදි .

**සභික සුජීව විජේසූරිය මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, ආරියදාස මන්ත්‍රීතුමා කිව්ව වගේ ඇත්තටම කිලෝමීටර් 1.5 යි තියෙන්නේ. අපි ගොඩක් උත්සාහ කළා. ඒ වෙලාවේ දෙපැත්තේ තාප්ප කඩනවා කිව්වා. අරකද ,මේකද කිව්වා. අපේ ආරියදාස මන්ත්‍රීතුමා දන්නවා,ඔය වගේ ප්‍රශ්න ආවා.ඔකට මුදල් වෙන් කළා. අපි සිහිපත් කරන්න ඕනි ගරු අමාත්‍යතුමිය මුදල් වෙන් කළා. පොඩි පොඩි අර්බුද මතු වෙච්චි වෙලාවක්. ඒ නිසා අපට කරගන්න බැරි වුණා. අපේ ආරියදාස මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා එයත් කරදෙන ලෙස ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒ අනුව සභික දිලීන් කරුණාපාල මැතිතුමාගේ **6.37.**මෝරගල සිට පැල්පිටිය හරහා ඉද්දමල්ගොඩ මාර්ගය කාපට් කිරිම සඳහා අදාළ අංශවල අවධානය යොමු කරවා ගැනීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.38.සභික දිලීන් කරුණාපාල මැතිතුමාගේ යෝජනාව.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා.:-**
**6.38.පැල්පිටිය ගම මැදින් ආදාගල සුගත බුද්ධි විද්‍යාලය දක්වා යන මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, ආදාගල සුගත බුද්ධි විද්‍යාලය කියන්නේ දැනට ළමුන්ගේ සහභාගිත්වය පහළ යමින් තියෙන ඉස්කෝලයක්.හැබැයි මෙවර මම විශ්වාස කරන අන්දමට ඇහැලියගොඩ කොට්ඨාශයෙන් පාසල් වැසී යාමේ තර්ජනයට ලක්වෙලා තියෙන්නේ එක පාසලයි. ආදාගල පාසල ඒ තර්ජනයට ලක් වෙලා නෑ තාම. අපට ලොකු උවමනාවක් තියෙනවා, මේ පාසල් නඟා සිටුවන්න. විශේෂයෙන් අපි කීප අවස්ථාවක් ම සාකච්ඡා කරා මෙම ආදාගල සුගත බුද්ධි විද්‍යාලය, කලින් රජයේ ප්‍රතිපත්තියක් තිබ්බා ඉංග්‍රීසි භාෂාවෙන් පළවෙනි වසර ආරම්භ කිරීමේ පාසල් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. නමුත් මම දන්නේ නෑ මෙවර ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඒ සඳහා කොහොමද ප්‍රතිපාදන වෙන් වෙන්නේ කියලා. අපේ ගමේ අයගෙත් විශ්වාසයක් තියෙනවා, ඇහැලියගොඩ කොට්ඨාසයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රාථමික විද්‍යාලයක් ආරම්භ කරනවනම්, ඒ ප්‍රමුඛතාව ආදාගල සුගත බුද්ධි විද්‍යාලයට ලබා දෙන්න කියලා. මොකද ඒ පාසල නගා සිටුවන්න නම් ,ඒ වගේ විකල්ප යෝජනාවක් ලබා දෙන්න සිද්ධ වෙනවා.මොකද අපිට පුළුවන් නම් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රාථමික විද්‍යාල ආරම්භ කරන,මේක හොඳ සම්පත් තියෙන පාසලක්.එහෙම ඉංග්‍රීසි මාධ්‍යෙයන් පාසල් ආරම්භ කරනව නම්, අපට පුළුවන් අද ගොඩක් වෙලාවට ප්‍රවණතාවය තියෙන්නේ,දෙමව්පියන්ගේ ප්‍රමුඛතාවය තියෙන්නේ දරුවන් ඉංග්‍රීසි මාධ්‍ය පාසල් වලට ඇතුලත් කර ගැනීමට. අපි දැක්කා මෑත කාලයේදී දන්දෙනිය ප්‍රදේශයේ ලයිසියම් සමාගමට අයිති පාසලක් ආරම්භ කළා. ඒ සඳහා විශාල ප්‍රමාණයක් ඇදිලා යනවා. ඒ කියන්නේ අනාගතයේදී ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය , උඩුමත්ත විද්‍යාලය ,බෝපැත්ත විජේනායක විද්‍යාලය ,තොරණගොඩ විද්‍යාලය සඳහා පළමු වසරට ළමුන් ඇතුලත් කිරීමේ ළමුන් සංඛ්‍යාව අඩු වෙන්න ඉඩකඩ තියෙනවා, මේ ලයිසියම් පාසල ආරම්භ කිරීමත් සමඟ. අවිස්සාවේල්ල, රත්නපුර, කුරුවිට දැන් ඒවා පටන් අරගෙන ඉවරයි.හැබැයි අපිට රජයක් විදිහට නැත්නම් ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් විදිහට ඉංග්‍රීසි මාධ්‍යයේ ප්‍රාථමික පාසල් ආරම්භ කරන්න පුළුවන්කමක් තියෙනවනම් මේක හොඳ අවස්ථාවක් කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා කවදා හරි ඒ සඳහා ප්‍රතිපත්ති තීරණයක් ගත්තොත් මේ පාසල සඳහා ප්‍රවේශ මාර්ගයක් අවශ්‍ය වෙනවා. ඒ ප්‍රවේශ මාර්ගය ලබාදීම සඳහා උනන්දු වන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා:-**

බොහොම ස්තුතියි.අධ්‍යාපනය ගැන කියපු නිසා කියන්නේ. 2026 ජනවාරි ඉදන් ප්‍රතිසංස්කරණය හදලා තියෙන්නේ. එතෙන්දි මේ වන විටත් ඩේටා බේස් එක හදලා ඉවරයි. 2026 ජනවාරි මාසයේ ප්‍රාථමික ළමයි, පළමු වසරට ඇතුළත් කරන ළමයින්ගේ ඩේටා බේස් එකක්, එයාලා ඉන්න තැන. පළවෙනි වතාවට ඒක කරන්නේ. එතන ඉදන් කිලෝමීටර් තුනක් හතරක් ඇතුළත අනිවාර්යයෙන්ම ඒ ළමයට ජාතික පාසලක් හෝ ඒ හා සමාන ළමයි අනුව යන්න පුළුවන් කිලෝමීටර් තුනක් හතරක් ඇතුළත අනිවාර්යයෙන්ම ජාතික මට්ටමේ පාසලක්. සමහරවිට ඒක ඇතුළත් වෙනකොට සමහර පාසල් වැහෙන්න පුළුවන්. පාසල් වහන කතාවක් නෑ.පාසල් වහන කතාවක් ගෙනාවේ නෑ.ඔය පාසල වහන කතාවක් නෙවෙයි.සාමාන්‍යයෙන් මාහර පාසල ගත්තොත් ළමයි සීමිත ප්‍රමාණයක් එන්නේ. බටහිර කලටුවාව පාසලක් තියෙනවා ,ළමයි හතරයි ගුරුවරු නමයයි ඉන්නේ. මේකේ ඒවා ලොකු වෙනස්කම් ටිකක් තියෙනවා.විශේෂයෙන් අධ්‍යාපනයේ ලොකු වෙනස්කම් ටිකක් එන අවුරුද්දේ ඉදන් තියෙනවා. සමහරවිට අපට මේවා වෙනස් වෙයි කියලා හිතෙනවා.

ඒ අනුව සභික දිලීන් කරුණාපාලමන්ත්‍රීතුමාගේ **6.38.**පැල්පිටිය ගම මැදින් ආදාගල සුගත බුද්ධි විද්‍යාලය දක්වා යන මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීම යෝජනා මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.39.සභික ආර් වත්සලා නිශාන්ති ධනරත්නමැතිතුමියගේ යෝජනාව

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය.:-**
**6.39.බෝපැත්ත ඇඟලුම් කම්හල පිටුපස බුදු මැදුර දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට සුදුසු බවට යෝජනා කරමි.**

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි,මේ මාර්ගයේ, මං හිතන්නේ මේකේ පදිංචිම වෙලා ඉන්න ගම් කාරයෝ ඉන්නේ පවුල් පහක් විතර. ඉතිරි හැමෝම අලුතෙන් ගිහිල්ල පදිංචි වෙච්චි අය ඉන්නේ. මං හිතන්නේ බෝපැත්ත ගමේ තියෙන අබලන් ම මාර්ගය වෙන්න ඇති. මේ වෙනකොට මං හිතන්නේ. මගේ නිවස තියෙන්නත් එහේ. අපේ සංවර්ධන සැලැස්ම සකස් කරන කොට , අපේ ගයනි මන්ත්‍රීතුමිය දන්නවා ප්‍රතිලාභයෙක් විදිහට රැස්වීමට සහභාගී වෙන්නේ මම දැන් අවුරුදු දහයක විතර ඉදන්. සියලු රැස්වීම්වලට ගිහිල්ලා මේ පාර සංවර්ධනය කරලා දෙන්න කියලා යෝජනා කරනවා.මොකද මම ඒ ප්‍රදේශයට ගිහිල්ල අවුරුදු 15 වගේ.මේ වෙනකොට ඒ ගමේ පාරවල් හැදුනේ මගේ යෝජනාවන් වලට පමණයි.මොකද යන්න පුළුවන් හැම තැනකම ගිහිල්ල ලක්ෂ පහ, ලක්ෂය වගේ අරගෙන තමයි. මොකද පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිණියයි හිටපු වාසුදේව නානයක්කාර ඇමතිතුමයි තමයි අපට මේ පාර ගොඩක් සංවර්ධනය කරන්න මුදල් එකතු කරලා දුන්නේ. ඉතින් මෙතනදී ලක්ෂ විස්සක් වගේ යනවා මේ පාර සංවර්ධනය කිරීමට. නමුත් ටිකෙන් ටික සංවර්ධනය කරගෙන යනකොට කිහිප වරක් ලක්ෂ පහක් වගේ හිටපු පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිණියගේ මුදල් ප්‍රතිපාදන වලින් කරගත්තා. ලක්ෂ පහක් වගේ දැනට ප්‍රාදේශීය සභාවේ, මං හිතන්නේ ලක්ෂ පහකට අඩු ව්‍යාපෘති තමයි කියාත්මක වෙන්නේ. මෙම තැනට ගිහිල්ල බැලුවොත් පයින් වත් යන්න බෑ. වැහි කාලෙට පයින්වත් යන්න බැරි මාර්ගයක්. ලක්ෂ පහකට අඩු ව්‍යාපෘති අපට දෙන හින්දා, මේ ගැන ලොකු අවධානයක් යොමුකරලා මේකට ලක්ෂ පහක්වත් වෙන් කරල දීල ටිකින් ටික හරි පාර හදල දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය.:-**
ගරු සභාපතිතුමනි,වත්සලා මන්ත්‍රීතුමිය තනියෙන් යෝජනා ගේන්න අවශ්‍යතාවයක් නෑ. ග්‍රාමීය කමිටුවක් විදිහට ගමේ යෝජනා අරගෙන සංවර්ධනය කරන සැලැස්මක් හදල ඉවරයි. ගමක් විදිහට අපි ගොඩනැගෙන්න ඕන තැනකට. ග්‍රාමීය සංවර්ධන සැලැස්ම හදලා ඉවරයි. ඒකෙ තිබූ ප්‍රමුඛතා ලිස්ට් එකේ තියෙන පාරක් තමයි ඒ පාර. මං ඒ පාර සංවර්ධනය කළ යුතුයි කියන තැනඉන්නවා. ප්‍රතිලාභීන් වැඩි පිරිසක් ඒ පාර භාවිතා කරනවා.මං හිතනවා ඒක දුටු පාරක් සංවර්ධනය කරන්න

ඒ අනුව සභික ආර් වත්සලා නිශාන්ති ධනරත්න මැතිතුමියගේ**6.39.**බෝපැත්ත ඇගලුම් කම්හල පිටුපස බුදු මැදුර දක්වා මාර්ගය සංවර්ධනය කිරිම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.40.සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියගේ යෝජනාව.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය -**
**6.40.** **බේරුවාන නව නිවාස ලබා දුන් ප්‍රදේශයට ජලය ලබා දිමට (ජල නල මඟින්) යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය -**
ගරු සභාපතිතුමනි, මං හිතන්නේ ප්‍රාදේශීය ලේකම්කාරයාගේ එහා පැත්තේ අයට තමයි අපි මේ නිවාසය ඉදිකරේ. මේ වෙනකොට පවුල් විසිපහක් විතර පදිංචි වෙලා ඉන්නවා. දැනට ජලය ලබා දෙන්නේ ජල බවුසර් මඟින්. මේ කාලය වන විටමං හිතන්නේ ඊයෙත් දවසෙත් මට කෝල් කරලා කෙනෙක් ඇහුවා, මෙහෙට වතුර නෑ කොහොමද අපිගන්නෙ කියලා. මේ වෙනකොට මං හිතන්නෙ ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා ඔබතුමා තමයි ඒ පැත්තට ජල බවුසර් මගින් ජලය ගෙනිහින් දීල තිබුණේ.මං කිවුවා

ඔබතුමා දැනුවත් කරන්න කියලා.අපට පුළුවන් නම් අර රුපියල් දාහක වගේ මුදලකට අලුත් ප්‍රතිලාභීන් තෝරගෙන ජලය ලබාදෙන කියන යෝජනාවට හරි ගිහිල්ලාජලනල මගින් ජලය ලබාදෙන්න පුළුවන්නම් සුදුසුයි. ඒ වගේ ම මම මෙතැන දී යෝජනා කරනවා අපි ඒක අනුමත කරගත් 1000 ක් වන මුදල නැතුව හරි කමක් නෑ, මොකද ඉතාදුගී මට්ටමේ ඉන්න පිරිසක් තමයි එතැන පදිංචි වෙලා ඉන්නේ. ඒ අවස්ථාව ලබා දෙන්න කියලා යෝජනා කරනවා

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, බේරුවාන නිවාස යෝජනා ක්‍රමයේ ගොඩක් ඉන්නේ අපේ සෞඛ්‍ය කම්කරුවන්.එලදායිතාව ඉතාම වැදගත්. වැඩ කරලා ගිහිල්ල ඇත්තටම ඒගොල්ලො අසීරු තාවයකට පත්වන නිසා ඒ සම්බන්ධව අපි ඉතාමත් ඉක්මනින් ක්‍රියාමාර්ගයක් විදියට එතැනට ඇත්තමේන්තුවක් හදල, එතන තියෙන ඇලමාර්ගයක් හරස් කරලා ටැංකියක් හදල, ඒ ටැංකියෙන් ළිඳට වතුර ගන්න ඇස්තමේන්තු හදල ඒක අනුමත කරගෙන තියෙන්නේ මන්ත්‍රීතුමිය.ඒක කඩිනමින් කරන්න පුළුවන් වුණොත් ඒ අයගේ ජල ප්‍රශ්නය අපට විසඳ ගන්න පුළුවන්. ඇත්තටම ප්‍රධාන හේතුව බේරුවාන හා ගැටහැත්ත ජලය යෝජනා ක්‍රම දෙකේම ළිං දැන්,ළිං වල තියෙන භූගත ජල මට්ටම අඩු වෙමින් යන්නෙ. මොකද සාමාන්‍යයෙන් ඇහැලිගොඩ කියන්නේ හැමදාම වහින පැත්තක්. නමුත් භූගත ජලය එක් රැස්වෙලා තියෙන්නේ නැතිඒකට ප්‍රධාන හේතුවක් තමයි, කතාව වෙන පැත්තකට ගෙනියනව නෙමෙයි බැකෝ පතල්වලින් කරන හානිය සැහෙන හානියක් මේක ඇහැළියගොඩ ප්‍රාදේශිය සභාවේ තියෙන ජලය යෝජනා ක්‍රම තුනෙන් දෙකකම දැන් ජලය අඩුවෙලා තියෙනවා. එතන තියෙන ගැටලු බැලුවොත් එහෙම හරියටම ජල යෝජනා ක්‍රම දෙකේ ළිං වටේටම බැකෝ පතල්.රජයක් විදිහට මේකට දේශපාලන තීන්දුවක් ගත යුතුයි. ඒ සම්බන්ධව ජනතාවත් අවදි කරගත යුතුයි. මෙතුමියගේ යෝජනාව මේ වන විට සභාවෙන් ක්‍රියාත්මක වෙමින් යනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, අපේ කසල කළමනාකරණයට දායකවන පිරිස තමයි එතන නියෝජනය කරන්නේ ඒ නිවාස යෝජනා ක්‍රමය තුළ.මං හිතන්නේ පෝය දවසෙත් වතුර තිබුනෙ නෑ. ඊට අමතරව දවසකට වතුර ලීටර් 3000 ක් වගේ ප්‍රමාණයක් තමයි දවසකට සපයන්නේ. ඒක ප්‍රමාණවත් නෑ. ඒ මිනිසුන්ට. ඒක තව වැඩි කරන්න පුළුවන් නම්, මායි දිලීම් මන්ත්‍රීතුමයි මිස්බාහ් මන්ත්‍රීතුමයි එතන නිරීක්ෂණ චාරිකාවක යෙදුණා. ඒ ප්‍රදේශයෙක් ඒක ලොකු ගැටළුවක් වෙලා තියෙනවා ඒ ජල ප්‍රශ්නය. ඒ නිසා ඒකට කඩිනම්ව මැදිහත් වෙලා දෙන වතුර ප්‍රමාණය වැඩි කරන්න පුළුවන් නම් හොඳයි තාවකාලිකව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන තෙක්,ලබා දෙන වතුර ප්‍රමාණය වැඩි කරන්න පුළුවන්නම් කාලෝචිතයි. අනිත් එක අඛණ්ඩව ඒ ජල සැපයුම ලබාදෙන්න පුළුවන් නම් හොඳයි.පරිසර තත්ත්වයත් එක්ක.මොකද පෝය දවසෙත් වතුර තිබුනෙත් නෑ.

**සභාපතිතුමා :-**
ලේකම්තුමාගේ පත්වීම ලැබිල දින කීපයයි, මෙතන ගොඩක් ඒ කට්ටිය ඇවිල්ල වට කරගෙන හිටියා. මේ ප්‍රශ්නය කතා කන්න. පස්සෙ මං මැදිහත් වුණා. ලේකම්තුමත් කාර්මික නිලධාරීතුමත් උපසභාපතිතුමත් අපි කවුරුත් එක්ක ගිහිල්ල නිරීක්ෂණය කළා. ඇත්තටම ඒ තිබ්බ්ව ළිඳ ඇත්තටම වතුර දෙන්න බැරිකම නෙමේ, වතුර නෑ. අන්න ඒක තමයි මන්ත්‍රීතුමිය රුපියල් 1000 ක් අරන් දෙනවා කිවුවේ,ජලය නෑ.වෝටර් බෝඩ් එකෙන්වත් එක අවිස්සාවෙල්ලේ ඉඳන් එන එකෙන් දෙන්නෑ. ඒගොල්ලන්ගේත් ධාරිතාව එච්චරයි කියල. ඉතින් මේකට තමයි විකල්ප දෙකයි තියෙන්නේ.එකක් තමයි අපි ඉස්සෙල්ලා කියපු ඒවා.අනික තමයි හදිසි යෝජනාවක් හැටියට මං හිතන්නේ සුජීව මන්ත්‍රීතුමත් හිටියා අපි යෝජනා කර ගත්තා මුදල් කමිටුවේ දී ,එතන අපි එකක් අඳුර ගත්තා එතන වතුර පාරක් අපතේ යනවා එතනින්වත් දැනට ඒ ගොල්ලන්ට වතුර දෙන්න.ඒකට පොඩි ගාණක් යනවා.ඒකට අපට ලක්ෂ දෙකයි ගානක් වගේ යනවා ඉදිරියට අපි අද හෙටම හදල ඒගොල්ලන්ට තාවකාලිකව හරි වතුර ටික දෙන්න හදනවා. ඒක හැකි ඉක්මනින් ඒ වැඩේ කරනවා.

ඒ අනුව සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියගේ**6.40.**බේරුවාන නව නිවාස ලබා දුන් ප්‍රදේශයට ජලය ලබා දීම (ජලනල මගින්) යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.41.සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියගේ යෝජනාව

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය :-**
**6.41.බේරුවාන කසල අංගනයට යන මාර්ගය සංවර්ධනය කිරිම.**

**සභික ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය :-**
ගරු සභාපතිතුමනි බේරුවාන කසල අංගනයට යන මාර්ගය සංවර්ධනය කිරීමට විශාලමුදලක් වැය වෙනවා.දැනට අපේ ට්‍රැක්ටර් ටික යන්නෙ බෝපැත්ත කනත්ත ගාවින් දාලා එතන පල්ලෙන්. ඒ යන අතර පාලමත් එක්ක එතන වංගුව ගන්නකොට කුණු එතන ගොඩක් වැටෙනව.එතන තියෙන පාර එකපාරට වාහනයක් එහෙම හරවලා ගන්න අමාරු මට්ටමක් තියෙනව. මං හිතන්නේ සංවර්ධනය කරනවා කියන එක දැනට පාර කොන්ක්‍රීට් කරනව නෙමේ පොඩ්ඩක් අපට පාර පළල් කරගන්න පුලුවන්නම් මේක මගහරවා ගන්න පුලුවන් ඒක තමයි මේ යෝජනා කරන්නේ. ඒක හැකි ඉක්මනින් බලල කරන්න පුළුවන් නම් හොදයි. එතන හැමතිස්සෙම කුණු ගොඩක් හැලිලා තියෙනවා.

ඒ අනුව සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියගේ **6.41.**බේරුවාන කසල අංගනයට යන මාර්ගය සංවර්ධනය කිරිම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

6.42.සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමාගේ යෝජනාව

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
**6.42.පදික හුවමාරු පැහැදිලිව පෙනෙන ලෙස ඇහැලියගොඩ නගරයේ පදික හුවමාරු වන ස්ථාන හය (6) ආශ්‍රිතව විදුලි පහන් සවි කිරීම සුදුසු බවට විදුලිබල මණ්ඩලය වෙත දන්වා යැවීමටත්, පදික මාරුවේ රාත්‍රියට විදුලි පරාවර්ථනය වන සේ දිස්වන කැට සවි කිරීමටත් යෝජනා කරමි.**

**සභික එච්.එස්.එල්.දීපාල් මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇහැළියගොඩ විශේෂ ස්ථාන හයක් පදික මාරු ලෙස වෙන්වෙලා තියෙනවා. මං හිතන්නේ රාත්‍රී කාලයේ ඒ ස්ථාන නිසියාකාරව දිස්නය වෙන් නෑ.පේන්නේ නෑ. විශේෂයෙන් විදුලිය ඒ ස්ථානවල අඩුයි පේන්නෑ.මේක අත්දැකීමක් වශයෙන් කියන්නේ,මේක ලඟදි මටත් වුණා. මං හිතනවා ඒක විදුලිබල මණ්ඩලයට දන්වලා ඔබතුමාට ඒක ලේසියෙන්ම කරගන්න පුළුවන් වෙයි. ඒ ස්ථානවල විශේෂයෙන් විදුලි පහනක් දැල්වීමට අවශ්‍ය කටයුතුකරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමින්. ඒත් එක්කම අපි දැකල තියනවා කොළඹ යන කොට පාරේ පදික හුවමාරු ස්ථානවල දිලිසෙන කැට වර්ගයක් අල්ලලා තියෙනවා.රථයේ යද්දිත් දුරදීම එම ස්ථාන හඳුනාගන්න පුළුවන්. මං හිතනවා අපට සභාවෙන් ඒ දේ කරන්න බැරි නම් කුමන හෝ තැනකට යොමු කරලා, ඒක ඒ කටයුත්ත කරල දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා :**
සුමිත් මන්ත්‍රී, ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා තියෙන්නෙ. මාර්ගස්ථ අධිකාරියත් එක්ක ඒ සම්බන්ධයෙන් ළඟදී ආපුබිමල් ඇමතිතුමා සහභාගී වෙච්චඅවස්ථාවට මමත් සහභාගි වුණා. ඒකත් අනුමත වෙලා තිබුණා. අපේ පාසල ඉස්සරහසංඥා විදුලි සංඥා . නමුත් ඒක මනින්න ආපුවහම ඒක සවි කරන්නවෙන්නෙ පන්සලේ, ස්වාමීන් වහන්සේගේ විරුද්ධත්වයත් එක්ක ඒක අවලංගු කරන්න සිදුවුණා කියල තමයි කිව්වේ.ඔබතුමා කිව්ව වගේ අඳුරගත්ත හයක් තියෙනවා කිව්ව ඒ ටික ලිඛිතව මට ලබා දෙන්න. අපිට ඒක සාකච්ඡා කරන්න පුළුවන් සමහර තැන්වල. අපිත් යෝජනා කළා ඒ ගොල්ලෝ නිරීක්ෂණයක් කරලා තියෙනවා, සමහර විදුලි සංඥා තියෙන තැන්වල පදිකමාරු වන තැන්වල සමහර වෙලාවට ට්‍රැෆික් එක වැඩි වන තැනුත්. ඒක ඒගොල්ලන්ට අපි දුන්නහම ඒගොල්ලෝ ඒක නිරීක්ෂණය කරනවා, මාස ගානක් මටත් දැඩි උවමනාවක් තියෙනවා ඇහැලියගොඩ ඒ සම්බන්ධව ප්‍රෙච්ශ වෙන්න.මන්ත්‍රීතුමා ළඟ තියෙන ඒ ගැන ඒ හඳුනාගත් හය මට දැනුවත් කරන්න.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කියපු හින්ද කිව්වෙ පන්සලෙයි පල්ලියෙයිබැමි දෙක නිසා ප්‍රධාන පාර අවහිර වෙලා තියෙනවා. ඔබතුමාගේ ආණ්ඩුවෙන් ඒ සඳහා මොකක් හරි ක්‍රියාමාර්ග සැලසුම් කරලා තියෙනවද? නැත්නම් පාර පුළුල් කිරීමට මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගන්නව?ද නැත්නම් මේක දිගින් දිගටම ඇදිලා යන ප්‍රශ්නයක් මේක.උදේ පාන්දර කීයට ආවත් වැඩක් නෑ මේ බැමි දෙක හින්ද අවහිර වෙලා තියෙන මාර්ග හින්ද දැඩි රථ වාහන තදබදයක් ඇතිවෙලා තියෙනවා.අපි ආගම අදහන්න ඕන. ආගම් පිළිපදින්න ඕන. හැබැයි එතනින් අපි දැනගන්න ඕන මේන ජනතාවට ප්‍රශ්නයක් නොවෙන්නඑහා මෙහා යන්න. ඒ අවස්ථාව ලබා දෙන්න. ඒක මිනිසුන්ගේ මූලික අයිතිවාසිකමක්. ඒ සඳහාමොකුත් ක්‍රියාමාර්ගයක් අරන් තියෙනවාද කියලාපැහැදිලි කිරීමක් කරන්න.

**සභාපතිතුමා :-**
ඇත්තටම ඒක හොඳ ප්‍රශ්නයක් කළේ.ගිය මාසේ විසි හය වෙනද ඇමතිතුමා හම්බෙන්න ගිහාමෙ,අපි යෝජනා තුනක් දැම්මා.එකක් තමයි අවිස්සාවේල්ල සිට රත්නපුර දක්වා මාර්ගයේ මන්තීරු හතරක් දක්වා යන්න. අනිත් එක තමයිපළතුරු කඩේ ඉස්සරහ තියෙන මුස්ලිම් පල්ලියත් ඇහැලියගොඩ පන්සලේ එකක්,ඇත්තටම මේක මං තීරු හතරක් හැදුවොත් ලොකුවට එනවා.නමුත් එකපාරටම පටු වුණහම ඇත්තටම දුෂ්කරයි.අපිත් බෞද්ධයො තමා. නමුත් අපි ඒක ඇමතිතුමාට යෝජනා කරලා තියෙන්නේ, මේ වෙනකොට. මේකත් එක්ක ඉස්සරහට අපිට ගැටලු එයි.ඇත්තටම ඒක කරන්න ඕන යෝජනාවක්.ඇත්තටම මාත් එක්ක අනිත් පැත්තෙ හිටිය ප්‍රාදේශීය ලේකම්තුමිය. ලේකම්තුමිය දන්නවා යෝජනා තුනක් යෝජනා කරා, යෝජනා දෙකක් තමයි ඒ යෝජනා දෙක. ඉතිරි එක තමයි ප්‍රධාන මාර්ගයේ ඉඳන් ඉඩංගොඩ දක්වා යනකොට ඔයගොල්ලෝ දන්නවා විශේෂයෙන් ම සුජීව මන්ත්‍රීතුමන්ලගේ එතන පාර පටුවෙලා තියෙනවා. ඊළඟ එක තමා කන්ද උඩ පාර පටු වෙලා තියෙනවා.ඔන්න ඔය දෙක.ඒවගෙ ප්‍රශ්නයක් නෑ. ඒගොල්ලෝ නඩු දාල තියෙනව. නඩුවෙන් දිනල තියනව. මං ඒගොල්ලන්ට කිව්වා හැකි ඉක්මනින් ඒ දෙක පළල් කරල දෙන්න කියලා.ඔය යෝජනා තුන මං ඉදිරිපත් කළා. අපි බලමු.අපි ලොකු උත්සාහයක් දරනවා ඒ ටික සාර්ථකව කරගන්න.

ඒ අනුව සභිකඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමාගේ **6.42.** පදික හුවමාරු පැහැදිලිව පෙනෙන ලෙස ඇහැලියගොඩ නගරයේ පදික හුවමාරු වන ස්ථාන හය (6) ආශ්‍රිතව විදුලි පහන් සවි කිරීම සුදුසු බවට විදුලිබල මණ්ඩලය වෙත දන්වා යැවීමටත්, පදික මාරුවේ රාත්‍රියට විදුලි පරාවර්ථනය වන සේ දිස්වන කැට සවි කිරීමටත් යෝජනා වූ යෝජනාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.43.සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා :-**
**6.43. කපු ඇපල වත්ත හරහා පොඩි පොල්වත්ත මාර්ගය කපා සංවර්ධනය කිරීමට මම යෝජනා කරමි.**

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,හිඳුරංගල ජයසේකර මන්ත්‍රීතුමාගේ නිවස අසලින් යන මාර්ගය, ඉස්සර ප්‍රාදේශිය සභාවේ අපේ කිරිඇල්ල රත්නායක සභාපතිතුමා හදල නැවැත්තුවා.(පැහැදිලියි මදි) ඒ ව්‍යාපාරිකයා හදන්න දුන්නැ පාර.එතනින් ඉදිරියටගෙවල් විසි පහක් පමණ තියෙනවා. සාමාන්‍යයෙන් ආදාහනාගාරයක් වගේ මිනී වළදාපු තැනකුත් තියෙනවා. මම යෝජනා කරනවා ඔබතුමාට එතෙන්ට ගිහිල්ල නිරීක්ෂණයක් කරන්න කියල. ජයසේකර මන්ත්‍රීතුමාටත් කියනවා. මේ මාර්ගය මීටර් 300ක් විතර තමා අල්ලලා තියෙන්නේ ගේට්ටු දාලා.ඒක හදල දෙන්න කියල තමයි මම යෝජනා කරන්නෙ.

ඒ අනුව සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ **6.43.**කපු ඇපල වත්ත හරහා පොඩි පොල්වත්ත මාර්ගය කපා සංවර්ධනය කිරිම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.44.සභිකඑච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා :-**
**6.44. දොලපල්ල සමන්ත මහතාගේ ගේ අසල සිට නිමල් මහතාගේ ගේ දක්වා කොන්ක්‍රට් කිරිමට කිරිමට මම යෝජනා කරමි.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, ගෙවල් දොළහක් වගේ තියෙනවා. ගල් පොත්තක් උඩින් යන්න තියෙන්නෙ.ඒ ගල පල්ලෙහාට මිනිස්සු වැටිලත් තියෙනවා.මීටර් සීයක් වගේ ප්‍රමාණයක් තමයි තියෙන්නේ. ඒක හදල දෙන්න කියල තමයි මම යෝජනා කරන්නෙ.

ඒ අනුව සභිකඑච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ **6.44.**දොලපල්ල සමන්ත මහතාගේ ගේ අසල සිට නිමල් මහතාගේ ගේ දක්වා කොන්ක්‍රට් කිරිම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.45.සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා :-**
**6.45. ගොබරගල වත්ත උඩ කොටස මාර්ගය ගයාන්ගේ ගේ දක්වාකොන්ක්‍රිට් කිරිමටමමයෝජනාකරමි.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයට අයත් වන තැනක් මේක. ගෙවල් විසි පහක් තිහක් තියෙනවා. සාමාන්‍යයෙන් ලෙඩෙකුටවත් ත්‍රීවිල් එකක යන්න අමාරුයි.දැනට එම මාර්ගය ඒ ගොල්ලෝ අතින් මීටර් දෙසීයක් විතර හදන්න යොදා ගෙන තියෙනවා.මමත් ඒ සඳහා වැල් කියුබ් පහක් දීල තියෙනවා මේකට.තව කියුබ් අටක් ලැබිල තියෙනවා.පුළුවන් නම් එම මාර්ගය හදල දෙන්න කියල තමයි මම යෝජනා කරන්නේ. ප්‍රතිපාදනයක් වෙන් කරන්න පුළුවන් නම් හොඳයි.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, (පැහැදිලි නෑ) අපේ ග්‍රාම සංවර්ධන කමිටුවේ යෝජනාවලට මේ පාර ඇතුළත් වෙලා තියෙනවා. මේ පාර, මේ පාරෙ කොටසක් මෙතුමා සඳහන් කළා වගේ ගමේ පිරිස විසින්මකොන්ක්‍රීට් ගල් වැලි එකතු කරගෙන තියෙනවා, ස්වේච්ඡාවෙන්ම ශ්‍රමදායකත්වය දාලා යම් කොටසක් හරි කොන්ක්‍රීට් කරගන්න. මම අතුරු යෝජනාවක් වශයෙන් මේ සභාවට යෝජනාවක් දානවා,සභාවේ අනුමැතිය අරගෙන භ යම් හැකියාවක් තියෙනවනම්, ඊට අවශ්‍ය සිමෙන්ති ටික ලබා ගන්න යම් උපකාරයක් කරන්න පුළුවන්නම් තත්ත්වයක් තියෙනවනම් ඒක සුදුසුයි කියලා.

**සභාපතිතුමා :-**
අපිට යෝජනාවක් දෙන්න මන්ත්‍රීතුමන්ලා.හැකියාවක්තියෙනව නම්,අපි දියවෙල්ලට අපි සිමෙන්ති ලබා දුන්නා.ඒ වගේ ලිඛිත ඉල්ලීමක් කරන්න ඕන. අපිට මුදල් කමිටුවෙන් ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

ඒ අනුව සභිකඑච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ **6.45.**ගොබරගල වත්ත උඩ කොටස මාර්ගය ගයාන්ගේ ගේ දක්වා කොන්ක්‍රිට් කිරිම යෝජනාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා-**
6.46.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.46.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ලේකම් වශයෙන් කටයුතු කල T.R.C.K.ගුණසේකර මහතා මේ වන විට බුලත්කොහුපිටිය ප්‍රාදේශිය සභාව වෙත ස්ථාන මාරුවක් ලබා ඇති බැවින් මෙතෙක් චෙක්පත්හි පලමු අත්සන්කරු ලෙස කටයුතු කළ T.R.C.K.ගුණසේකර මහතාගේ අත්සන අවලංගු කර,ඒ වෙනුවට 2025.08.18 දින සිට ප්‍රාදේශිය සභා අරමුදලෙන් වියදම් දැරීමෙන් පසු ගෙවීම් කිරිමේදි චෙක්පතෙහි පලමු**

**අත්සන්කරු ලෙස කටයුතු කිරීමට නව ලේකම්තුමන් වන දැල බුද්ධසිංහ මනෝජ් තිවංක මහතා වෙත බලය පැවරීමට යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභිකදිලීන් කරුණාපාලමැතිතුමා "-**
ගරු සභාපතිතුමනි, මේ ලේකම්තුමා සම්බන්ධ වන පළවෙනි සභාව වාරය. එතුමාගේ අත්සනත් එක්ක අපේ සභාවේ ආදායම් වැඩි කරලා, අපේ ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා ඒ අත්සන භාවිතා කරන්න අපි සුබ පතනවා.

**සභාපතිතුමා :-**
අපි සියලු දෙනාගේම ප්‍රාර්ථනය එයයි. දක්ෂ නිලධාරීතුමෙක්.ඒ වගේම කාර්යශූර සෙනසුරාද ඉරිදා කියලා බලන්නෙවත් නෑ එතුමා. මේ ස්ථානයට ඇවිල්ල අවශ්‍ය තැන් වල ස්ථානීය පරීක්ෂණ වලට යනවා.අපි බලාපොරොත්තු වෙනවා,වැඩා දුරකුත් නැති නිසා,තමන්ගේ ප්‍රදේශයේ නිසා අපට උපරිම සහයෝගය ලබාදෙයි කියලා.පළාත් පාලන ආයතනවල ,සභාවල සේවය කර නැතත් එතුමා රාජ්‍ය සේවයේ සෑහෙන කාලයක් සේවය කර නිලධාරියෙක් ලෙස.

ඒ අනුව .සභාපතිතුමාගේ **6.46.**ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ලේකම් වශයෙන් කටයුතු කල T.R.C.K. ගුණසේකර මහතා මේ වන විට බුලත්කොහුපිටිය ප්‍රාදේශිය සභාව වෙත ස්ථාන මාරුවක් ලබා ඇති බැවින් මෙතෙක් චෙක්පත්හි පලමු අත්සන්කරු ලෙස කටයුතු කළ T.R.C.K. ගුණසේකර මහතාගේ අත්සන අවලංගු කර,ඒ වෙනුවට 2025.08.18 දින සිට ප්‍රාදේශිය සභා අරමුදලෙන් වියදම් දැරීමෙන් පසු ගෙවීම් කිරීමේදි චෙක්පතෙහි පලමු අත්සන්කරු ලෙස කටයුතු කිරීමට නව ලේකම්තුමන් වන දැල බුද්ධසිංහ මනෝජ් තිවංක මහතා වෙත බලය පැවරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.47.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.47.** ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය රාජකාරී කටයුතු ඉටු කිරිමේ දී ප්‍රමාණවත් **නොවන බැවින් පහත සඳහන් තනතුරු බඳවා ගැනිමේ සුදුසුකම් අනුව PL-1 කාණ්ඩයේ වැටුපක් ගෙවීම මත සේවා ගිවිසුම් යටතේ බඳවා ගැනිම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**
**මුරකරු-04**
**පුස්තකාල සහයක-01**
වැඩ ක්ෂේත්‍ර කම්කරු**- 06**
ආදාහනාගාර භාරකරු**-01**
ආදාහනාගාර ක්‍රියාකරු**-01**
ආදාහනාගාර ක්‍රියාකරු සහයක **-01**
ජලනල වැද්දුම් ශිලපීන්**-01**
ට්‍රැක්ටර් රියදුරු **-01**

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, අපි වැඩ කරගෙන යනකොට අපිට කාර්ය මණ්ඩලය අවශ්‍යයි. අපි සහයෝගය ලබාදෙනවා. එතකොට මොනව හරි ඒ බඳවා ගැනීම සම්බන්ධව අනුගමනය කරන වැඩපිළිවෙළ ගැන දැනුවත් කිරීමට අවශ්‍යයි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මහා සභාව කාරක සභාවක් බවට මං යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහා සභාව බවට මං යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි මේ යෝජනාව කාරක සභාවේ සාකච්ඡා කළ විදිහට අපට අවශ්‍යතාවය තියෙනවා, ප්‍රාදේශීය සභාවේ වැඩ ටික ඉක්මනට ඉක්මනට කරගන්නත් එහි කාර්යක්ෂමතාවය වැඩිකරගෙනජනතාවට සේවය කරන්නත්, ඒ හින්ද ඔබතුමාගේ යෝජනාව අනුව මේ සේවක පිරිස් අවශ්‍යතාවය මත බඳවා ගැනීමට සුදුසු යැයි අප විශ්වාස කරනවා. ඒ අනුව ඔබතුමාගේ යෝජනාවට අපිඑකඟ වෙනවා නමුත් අපිට පුළුවන් වෙයි කාලයක් යනකොට මේ සභාවේ දීර්ඝ වශයෙන් ඔවුන් සඳහා මේ බඳවාගන්නා නිලධාරීන් සඳහා ප්‍රතිපාදන වෙන් කරන්න.පුළුවන්ද බැරිද කියන කාරණාව මත, එම පත්වීම අවශ්‍ය වෙනව අනාගතයේ දී

නමුත් මේ පද්ධතියටමේ පද්ධතිය නගා සිටුවීම සඳහා අවශ්‍යාවයසලකා බලන මෙන් පද්ධතිය නගා සිටුවීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවය අවශ්‍ය අයුරින් ලබාගැනීම සඳහා අපේ එකඟතාව ලබාදෙනවා.

ඒ අනුව සභාපතිතුමාගේ **6.47.**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය රාජකාරී කටයුතු ඉටු කිරීමේ දී ප්‍රමාණවත් නොවන බැවින් පහත සඳහන් තනතුරු බඳවා ගැනීමේ සුදුසුකම් අනුව PL-1කාණ්ඩයේ වැටුපක් ගෙවීම මත සේවා ගිවිසුම් යටතේ බඳවා ගැනීම සුදුසු බවට වූ යෝජනාව සේවා ගිවිසුම් මත බඳවා ගැනීමට මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.48.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.48.ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක GS/ES/6/6/LG/RCM (වෙළුම 16) හා 2025.08.110 පලාත් පාලන තොමසාරිස්ගේ අංක සීඑල්ජී/21/30 හා 2009.11.23 දිනැති ලිපිය අනුව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් ලෙස අංක 474/ඒ/1,තොරණගොඩ,ඇහැලියගොඩ ස්ථිර ලිපිනයේ පදිංචි දෙල්ගමුවලාගේ නිරෝෂන් සමීර දෙල්ගමුව මයා 2025.08.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි බඳවා ගැනීමටත්,ඒ වෙනුවෙන් ඔහුට රු.15,000.00 ක මාසික දීමනාවක් ගෙවීමටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම අපි දන්න කියන සහෝදරයෙක්. ඔබතුමාගේ ඉදිරි කටයුතු කර ගැනීම සඳහා නිලධාරියෙක් අවශ්‍යයි. මීට පෙරත් සභාපතිවරු ලේකම්වරයෙක් අරන් කටයුතු කළා.මේ වසම් 44 කියන්නේ බොහොම පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන වසම් 44 ක්.ඇත්තටම සතුටුයි. අපේ සහෝදර මන්ත්‍රීතුමියගෙ ස්වාමි පුරුෂයෙක් විදිහට,එහෙම සම්බන්ධකම් තියෙන්න ඕන.අපි අගේ කරනවා. ඔබතුමා අපට සම්බන්ධ සහෝදරයෙක් ලබා ගැනීම පිළිබඳවම.අපි ඇත්තටම සතුටු වෙනවා මොකද, එහෙම දන්න තියෙන කෙනෙක් ගත්තහම අපට වැඩ ටික කරන්න පහසු වෙනවා.අපි එතුමාට සුභ පතනවා. අපිත් එක්ක බොහොම, ඔබතුමාගේ වම් පාර්ශ්වය හා දකුණු පාර්ශ්වය කියලා ඔබතුමා අදහස් කරන විදිහටම එහෙම සද්භාවයෙන්ම, එතුමාවත් දැනුවත් කරලා අපිත් එක්කකටයුතු කරනකොට ඒ හැම දෙනාගේම අදහස් අනුව එතුමා ඔබතුමාගේ ලේකම් වුණහම අපිට ඔබතුමාව සම්බන්ධ කරගන්න අපි එතුමාට තමා කතා කරලා කියන්නේ.සභාපතිතුමා සම්බන්ධ කරලා දෙන්න මේ කටයුත්තට කියල.ඒ බවත් ඔබතුමා එතුමාව දැනුවත් කරල, අපිත් එක්කයම් විදිහකින්,කාරක සභාවකදී හරි සම්බන්ධ කර ගෙන අපටත් අපේ කටයුත්තක් සම්බන්ධව,ඒ අන්‍යෝන්‍යය අවබෝධය ඒ සහයෝගය අපි බලාපොරොත්තු වෙනවා.අපි එතුමාට සුබ පතනවා. අපිට සම්බන්ධ අපේ සහෝදරියක් ලබා ගැනීම පිළිබඳව අපි ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.මේ සභාවෙදි ඉදිරි කටයුතු කර ගැනීම සඳහා ලොකු පිටුවහලක් වෙයි.පහසුවක් වෙයි.බොහොම ස්තූතියි.

**සභාපතිතුමා :-**
ඇත්තටම මාස කීපයකට ප්‍රථම හෙවුවා,මොකද අපි නැති වෙලාවට අපි හැමවෙලාවෙම,සභාපති නැනෙ මෙතන. ඒ නිසා ජනතාව ගොඩක් වෙලාවට අපහසුතාවයට පත්වෙනවා.අනික තමයි මේ මුදලින් සාමාන්‍යයන් නේද හරි අපහසුයි නේද?රුපියල් 15000 ක් කියන්නේ.ඒක හින්ද අපිට කාලෙ ගියා.අන්තිමට තමයි එතුමා කැමැත්ත ප්‍රකාශ කළේ.

ඒ අනුව සභාපතිතුමාගේ **6.48.**ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක GS/ES/6/6/LG/RCM (වෙළුම 16) හා 2025.08.110 පලාත් පාලන තොමසාරිස්ගේ අංක සීඑල්ජී/21/30 හා 2009.11.23 දිනැති ලිපිය අනුව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් ලෙස අංක 474/ඒ/1, තොරණගොඩ, ඇහැලියගොඩ ස්ථිර ලිපිනයේ පදිංචි දෙල්ගමුවලාගේ නිරෝෂන් සමීර දෙල්ගමුව මයා 2025.08.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි බඳවා ගැනීමටත්,ඒ වෙනුවෙන් ඔහුට රු.15,000.00 ක මාසික දීමනාවක් ගෙවීමටත් වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
වේලාව ප.ව 1.08 යි.විවේක කාලය ලබාදෙනවා.
ප.ව 1.50 ට නැවත පටන් ගන්නවා.

**සභාපතිතුමා :-**
ප.ව 1.50 ට විවේක කාලයෙන් පසු සභාවේ කටයුතු නැවත පටන් ගන්නවා.

විවේක කාලයෙන් පසුව මන්ත්‍රීවරුන් දෙදෙනෙක් හදිසි අවශ්‍යතාවයක් මත සභාවටනොපැමිණෙන බව දන්වා සිටියා.අපේ ගයාෂාන් මන්ත්‍රීතුමා සහ අපේ රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා.

**සභාපතිතුමා :-**
6.49.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**

**6.49.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාල එක් විශේෂ දේපලක් හැර ඉතිරි දේපලවල තක්සේරු කටයුතු අවසන් කර ඇති බැවින් රජයේ ඉතිරි තක්සේරු මුදල වන රු.2,378,275.00 ක මුදල රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට ගෙවීමට යෝජනා කරමි.**

**මුළු තක්සේරු මුදල =රු. 2,843,275.00**
**අත්තිකාරම් මුදල =රු. 465,000.00**
**ඉතිරි තක්සේරු මුදල = රු. 2,378,275.00**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
අපේ ජාතික තක්සේරු දෙපාර්තුමේන්තුවේ අය ඇවිල්ලා,මං හිතන්නේ මාස ගානක් සැහෙන කාලයක් ඒ ගොල්ලෝ ඇවිල්ලා අපේ ඉල්ලීම මත,අපේ මේවා තක්සේරු කරලා තිබුණ් නෑ,දෙදහස් අටෙන් පස්සෙ.ජාතික තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සෑහෙන කාලෙකඉඳන් මේ දේ කළා අපි තක්සේරු කරල තිබුණේ නෑ. ජාතික තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සෑහෙන කාලෙකඉඳන් මේ දේ කළා. අපි තක්සේරු කරල තිබුණේ නෑ. පළාත් පාලන ආයතනයේ ආදායම් බදු, ඒ වගේම වරිපනම් බදු.ඒවා තක්සේරු කර ගත්තා.ඒ ගොල්ලන්ගෙ මුදල තමා මේ ගෙවන්න තියෙන්නේ.මුළු මුදල තමා රු.. 2,843,275.00.අපි ඒකෙ අත්තිකාරම් වශයෙන් ගෙවලා තියෙනවා රු. 465,000.00 ක්.තව අපි ඒ ගොල්ලන්ට දෙන්න තියෙනවා රු. 2,378,275.00ක්.ඒක තමා මේ තියෙන්නේ.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ තක්සේරු වටිනාකම අදාළ වෙන්නේ ඊළඟ අවුරුද්දෙ ඉඳන්ද අවුරුදු කීයකටද කියලා දැනගන්න අවශ්‍යයි.

**සභාපතිතුමා :-**
වසර 5 කට.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අවුරුදු 5 න් 5 ට තක්සේරුවක් යන්නේ.එතකොට මේ රු. 2,378,275.00 මුදල මේ වර්ෂය තුළම ගෙවලා ඉවර කරන්න ඕනද? නැත්නම් අපට පුළුවන් නම් වසර කීපයක් තුළ ගෙවීම් සඳහා ඉල්ලීමක් කරන්න පුළුවන්ද,කියන කාරණාව ගැන දැනගන්න අවශ්‍යයි. අයවැය ලේඛනයට දාල තියෙනව?2025 අයවැය ලේඛනයේ තියෙනවද? මේ තක්සේරු වටිනාකම.

**සභාපතිතුමා :-**
නෑ.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
නැති එකක්නේ අපිට ගෙවන්න වෙන්නේ.අයවැය ලේඛනයේ නැති එකක් තමා මේ අපිට ගෙවන්න තියෙන්නේ. අපිටඊළඟ වර්ෂයට හරි වාරික කීපයකින් හරි මේක ගෙවන්න තිබ්බොත් හොඳයි සභාවේ වැඩ ටික කර ගෙන යන්න සල්ලි මදි වෙයි.

**සභාපතිතුමා :-**
මේක ගෙවුවේ නැත්නම්, කෝටි ගානක ආදායමක් තමයි අපිට වැඩි කරල දුන්නේඒගොල්ලෝ.අපි මේ මුදල් ගෙව්වෙ නැත්නම්, ඒගොල්ලෝ අපිට අදාල තක්සේරු වාර්තාවඉදිරිපත් කරන් නෑ. ඇඩ්වාන්ස් එකක් දුන්නත් අපිට තාම දුන් නෑ. වැඩ ඉවරයි කියල කියනවා.නමුත් මේ මුදල් ගෙව්වට පස්සේ තමයිලු ඒගොල්ලෝ අපිට මේ වාර්තාව දෙන්නේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, යම් ලිඛිත ඉල්ලීමක් කරලා උත්සාහයක් කරන්න. එහෙම නොවුනොත් අපි ගෙවමු. තක්සේරු වාර්තාව අපි ගන්න ඕනනේ, ඉදිරි කටයුතු කරන්න ඔබතුමා කතා කරල වැඩ පිළිවෙලක් හදාගන්න.

**සභාපතිතුමා :-**
මේ ගොල්ලො වැඩි කරපු විදිය තියෙනවා.අපිට ඉස්සෙල්ලා මේ ගොල්ලන්ගේ ඒකක ගාන හය දහස් හාරසිය හැතෑ නවයයි.ඒ ගොල්ලො තක්සේරු කරාට පස්සේ ඒක,හත් දහස් හත්සිය හැට තුනයි.ඒක මුදල් වලින් කරනවා කියනව නම්, ඒ ගොල්ලෝ තක්සේරු කරලා තියෙනවා මුළු තක්සේරු වටිනාකම විසි අට කෝටි හතළිස් තුන් ලක්ෂ විසි හත් දහස් පන්සිය විසි තුනක්.ඒ ගොල්ලෝසම්පූර්ණ තක්සේරු කරලා තියෙන මුදල.ඒ කියන්නේ වටිනාකම.ඒකෙන් අපිට උපයා ගන්න නියමිතයි, අට කෝටි හැටනම ලක්ෂ අනූ දෙදහස් හත්සිය තිස් හතක්.ඒ ගොල්ලො ලොකු වැඩි වීමක් තමයි කරලා තියෙන්නේ.

ඒ අනුව සභාපතිතුමාගේ **6.49.**ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාල එක් විශේෂ දේපලක් හැර ඉතිරි දේපලවල තක්සේරු කටයුතු අවසන් කර ඇති බැවින් රජයේ ඉතිරි තක්සේරු මුදල වන රු.2,378,275.00 ක මුදල රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට ගෙවීමට යෝජනව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

6.50.සභාපතිතුමාගේ යෝජනාව

**සභාපතිතුමා :-**

**6.50.දරිද්‍රතාවය මත මාහර පාර වරිපනම් අංක 168/7 යටතේ අස්ගගුල දකුණ,ඇහැලියගොඩ පදිංචි A.R.නිබීෂා උම්මා මහත්මියට අයිති දේපල සහ 2024.12.31 දිනට වරිපනම් හිඟ රු.2,294.88 ක මුදල ලේඛනයෙන් ඉවත් කිරිමටත්,2025 වර්ෂයේ බිල් නොකිරිමටත් යොජනා කරමි.**

ඇත්තටම අපි මේ යෝජනාව ගෙනාවෙ මෙයාට ගෙවන්න බෑ කියලා, අඩු ආදායම්ලාභී කියල ග්‍රාම නිලධාරී සහතිකය ඒ වගේම සංවර්ධන නිලධාරී වාර්තාවත් එක්ක,ඒ තීරණයට අනුව තමයිඅපි මේක ඉදිරිපත් කරන්න තෝර ගත්තේ.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,මේ වගේ තවත් යෝජනා ආවොත් එහෙම අපි ගන්නා පියවරයන් හා උත්තර?

**සභාපතිතුමා :-**
මේක සභාව අකමැති නම් අනුමත නොකර ඉන්නත් පුළුවන් මේක. මේ ග්‍රාමසේවක අඩු ආදායම්ලාභී ලෙස දන්වලා තියෙනවා. සැමියා මියගිහිල්ල එක පුතෙක් ඉන්නව,අධ්‍යාපනය කරන එක්කෙනෙක්.ඉතින් මේක ග්‍රාම නිලධාරී සහතිකෙත්,සමෘර්ධි නියාමක සහතිකෙත්, ඒ ගොල්ලො ඉදිරිපත් කරල තමයි අපිට ආයාචනා කළේ.නමුත් සභාවට පුළුවන් අනුමත නොකර ඉන්න.අපි සභාවට යෝජනා කරනව විතරයි.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම මේක ඔබතුමා කියන විදිහට සර්ව සාධාරණ ඉල්ලීමක් වෙන්න පුළුවන් කිසිම ගැටලුවක් නෑ. ප්‍රශ්නය වෙලා තියෙන්නේ මේක අපිට වැරදි පූර්වාදර්ශයක් නොවන විදිහට මේ ගැන වැඩපිළිවෙළක් හදලා තියන්දුවක් ගමු. අපි මේකට එකඟයි.කිසි ප්‍රශ්නයක් නෑ. නමුත් වැරදි පූර්වාදර්ශයක් වුණොත්, මෙන්න මේවා තමයි අධිභාරයක් වෙන්නෙත්.මෙතන රු.2,294.88 ක් තියෙනවනේ,මුදල නෙමේ ප්‍රශ්නේ.අපි වැරදි පූර්වාදර්ශයක් නොවන විදිහටත්,නිත්‍යානුකූල ක්‍රමවේද වලටත් යටත්ව,අපි මේ වගේ දේවල් අනුමත කරනවා, අවුරුදු දහයක් පහළොවක් ගිහිල්ල අධිභාර වෙන්නේ මේවා තමා.

**සභාපතිතුමා :-**
අපි මන්ත්‍රීතුමා අපි මේක සභාවේ මේක අනුමත කරගෙනමේක අපි අනිවාර්යයෙන්ම පළාත් පාලන කොමසාරිස් මාර්ගයෙන් ආණ්ඩුකාරවරියගේ අනුමැතියෙන් පස්සෙ තමා.අපිට බෑ මේ වැඩේ කරන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා :-**
එහෙම නම් ප්‍රශ්නයක් නෑ.පවතින ආණ්ඩුකාරවරියගේ නිර්දේශ මත අපි මේ වැඩේ කරමු.

**සභිකපී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,ග්‍රාම නිලධාරී සමෘද්ධි නිලධාරීවසම්44 ම අය දැනුවත් උනොත් මේ සම්බන්ධව ඒවගේ දිළිඳු අය එව්වොත් එහෙම මොකද කරන්නේ?ඒ කියන්නේ අඩු ආදායම් ලාභී පිරිස.

**සභාපතිතුමා :-**
වරිපනම් ගෙවනවා කියන්නේ මන්ත්‍රීතුමිය, දියුණු ගම් ප්‍රදේශ කියන එකනේ. දැනට තෝරා ගන්නෙ අපි තෝර ගත්තේ නගරය අවට ප්‍රදේශ. ඒවයේ ඉතාම දිළිඳු අය ඉන්නවා.ඒ එක්කෙනෙක් තමා මේ. තීරණය සභාව සතුයි.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ න්‍යාය පත්‍රයත් කොළ තුනකට වගේ දීර්ඝ වෙලා තියෙනවා. සමහර විට ඊළඟ මාසෙ න්‍යාය පත්‍රය තව ටිකක් දීර්ඝ වෙයි, තව ඉන්නව ගොඩක් අය ගෙවා ගන්න බැරි අය.මමත් ඒ අයගෙනුත් ඉල්ලීම් අරන් ඇවිත් ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. ඒ තුළින් ආණ්ඩුකාරතුමියටත් ගොඩක් වැඩ වැඩි වෙයි.මේවා අනුමත කරන්න ගියොත්. ඒ නිසා අපි සභාවේ තීරණයක් ගමු. මේදෙදහස් ගාණ. මං විශ්වාස කරන විදිහට අපි මේක සභාවෙන් අනුමත කරලා ආණ්ඩුකාරතුමියට යවලා මොකක් හරි ප්‍රශ්න ගත සිද්ධියක් උනොත් එහෙම, අපිට මේකෙ වගකීම භාරගන්න වෙනවා. මොකද මේකෙ නිශ්චිත සීමාවක් නිර්ණය කරලා නෑ.එහෙනම් අපිට තීරණය කරන්න වෙනවා, නිබීෂා උම්මා මහත්මියට මෙන්න මේ නිර්ණායක මත තම, මෙන්න මේ සහනය දෙන්නෙ කියල. ඒ සහනය අපි සභාවේ තීරණය කරල නැති හින්දා මේ යෝජනාවට පෞද්ගලිකව අනුමත කරන්න බැමට නම්.මාව සම්බන්ධ කර ගන්න එපා.

**සභාපතිතුමා:-**
සභාවේ තීරණයක් ඒක.නිර්ණායක තමා ඒක.නිර්ණායක තමා ග්‍රාම නිලධාරී සහතිකය හා සමෘද්ධි නිලධාරී සහතිකය.ආණ්ඩුකාරවරියක් ඔඩිට් වෙන්නෑ. ඒක ගැටළුවක් වෙන්නෑ. එතුමියගෙන් තීරණයක් අරන් තමයිඅපි වැඩ කරන්නෙ. පාලාත් පාලන ඇමති හා ආණ්ඩුකාරියගෙන් අපිට ලිඛිතව ලැබුණොත් ඒක ඔඩිට් වෙන්නෑ.මේ ගැන කතා කරන්න අපි මහා සභාව කාරක සභාවක් කරමුද?

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සමහරවිට සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමිය මේ වෙලාවේ ඔඩිට් වෙන් නැති වෙයි.ඊ ළඟ ආණ්ඩුවකින්, දැන් තීන්දුවක් ඇවිත් තියෙනවා ජනාධිපතිවරුන්ගේ වරප්‍රසාද කපන්න කියලා.

**සභාපතිතුමා:-**
එහෙනම් පනතක් වෙනස් වෙන්න ඕන.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ඕක වෙනස් වුණොත් එහෙම.අපි මොකක් හරි තිරණයක් ගමු.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මහා සභාව කාරක සභාවක් බවට මං යෝජනා කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහා සභාව බවට මං යෝජනා කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, දරිද්‍රතාවය මත පදනම් වෙලා යම්කිසි කෙනෙක් ඉල්ලීමක් කරාට පස්සේ අපට ඒක භාරනොගෙන ඉන්න බෑ. ඒක නිසා තමයි මේ යෝජනාව මෙතනට ඇවිල්ල සභාවටත් ඇවිල්ල තියෙන්නෙ.වරිපනම් සීමාව කියන්නේ දියුණු, නගරයේ සංවර්ධනය කළ කොටස. ඉල්ලීම ඉදිරිපත් කරලා තියෙනවා.නමුත් සභාවේ තියෙන අරමුදල් එක්ක සලකා බලලා අපට පුළුවන් නම් මේක මේ අවස්ථාවේදීඅනුමැතිය නොදී, අපට පුළුවන් නම් සහන කාලයක් දීලා ඒක ගෙවන්න උදව් කරන්න. දරිද්‍රතාවයෙන් ගොඩ ගැනීමේ රජයේ ව්‍යාපෘතියකට ඒගොල්ලෝ සම්බන්ධ කරගෙන, ඒගොල්ලන්ගේ ජීවන උපාය සංවර්ධනය කරන්නඅත හිත දීලා මේ වැඩේ කරගෙන යමු නැත්තම් මේක වැරදි පූර්වාදර්ශයක් වෙනවා. සභාවේ තීරණය හැටියටසහන කාලයක් දීල මේක අය කර ගැනීම සුදුසු යැයි මං යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ වගේ දේවල් ග්‍රාම නිලධාරීන් දැනුවත් නේ. ඒගොල්ලන්ටත් යුතුකමක් තියෙනවා ඇස්වැසුම වගේ දේවල් ලබාදීලා කාලයක් අල්ලගෙන ඉන්න සහයෝගය දෙන්න වැඩපිළිවෙලකට යන්න. අස්වැසුමෙන් රුපියල් 17000.00 ක් වගේ දීමනාවක් හම්බෙනවා මං හිතන්නේ. ප්‍රදේශයේ මන්ත්‍රීවරු මේ ගැනසැලකිලිමත් වෙලා රජයෙන් ගෙනා වැඩපිළිවෙළවල් ගණනාවක්, තියෙනවනෙ අඩු ආදායම් වීමට අන්න ඒ දේකට යොමු කළොත් හොඳයි කියලා යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අනිත් එක සභාපතිතුමනි අපි ජනතාව විදිහට බදු ගෙවන්න හුරුකරන එක පියවරක් තමයි මේ ප්‍රාදේශීය සභාව සඳහා වරිපනම් බදු ගෙවීම.අපි ජනතාව විදිහට බදු ගෙවන්න හුරුවෙන්න ඕන. මේ රට නගා සිටුවන්න නම්. අනිත් එක තමයි වරිපනම් බදු හිමියෙක් විදිහටඔවුන්ට තියෙන වරප්‍රසාද ටික අපි පෙන්වා දෙන්න ඕන. විශේෂයෙන් අපි පාසලකට එහෙම ඇතුළත් කර ගැනීමේදී වරිපනම් ගෙවීම සුදුසුකමක් ලෙස දකින අවස්ථාතියෙනවා. ඒ වටිනාකමත් ඔවුන්ට පැහැදිලි කරලා ඒ වගේම අපහසුතාවක් තියෙනවනම් ප්‍රදේශයේ මන්ත්‍රීවරයා හම්බවෙලා වරිපනම් ගෙවීමේ සුදුසු වැඩ පිළිවෙළකට යෑම තමයි සුදුසු.

ඒ අනුව සභාපතිතුමාගේ **6.50.**දරිද්‍රතාවය මත මාහර පාර වරිපනම් අංක 168/7 යටතේ අස්ගගුල දකුණ,ඇහැලියගොඩ පදිංචි A.R.නිබ්ෂා උම්මා මහත්මියට අයිති දේපල සහ 2024.12.31 දිනට වරිපනම් හිඟ රු.2,294.88 ක මුදල ලේඛනයෙන් ඉවත් කිරිමටත්,2025 වර්ෂයේ බිල් නොකිරිමට යොජනා වු යෝජනාව ප්‍රතිෂේප වු අතර ,ඒ සඳහා සහන කාලයක් ලබා දී හිඟ මුදල් අය කර ගැනීමට උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සභාපතිතුමා :-**
6.51.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.51.දරිද්‍රතාවය මත නො.164/D,ශානිකා නිවස,උඩුමත්ත පදිංචිව සිට මිය ගොස් ඇති එච්.පී.සිරිසේන මහතාට අයත් අවිස්සාවේල්ල පාර 314/37 අංක දරණ වරිපනම් දේපල පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියට අනුව වරිපනම් දේපල හා 2024.12.31 ට හිඟ රු.1955.00 ක මුදල ලේඛනයෙන් ඉවත් කිරීමටත්,2025 වර්ෂයේ බිල් නොකිරීමටත් යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාවටත් මීන් පෙර 6.50.යෝජනාවට ගත් තීරණයම අදාළ කරගන්නවා.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ වගේ කෙනෙකුට අස්වැසුම වගේ දීලා නැද්ද?

**සභිකඡ්.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අස්වැසුම හම්බෙනවා කියන්නේ, අනිවාර්යෙන්ම අඩු ආදායම් බවට සහතික කිරීමක් තමයි ඒක නිර්දේශ කරනවා, අඩු ආදායම්ලාභියෙක් කියන එක සනාථ කිරීමට දෙන සහතිකයක් තමයි අස්වැසුම කියන්නේ.අස්වැසුමට තෝරා ගැනීමේ දී, අස්වැසුම නිර්ණායක තුනක් යටතේ දෙනවා.17500.00 ක් 10000.00ක් 5000.00ක් ඒ කැටගරියට වසමේ ජනගහනයෙන් 13 - 2/3 අතර ප්‍රමාණයක් හැම වසමකම ආවරණය වෙලා තියෙනවා.

**සභික පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං දිලින් මන්ත්‍රීතුමාගෙන් ඇහුවා මීට කලින් සභාවලත් මේ වගේ යෝජනා ඇවිත් තියෙනවාද කියලත්.එහෙම ඇවිත් නැලු.මීට කලින් හොයාගන්න ඕනේ කව්ද මේ ටික එවල තියෙන්නෙ

කියල.ඔබතුමාට ඔහොම ලිවුම් ඉදිරිපත් කරන්නෙ, කාගෙ හරි උසි ගැන්වීමක් ඇතිනේ. මොකක් හරි දෙයක් කරන්න.අපි ඒ ගැනත් පොඩ්ඩක් හොයලා බලන්න වෙනවා.

ඒ අනුව සභාපතිතුමාගේ **6.51.**දරිද්‍රතාවය මත නො.164/D,ශානිකා නිවස,උඩුමත්ත පදිංචිව සිට මිය ගොස් ඇති එච්.පී.සිරිසේන මහතාට අයත් අවිස්සාවේල්ල පාර 314/37 අංක දරණ වරිපනම් දේපල පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියට අනුව වරිපනම් දේපල හා 2024.12.31 ට හිඟ රු.1955.00 ක මුදල ලේඛනයෙන් ඉවත් කිරීමටත්,2025 වර්ෂයේ බිල් නොකිරීමට යෝජනා වූ යෝජනාව ප්‍රතික්ෂේප වූ අතර ,ඒ සඳහා සහන කාලයක් ලබා දී හිඟ මුදල් අය කර ගැනීමට උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර සභික කේ.ඩබ්ලිව්.ඒ.නදූන් සමීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සභාපතිතුමා :-**
6.52.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.52. දරිද්‍රතාවය මත අවිස්සාවේල්ල පාර වරිපනම් අංක 272/10 යටතේ,නො.171,උඩුමත්ත,ඇහැලියගොඩ පදිංචි Y.W.කුසුමානන්ද මහතාට අයත් වරිපනම් දේපල හා 2024.12.31 ට රු.5,175.82 ක හිඟ වරිපනම් මුදල ලේඛනයෙන් ඉවත් කිරීමටත්,2025 වර්ෂයේ බිල් නොකිරීමටත් යෝජනා කරමි.**

**සභිකටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාවටත් මීත් පෙර 6.50.යෝජනාවට ගත් තීරණයම අදාළ කරගන්නවා.

ඒ අනුව සභාපතිතුමාගේ **6.52.** දරිද්‍රතාවය මත අවිස්සාවේල්ල පාර වරිපනම් අංක 272/10 යටතේ,නො.171,උඩුමත්ත,ඇහැලියගොඩ පදිංචි Y.W. කුසුමානන් ද මහතාට අයත් වරිපනම් දේපල හා 2024.12.31 ට රු. 5,175.82 ක හිඟ වරිපනම් මුදල ලේඛනයෙන් ඉවත් කිරීමටත්, 2025 වර්ෂයේ බිල් නොකිරීමට යෝජනා වූ යෝජනාව ප්‍රතික්ෂේප වූ අතර, ඒ සඳහා සහන කාලයක් ලබා දී හිඟ මුදල් අය කර ගැනීමට උපසභාපති යූ.එල්.එන්. මහේෂ් රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සභාපතිතුමා :-**
6.53.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.53.අවිස්සාවේල්ල පාර වම 195/50 A දරණ වරිපනම් දේපල අංක RT/02/2025 සහ 2025.07.07 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව අදාළ දේපල ක්ෂේත්‍රයේ දී හඳුනාගත නොහැකි හෙයින් 2024.12.31 දක්වා හිඟ වරිපනම් රු.69,472.02 මුදලත්, 2025 වර්ෂයේ බිල් නොකිරීමටත් යෝජනා කරමි.**

යම් වැඩපිළිවෙලක් කරගෙන ගිහින් තියෙනවා, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2025.03.27 දිනැති ලිපිය හා බැඳේ.ඒ අනුව අදාළ දේපළ ක්ෂේත්‍රෙයේදී හඳුනාගත නොහැකි වූ හෙයින් ඔබගේ ලේඛනවලින් ඉවත් කර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.
එහෙම එකක් නෑ කියල තමයි කියලා තියෙන්නේ

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒකට කාරණා මොනවද සභාපතිතුමනි, අංකත් ඔක්කොම තියනවනම් ඒ ක්ෂේත්‍රයට ගිහිල්ල හඳුනා ගැනීමට නොහැකි කරුණු මොනවද තියෙන්නේ.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, රු.69,472.02මුදලක් හිග වෙලා තියෙන්නේ, ඒ කියන්නේ වාර්ෂිකව හඳුනාගත් දේපලක් වෙන්න ඕනනේ. ආරම්භයේ තිබිල නැති වුනේ කොහොමද? ඒක ඉවත් කළාද? නැත්නම් අස්ථානගත වෙලාද දේපළ(සෝසාව)

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මහා සභාව කාරක සභාවක් බවට මං යෝජනා කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභිකටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,කාරක සභාව මහා සභාව බවට මං යෝජනා කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, තක්සේරු දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව ලේඛනයෙන් ඉවත් කිරීමට සභාවේ තීරණය කරනවා.

**සභිකකේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ක්ෂේත්‍රයේ යන නිසා වරිපනම් ගෙවන ප්‍රමුඛතාවක් තියෙනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මගේ උනත් වරිපනම් හිඟ මුදලක් තිබුනා නිලධාරීන් යන නිසා අපි රුපියල් දෙදහ ගානෙ හරි ගෙවලා ඒක අඩු කරගන්නවා. ගෙවන්න එක දැන් හුරු වෙලා තියෙනවා.

**සභාපතිතුමා :-**
අපේ පළාත් පාලන ආයතන දාහතක් තියනවා. අපි තමයි වරිපනම් හිගවලින් ප්‍රසාද මට්ටමේ ඉන්නේ. ඇත්තටම ඒ නිලධාරීන්ට ස්තුති කරන්න ඕන.පළාත් පාලන ආයතන 17 ම අපි තමයි එකට ඉන්නේ. හිඟ අඩුවෙන් ම තියෙන්නෙ අපේ.

ඒ අනුව සභාපතිතුමාගේ **6.53.**අවිස්සාවේල්ල පාර වම් 195/50 A දරණ වරිපනම් දේපල අංක RT/02/2025 සහ 2025.07.07 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව අදාළ දේපල ක්ෂේත්‍රයේ දී හදුනාගත නොහැකි හෙයින් 2024.12.31 දක්වා හිඟ වරිපනම් රු.69,472.02 මුදලත්, 2025 වර්ෂයේ බිල් නොකිරීමටවූ යෝජනාව අවිස්සාවේල්ල පාර වම් 195/50 A දරණ වරිපනම් දේපල අංක RT/02/2025 සහ 2025.07.07 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව කටයුතු කිරීමට සුදුසු බවට උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා විසින් යෝජනා කළ අතර සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සභාපතිතුමා :-**
6.54.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.54.“සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2023 ජනවාරි 24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ” සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග” මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ,2024.10.03 වන දින පවත්වනු ලැබූ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 01 දරණ තීරණය අනුව 2025.01.17 දින ගැසට් පත්‍රයෙහි එල කරනු ලැබ ඇති නිවේදනයේ උපලේඛනයේ ඇතුළත් නාම ලේඛනයේ දැක්වෙන පාරවල් සහ පටු මාවත් අතරින් නිසි අධිකරණයේ නඩු පවරා නැති සහ මෙහි පහත උපලේඛනයේ ඇතුළත් පාරවල් සහ පටු මාවත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කළ යුතු බව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, විෂය නිලධාරිනිය මට කතා කරපු වෙලාවේ විස්තර කියපු නිසා, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අයිති පාරවල් තියෙනවා, එක්දාස් අටසිය ගාණක්. ඒකෙන් පන්සියයක් තමයි මේ ගැසට් කරලා තියෙන්නේ. 500 ඉස්සෙල්ලාම ගැසට් කරලා තියෙන්නේ 2025.01.17 දින.මං හිතන්නේ ඔබතුමා ගාව තියෙනවා, ගැසට් පොත් තුනම.භාෂා තුනෙන්ම තියෙනවා.PDF එක ඇති බලන්න.ඒකෙ තියෙන්නේ පාරවල් 500 ක විතරයි.තව පාරවල් එක්දහස් තුන්සිය ගානක් තියෙනවා ගැසට් කරන්න.මේ කරන්නේ මේ 500 ට විරෝධතාවයක් නෑ කියලා, මාස හයක් තියෙනවා විරෝධතා ගොනුකරන්න ජනතාවට.මේ ටික නැවත ගැසට් කරන්න ඕන විරෝධතා නෑ කියල. ඒක තමයි මේ ගැසට් කරන්න හදන්නේ. මීට පස්සේ තව එක්දාස් තුන්සිය ගාණක් තියෙනවා. මං හිතන්නේ දැනට සංහල,දෙමළ,ඉංග්‍රීසි භාෂා තුනෙන් ම භාෂා පරිවර්තනය කරගෙන යන්නේ.මේ තියෙන්නේ පළමු වර ගැසට් කරපු පාරවල් 500 ගැසට් එක.ප්‍රින්ට් කරල දෙන්න බැරි නිසා, මේ ගැසට් කරපු පාරවල් පන්සීයේ PDF එක වට්ස් ඇප් යොමු කරල ඇති බලන්න. මුද්‍රණය කරලා දෙන්න බැරි නිසා එහෙම කළේ.මේක ප්‍රාදේශීය සභා පාරක් කියල අඳුර ගත්තට පස්සේ පුළුවන් ඒ පාර අපට සංවර්ධනය කරන්න මැදිහත් වෙන්න. පාර අයිතිය අපට තියෙන පාරවල් තියෙනවා. පළාත් සභාවට අයිති පාරවල් තියෙනවා. පුද්ගලික පාරවල් තියෙනවා. මේක සබරගමුපළාතෙම වෙච්ච ඒකාබද්ධ වැඩසටහනක්. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවෙන් අපේ නිලධාරි මහත්ම මහත්මීන් මෙ දේ කරලා තියෙනවා. මේක ගැසට් කරන එක ගොඩක් වටිනවා,.මේ පාරවල් ප්‍රමාණයන් එක්ක, GPS සන්නාමත් එක්ක.දෙවනවර ගැසට් කරන්න තමයි මේ යෝජනා කරල තියෙන්නේ. අපි අනුමැතිය ලබා දීල මේ වැඩේ ඉස්සරහට කරගෙන යන්න මම මේ යෝජනාව ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මට මතකයි පසුගිය සභාවේ කටයුතු කරනකොට මේ සඳහා ඒ කාලසීමාව තුළ තමයි මේ යෝජනාව ආවෙ. අපි සභාවෙන් අවශ්‍ය සම්පත් ලබා දුන්නා ජී.පී.එස් උපකරණ කාර්ය මණ්ඩල විශාල ප්‍රමාණයක් යොදවල අවුරුදු ගාණක ප්‍රතිඵලයක් තමයි මේ අපි අද අත්විඳින්නේ. දැන් මට දැනගන්න ඕන සභාපතිතුමනි විරෝධතා ඉදිරිපත් කිරීමේ කාලෙ ඉවරද කියල.මට නම් විරෝධතාවක් නෑ. ජනතාවට විරෝධතාවක් තියෙන්න පුළුවන්. විරෝධදතාවක් තියෙනවද නැද්ද කියන්න ජනතාව දන්නවද නැද්ද දන්නෙත් නෑ, මෙහෙම ගැසට් එකක් ආවා කියල. යම්කිසි විරෝධතාවක් ආවොත් එහෙම ප්‍රශ්නයක් වෙන්න ඉඩ තියෙනවා. සභා තීරණයක් ගන්න වෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේකෙ ගැටලුකාරී තැනක් තියෙනවා 2024.10.03 වන දින පැවැත්වූ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක එක දරණ තීරණය අනුව

**සභාපතිතුමා :-**
2024.10.03 වන දින පවත්වනු ලැබූ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා රැස්වීමේ යන්න 2024.10.03 වන දින පවත්වනු ලැබූ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ කමිටුව ලෙස නිවරදි විය යුතුය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,මහා සභාව කාරක සභාවක් බවට මං යෝජනා කරනවා.

**සභිකටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,කාරක සභාව මහා සභාව බවට මං යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, පාරවල් 1800 ගානක් තියෙන අපේ ප්‍රාදේශීය සභාවේ පාරවල් 500 ක් මේ කරපු ගැසට් එකේ දෙවැනි වර ගැසට් එක තහවුරු කරන්න ගන්න ගෙනා යෝජනාව සභා සම්මත කර ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025.01.17 දින ගැසට් පත්‍රය පළ කරනු ලැබුවත් තාක්ෂණික දෝෂයක් හින්ද ජනතාවට මේක බලන්න පුලුවන්කම ලැබිල තියෙන්නේ 2025.06.03 ඉඳල තමයි බලන්න පුළුවන් වෙලා තියෙන්නේ. ඒ අනුව අද දිනේ වෙනකොට මාස තුනක කාලයක් ඉක්මවා ගිහින් තියනවා. හැබැයි අපි විශ්වාස කරනවා තව මාස තුනක් තියෙනවා ජනතාවට මොකක් හරි විරෝධතාවක් තියෙනව නම්, සභාවට ඉදිරිපත් කරන්න. ඒකටත් අවස්ථාව සලසා දෙමින් මේ වැඩසටහන ඉදිරියට කරගෙන යෑමට සුදුසුයි කියලා තමයි අපි යෝජනා කරන්නේ.

ඒ අනුව සභාපතිතුමාගේ **6.54.**“සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2023 ජනවාරි 24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ” සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග” මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ,2024.10.03 වන දින පවත්වනු ලැබූ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ කමිටුවේ තීරණ අංක 01 දරණ තීරණය අනුව 2025.01.17 දින ගැසට් පත්‍රයෙහි එල කරනු ලැබ ඇති නිවේදනයේ උපලේඛනයේ ඇතුළත් නාම ලේඛනයේ දැක්වෙන පාරවල් සහ පටු මාවත් අතරින් නිසි අධිකරණයේ නඩු පවරා නැති සහ මෙහි පහත උපලේඛනයේ ඇතුළත් පාරවල් සහ පටු මාවත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කළ යුතු බව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය. වූ යෝජනාව දෙවැනි වර ගැසට් කිරීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය

**සභාපතිතුමා :-**
6.55.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.55.සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ අනුමත ව්‍යාපෘති.**
**ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ වහලය අලුත් වැඩයා කිරීම,බේරුවාන කසල කළමණාකරන අංගනය පුළුල් කිරීම,මීන්නාන පන්ගොඩැල්ල ගම්මානය සඳහා ජලය ලබා දීම කර්මාන්ත සම්න්ධව ලැබී ඇති ලංසු ඇගයීම සඳහා කමිටුව සඳහා පහත නිලධාරීන් පත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.**

- **i. ලේකම් - ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**
- **ii. කාර්මික නිලධාරී - ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**
- **iii. කාර්මික නිලධාරී - ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**
- **iv. ගණකාධිකාරී - ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**සභාපතිතුමා :-**
සබරගමු පළාත් ප්‍රතිපාදන යටතේ අපේ ප්‍රාදේශීය සභාවට අපට හම්බුනා ලක්ෂ විස්සෙන් උඩ ව්‍යාපෘති තුනක්. ඒක ටෙන්ඩර් එක හරහා ගියේ. ඒකෙ වැඩිම ලංසු තියෙන ගැනුම්කරුවෝ තුන් දෙනෙකුට දීම සඳහා අපි තාක්ෂණ නිලධාරීන් මදි පාඩු නිසා අපි ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරී කෙනෙක් ලබා ගන්න ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගණකාධිවරයෙක් ලබාගන්න ඒවගේම ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ලේකම්තුමත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාර්මික නිලධාරී ලබාගන්න තමයි යෝජනා කරන්නේ.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා

ඒ අනුව සභාපතිතුමාගේ 6.55.සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ අනුමත ව්‍යාපෘති.
ඇහැලියගොඩ මහජන පුස්තකාලයේ වහලය අලුත් වැඩයා කිරීම,බේරුවාන කසල කළමණාකරන අංගනය පුළුල් කිරීම,මීන්නාන පන්ගොඩැල්ල ගම්මානය සඳහා ජලය ලබා දීම කර්මාන්ත සම්න්ධව ලැබී ඇති ලංසු ඇගයීම සඳහා කමිටුව සඳහා පහත නිලධාරීන් පත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.56. සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.56.ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාළ එක් විශේෂ දේපලක් හැර ඉතිරි දේපලවල තක්සේරු කටයුතු කර ඇති අතර මුළු තක්සේරු වටිනාකම රු.284,332,750.00 වන අතර එයින් 10% ක මුදල වන රු.28,433,275.00 ක වාර්ෂික තක්සේරු මුදල 2026 වර්ෂයේ සිට අයකර ගැනීමට යෝජනා කරමි.**
ඉස්සෙල්ල යෝජනාවේ මුදලක් ගෙවන්න වුණේ,තක්සේරු දෙපාර්තමේන්තුවට.අන්න ඒකෙ,අපිට ලබා ගන්න ඕන මුදල අපි 2026 වර්ෂයේ සිට ආරම්භ කිරිමට තමයි මේ මම යෝජනා කරන්නේ.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මේක ගත්තොත් එහෙම අපේ ප්‍රාදේශීය සභාවේ කාර්යය තමයි වරිපනම් සීමාව පුළුල් කිරීම.ඒ වගේම තමයි වරිපනම් සීමාවේ ඉන්න ජනතාවගේ ජීවන මට්ටම පුළුල් කිරීම. අපිට ලොකු වගකීමක් තියෙනවා, මේ වරිපනම් සීමාවේ ඒ ප්‍රදේශයට පහසුකම් දෙන්න.2008 පස්සෙ තක්සේරුවක් කරලත් නෑ. සෑහෙන කාලෙකින්. තක්සේරු වටිනාකමත් දැන ඉහළ ගිහින් තියෙනවා. ඒකෙන් සීයට දහයක් තමයි අනුමැතිය ගන්නේ ඔබතුමා. මම යෝජනා කරනවා වරිපනම් සීමාවේ ඉන්න ජනතාවට මීට වඩා ප්‍රමුඛතාවක් දීලා එයාලට දෙනසේවාවන් තවත් පුළුල් කරලා ලබන අවුරුද්ද තමයි අයකරන්නේ.අපි අනිවාර්යෙන්ම මේ අවුරුද්දේ ඉදිරි මාස කීපයේ, ඒ ගොල්ලන්ට අගයක් දෙන්න ඕන ඒ ගොල්ලන්ගේ පහසුකම් පුළුල් කරනවා කියන එක විශ්වාසය අපි තහවුරු කරන්න ඕන. ඉදිරි මාස කීපයේ මේ වරිපනම් සීමාවේ ඉන්න ජනතාවට මේ පහසුකම් ටික පුළුල් කරලා, මේ මුදල එකතු කරන යෝජනාවට අදහසක් ඉදිරිපත් කරනවා.

**සභාපතිතුමා :-**
කලක් ගියාට පස්සෙ සභාවේ මුදල් වැඩි කර ගැනීම සඳහා, ඉස්සෙල්ල අපි යෝජනාව ගත්තේ සභාවේ ඉන්න සේවක සංඛ්‍යාව වැඩි කරගන්න. වරිපනම් සීමාව පුළුල් කරන්න ඕන. වරිපනම් සීමාව පුළුල් කරන්න නම් ප්‍රදේශයෙ ඉන්න පාරිභෝගිකයන් නැත්නම් මහජනතාවට සේවය කරන්න ඕන.හරි නම් අපි ඉදිරියේදී දියුණු ප්‍රදේශයක් වුණු සභාවම, වසම් 44 ටම වරිපනම් එකතු කිරීම අපි අනුමත කරනවා.අපේ සභාවේ සංවර්ධන ව්‍යාපෘති සමඟ.

ඒ අනුව සභාපතිතුමාගේ **6.56.**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාළ එක් විශේෂ දේපලක් හැර ඉතිරි දේපලවල තක්සේරු කටයුතු කර ඇති අතර මුළු තක්සේරු වටිනාකම රු.284,332,750.00 වන අතර එයින් 10% ක මුදල වන රු.28,433,275.00 ක වාර්ෂික තක්සේරු මුදල 2026 වර්ෂයේ සිට අයකර ගැනීමට යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.57. සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**6.57.ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය මිලදී ගැනීම් සිදු කිරීමේ දී ගනු ලබන භාණ්ඩ පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා තාක්ෂණික කමිටුව පත්කර ගැනීමට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, අපේ අනිත් මන්ත්‍රීවරුත් එකඟ වෙයි.එහෙම නම් කර ගත්තොත්, එකිනෙක වෙනස් වෙනවනේ.අපිට විවිධ භාණ්ඩ මිලදී ගන්න තියෙනවා. ඒ සම්බන්ධව මිල දී ගැනීම සම්බන්ධවනේ කමිටුවක් දාන්න හදන්නේ. එතකොට අපිට ඒක පිළිබඳ පොඩි පැහැදිලි කිරීමක් කළොත්.
**සභාපතිතුමා :-**
මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් දිලීන් මන්ත්‍රීතුමා කරා නම් හොඳයි.මේක ඔබතුමාගේ යෝජනාවක්.අර අපි විදුලිය මිලදී ගැනීමේ දී,ඒකත් එක්ක තමයි අපි යෝජබාව දැම්මේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඔව්.බොහොම ස්තුතියි අවස්ථාව ලබාදීම ගැන. මම මෙතනදි අදහස් කලේ මිලදීගැනීම් සම්බන්ධව නෙමෙයි, සභාපතිතුමනි. අපි මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන කමිටුවක් විදිහට කටයුතු කරනවා. මිලදී ගන්නා භාණ්ඩවල තත්ත්වය පිළිබඳ අපට තියෙන දැනුම ප්‍රමාණය මදි ඒ ක්ෂේත්‍රය පිළිබඳ. ඒ ඒ ක්ෂේත්‍රයේ තියෙන දැනුම සහිත අය එකතු කරගෙන කමිටුවක් පත් කරගමු කියන යෝජනාව තමයි අපි එතනදි කළේ.සමහරවිට අපට බල්බ් මිලදී ගන්න වෙනවා. බල්බ්වල තියෙන විදුලි ධාරිතාව පැය ගණන ඒවා ගලපගන්න අපේ දැනුම මදි. ඒ දැනුම තියෙන අය එකතු කරලා කමිටුවක් සකස් කර ගත්තොත් අපිට හොඳ කාර්යක්ෂමතාවයෙන් යුතු භාණ්ඩ මිලට ගන්න පුළුවන් කියන එක තමයි අදහස් කළේ.

**සභාපතිතුමා :-**
මෙතනදී අපි කට්ටියක් පත් කරගන්නෑ. කට්ටිය පත් කර ගත්තොත් එකිනෙක වෙනස් වෙනවනේ.මිලදී ගැනීම සම්බන්ධව තමයි මම යෝජනාව දැම්මේ.එක හා සමාන දැනුමක් නැනේ.කමිටුව පත් කර ගත්තොත් එක දේකට නෙමේනෙ කමිටුව පත් කර ගන්නේ.එක වෙලාවකදි විදුලි භාන්ඩ මිල දී ගන්න.තව වෙලාවකදී අපිට වෙයි ගෘහ භාණ්ඩ වගේ දේවල් මිලදී ගන්න.එහෙම වුණොත් ගැටලුවවක් වෙනවා.එක නිසා අද අපි කමිටුවක් පත් කර ගැනීමට යෝජනාව ස්ථිර කර ගමු.ඊට පස්සෙ අපි එන ප්‍රොසීඩියර් එක බලලා ඒ ඒ

අවස්ථාවට අවශ්‍ය වෙන සුදුසු අය පත් කර ගමු.අද අපි යෝජනා කර ගමු ඒ කමිටුවක අවශ්‍යතාවය.කට්ටියක් පත් කරගන්න යෝජනාව සම්මත කරගමු.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, උදාහරණයක් වශයෙන් සංගීත භාණ්ඩ සහ ඒ පැත්ත සම්බන්ධ ඒවට මම ඒකට සම්බන්ධ වෙනවා.
**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔබතුමා පැහැදිලි කරපු කාරණාව අනුව අපි ඒ විදිහට කටයුතු කරමු.

ඒ අනුව සභාපතිතුමාගේ **6.57.**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය මිලදී ගැනීම් සිදු කිරීමේ දී ගනු ලබන භාණ්ඩ පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා තාක්ෂණික කමිටුව පත්කර ගැනීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.58.සභික සුජීව විජේසූරිය මැතිතුමාගේ යෝජනාව.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,සුජීව මන්ත්‍රීතුමා හදිසියේම අවමංගල්‍යයකට සහභාගී වෙන්න ගියා.ඒ නිසා එම යෝජනාව මං ඉදිරිපත් කරනවා.

**6.58.වරිපනම් බදු/අක්කර බදු එකතු කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මේක කාලෝචිත යෝජනාවක්. කඩිනම් වැඩපිළිවෙළක් කියලා තියෙන්නේ,මං හිතන්නේ ගැටලු නිරාකරණය කරලා, ඔන්ලයින් පේමට් කරන්න පුළුවන් විදියක් වෙන්න ඇති එතුමා යෝජනා කරන්න ඇත්තේ. මේක ඩිජිටල් කරන ප්‍රතිපත්තියත් එක්ක සමගාමීව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වැඩිදියුණු කරමින් අක්කර බදු වරිපනම් බදු එකතු කිරීම ආදියත්.අදහසක් විදියට එකතු කරනවා.

ඒ අනුව සභික සුජීව විජේසූරිය මැතිතුමාගේ**6.58.**වරිපනම් බදු/අක්කර බදු එකතු කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.59.සභික සුජීව විජේසූරිය මැතිතුමාගේ යෝජනාව.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාවත් මං ඉදිරිපත් කරනවා.

**6.59.අප බල ප්‍රදේශයේ තිබෙන වෙළඳසැල් කර්මාන්ත ආදී ව්‍යාපාරික ස්ථාන පිළිබඳ වසමින් වසම නිරීක්ෂණය කර වාර්තාවක් සකසන ලෙස යෝජනා කරමි.(උදා-සිල්ලර කඩ,හෝටල්,කර්මාන්ත ආදී)**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, ඉතාම හොඳ යෝජනාවක් අපේ සුජීව මන්ත්‍රිතුමාගෙන් ආපු. එතුමා හිටියනම් හොඳයි මේක එතුමාගේ අදහසත් ගන්න. මේකෙදි මට ආපු අදහසක් තමයි පසුගිය සභා වාරයේ දී අතුරු ව්‍යවස්ථා සඳහා කමිටුවක් නම් කර ගත්ත අතුරු ව්‍යවස්ථා සඳහා අවශ්‍ය කරන නීති සම්පාදනය කරන්න, ඒ ප්‍රතිපත්ති සම්පාදනය කරන්න, මෙන්න මේ තොරතුරු ටික අප බල ප්‍රදේශයේ තියෙන වෙළෙඳසැල් කර්මාන්ත ඒ සියලුම දේවල් ගැන අදාළ කරන නිර්ණායකත් එක්ක දත්ත පද්ධතියක් තියෙන්න ඕනෙ.අපිගාව තියෙන දත්ත පද්ධතියෙන් ලොකු විස්තරයක්,සභා බල ප්‍රදේශය සම්බන්ධ පුළුල් විග්‍රහයක් අපිට ගන්න අමාරුයි.ඒ නිසා මේක නිලධාරීන් ක්ෂේත්‍රයට යවල හරි ප්‍රධාන ව්‍යාපාරිකයින් සභාවට එන වෙලාවක ෆෝම් එකක් පුරවගෙන හරි ඵලදායි විදිහට මේ දත්ත පද්ධතිය, වාර්තාවක් අපි සකස් කර ගැනීම ඉතා ම අත්‍යවශ්‍යයි.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒකට දිගුවක් විදිහට, අපේ ප්‍රදේශවලත් සමහර ව්‍යාපාර තියෙනව ආදායම් ලබන ව්‍යාපාර,සත්ව පාලන ව්‍යාපාර වගේ, ආදායම් ලබන ව්‍යාපාර.ඇත්තටම මං හොයල බලද්දි සභාවට ආදායමක් එන ක්‍රමවේදයක් නෑ.ඒකට ක්‍රමවේදයක් හදාගන්න වෙනවා වසමින් වසම හරි. සභාවට ආදායමක් එන ක්‍රමවේදයක් තියෙනවනේ, අපි ව්‍යාපාරිකයෝ අකමැත්තක් නැති ක්‍රමවේදයක් තියෙනවද?මං හිතන්නේ සභාවේ ක්‍රමවේදයක් තියෙනවා.ඒක්කෝ ඒගොල්ලෝ දැනුවත් නෑ. එක්කො පැහැර හැරීමක් නැත්නම්, ක්‍රමවේදයක් නෑ. අපි ක්‍රමවේදයක් ඉක්මනට යෝජනා කරගෙන, අඩුම තරමේ ඒ වගේ ලාභ ලබන ක්ෂේත්‍රයේ ඉන්න ව්‍යාපාරිකයන් ඉන්නවා. ලොකු මුදලක් අය වෙන එකක් නෑ.හැබැයි ඇහැලියගොඩ වසම් හතළිස් හතරම එකතු කලොත් මං හිතන්නේ, දෙදාහක් තුන් දාහක් ව්‍යාපාර තියෙයි. අපි මේ යම්කිසි මුදලක් අය නොකරන, ඒම ව්‍යාපාරිකයෝ ටික එකතු කර ගැනීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කරන්න කියලා යෝජනා කරනවා.

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**

ගරු සභාපතිතුමනි, ව්‍යාපාර සම්බන්ධයෙන් කතා කරන කොට ව්‍යාපාර ,අපි ව්‍යාපාර ලියාපදිංචි කරන කොට ගෙවීමක් කරනවා අවුරුද්දකට සැරයක්.ඇත්තටම ව්‍යාපාර ලියාපදිංචියක් තියෙනවා.ලියාපදිංචි කරලා නැති ඒවා ලියාපදිංචි කරනව නම් ගෙවීම් කරන්න ගන්න පුළුවන්.ගෙවීමක් කරනවනේ වාර්ෂිකව,

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ වජිර මන්ත්‍රීතුමා කිවුවේ දැනට ගෙවන ඒවා නෙමේ,දැනට මග ඇරිච්ච ඒවා තියෙනවා කියලා.මගේ වසමෙත් එහෙම තියෙනවා.සංචාරක ව්‍යාපාරයක් කරන ස්ථානයක්.මේ වන විට ගොඩ නැගී ගෙන යනවා.මම දන්න ආකාරයට සභාවට ශතයක්වත් ගෙවන්නේ නෑ තාම.ඒ වගේ අපි දන්න කියන තැන් තියෙනවා.වසම් 44 ම සැහෙන සංඛ්‍යාවක් ඇති,අපට සම්බන්ධ නොවුණු.ඒක තමා සුජීව මන්ත්‍රීතුමා ඒ යෝජනාව දාල තියෙන්නේ. ලියාපදිංචි නොවුණු ඒවා ලියාපදිංචි කර ගන්න.මඟ ඇරුණු ඒවා ඇති.අන්න ඒවා ටික සභාවේ ලියාපදිංචි කර ගන්න තමයි මේ යෝජනාව දාල තියෙන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මට මතක විදිහට 1918 අංක 6 ව්‍යාපාර නාම ආඥපනත කියලා,ව්‍යාපාර නාම ආඥාපනතක් තියෙනවා.තමන්ගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරයක් කරගෙන යනව නම් ඒ අයට ව්‍යාපාර යටතේ ලියාපදිංචි කරන්න,ව්‍යාපාර ලියාපදිංචි කරාම සභාවෙන් දෙන ව්‍යාපාර සහතිකය අත්‍යවශ්‍යයි.මං හිතන විදිහට සංවර්ධන නිලධාරීන් ඉන්නවා අපේ ගම්වල.එයාල අතේ ලේඛනයක් තියෙනවා,එයාල අතේ ව්‍යාපාර ලේඛනයක් තියෙනවා, කවුද ව්‍යාපාර කරන්නේ කියලා.අපි සභාවට ඒ ලේඛනය විධිමත් ආකාරයෙන් ලබා ගෙන ඒ ඒ අයට දැනුම් දෙමු ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ගන්න කියලා කියමු.එවිට යම්කිසි ආදායමක් ගන්න පුළුවන්.

ඒ අනුව සභික සුජීව විජේසූරිය මැතිතුමාගේ **6.59.**අප බල ප්‍රදේශයේ තිබෙන වෙළඳසැල් කර්මාන්ත ආදී ව්‍යාපාරික ස්ථාන පිළිබඳ වසමින් වසම නිරීක්ෂණය කර වාර්තාවක් සකසන ලෙස යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
හදිසි යෝජනා 3 ක් තියෙනවා.

**සභාපතිතුමා :-**
**හදිසි යෝජනා -01**
**පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මඟින් අය කර ගෙන ඇති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට ලැබිය යුතු අතිරේක මුද්දර ගාස්තු අය කර ගැනීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොජනා කරමි.**

මේක මේ අතිරේඛ මුද්දර ගාස්තුවක්,අපට ලැබෙන්න තියෙනවා.පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඒ මුදල තියෙනවා.නමුත් මෙතන ක්‍රමවේදයක් නෑ අපිට ගන්න.ඒක ලබා ගන්න තමයි අපි මේ යෝජනා කරන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මන්ත්‍රීවරුන්ට කියපු කාරණය තේරුණා ද දන්නෑ.අපට වැඩිම ආදායමක් ලැබෙන්නේ මේ මුද්දර ගාස්තුවලින්.මේ මුද්දර ගාස්තුවල සභාවට අයත් වන මුද්දර ගාස්තු අපට මෙච්චර කාලයක් ලැබෙනවා.අතිරේක මුද්දර ගාස්තුවක් කියන්නේ, මේක පළවෙනි වතාවට තමයි පළාත් සභාවේදී මේ කතාව ඇදුනේ. දැනට මිලියන පන්සියයක මුදලක් තියෙනවා.මිලියන 500 ක් හොදේ. රත්නපුර දිස්ත්‍රික්කයේ ආදායම් දෙපාර්තමේන්තුවේ තියෙනවා ඒ මුදල අපට නිකුත් කරන්න බෑ. අනිත් මුද්දර ගාස්තු අපට ලබා දෙනවා. අතිරේක මුද්දර ගාස්තු 2019 වර්ෂයේ තමා මට මතක හැටියට,අපි ඉඩමක් ලියන කොට ඒකෙ තියෙනවනේ මුදලක්. ඉඩම් තක්සේරු මුදලක් නෙමේ. මුද්දර ගාස්තු වැඩිපුර ගෙවන්න වෙන හින්දා ඒක අඩුවෙන් තමයි ලියන්නේ. හැබැයි මේවා තක්සේරුවේදී මේවා ආයෙත් තක්සේරු කරනවා. තක්සේරු කරාට පස්සේ සමහර ඒවා දෙතුන් ගුණයකින් වැඩියි. අන්න ඒ මුදල තියෙනවා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ. හැබැයි ඒගොල්ලන්ට ප්‍රතිපත්තියක් හේතුවෙන් ඒ මුදල එයාලට අපිට නිදහස් කරන්න බෑ.එක මුළු ලංකාවෙම තියෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ මිලියන පන්සියයක් කියන්නේ අපේ සංවර්ධන,මං හිතන විදිහට අපේ ඇහැලියගොඩට ඒකෙන් මිලියන සීයක් වත් ඇති.ලොකු මුදලක්. අපි ප්‍රශ්න කරාම තමයි ඒගොල්ලෝ කිව්වෙ මේක සභාවක අනුමත කරගෙන, හැම සභාවකම දේශපාලන අධිකාරියේ ඇමතිතුමාට, ඒගොල්ලෝ නිදහස් කරන්න කැමැතියි අතිරේක මුද්දර ගාස්තුවක්නේ. ඒක නිදහස් කරන්න ඒගොල්ලොන්ට තවම ක්‍රමයක් නෑ.නීතිමය ගැටලුවක් තියෙන්නේ.ඒක දැනුවත් කරන්න කිවුව. සබරගමු පළාතෙ විතරක් නෙමෙයි. මුළු පළාත් සියල්ලේම මේක අදාලයි. අනිත් අයත් මේ විදිහට කළොත් අපට මේක ලබාගන්න පුළුවන්. මේක අවුරුදු ගානක එකක්. 2019 ඉදන් ගෙවන මුදලක්. ඒක තමයි මේ යෝජනා කරන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, අපි මුලින්ම අපිට ලැබිය යුතු ආදායම් තියෙනවා නම් අපි ඒවා ලබා ගන්න ඕන. පළාත් පාලන අමාත්‍යාංශයේ හරි දේශපාලන අධිකාරියට හරි දැනුවත් කිරීම් කරලා, අපේ පැත්තෙනුත් ඒ ඉල්ලීම කරා කියල රත්නපුර දිස්ත්‍රික්කයම තියෙන සභා දාහතම ඉල්ලීම් කරල රත්නපුර දිස්ත්‍රික්කය ටික අපි ලබා ගන්න බලමු.

ඒ අනුව සභාපතිතුමාගේ හදිසි යෝජනා **01** යටතේ ඉදිරිපත් කළ, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මඟින් අය කර ගෙන ඇති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට ලැබිය යුතු අතිරේක මුද්දර ගාස්තු අය කර ගැනීමට වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
**හදිසි යෝජනා -02**
**"පළාත් පාලන සතිය - 2025" 2025.09.15-2025.09.21 දක්වා දළ ඇස්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේකෙ ගොඩක් තියනවා. එකෙන් එක කියන්නෑ. මේකටයන සම්පූර්ණ මුදල කියන්නම්.රු.137365.00 ක්.පළාත් පාලන සතියක් පවත්වන්නේ අවුරුදු දහයකට වගේ පසුව පවත්වන්නේ.ඒ වගේම මන්ත්‍රීවරු හා මන්ත්‍රීවරියෝ සඳහා දැනුවත් කිරීමක් කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒකට සියලු දෙනාම දායකත්වය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, පළාත් පාලන සතිය පරිසර හා රුක් රෝපන දිනය,ඊට පස්සේ සනීපාරක්ෂක දිනය වගේ දවස් ගණනාවකට වෙන් කරලා කොට්ඨාස දහඅටේම සියලු මන්ත්‍රීවරු සියලු දෙනාම සම්බන්ධ කරගෙන කරන වැඩක්. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විතරක් නෙමෙයි, මේක මුළු ලංකාවෙම දීපව්‍යාප්තව කරන එකක්. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විදිහට අපි මේ වැඩේ ඉතාමත් සාර්ථකව ඉතාම ඵලදායිව මේ වැඩේ කරන්න ඕනි කියල මම යෝජනා කරන ගමන්, මේක අපි මන්ත්‍රීවරු හැටියටඅපි සියලු දෙනාම සම්බන්ධ වෙලා මේක සාර්ථකව කරලා, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව රත්නපුර දිස්ත්‍රික්කයේ තියෙන වැඩසටහන්වලින් ඉහළම ආයතනය බවට පත් අපි කරමු කියමින්, අදහසක් විදිහට ඉදිරිපත් කරනවා.

ඒ අනුව සභාපතිතුමාගේ හදිසි යෝජනා **02**යටතේ ඉදිරිපත් කළ'පළාත් පාලන සතිය - 2025'2025.09.15 සිට 2025.09.21 දක්වා දළ ඇස්තමේන්තුව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**හදිසි යෝජනා -03**
**සභාපතිතුමාගේ වාහනයට පෞද්ගලික රියදුරු මහතෙකු බඳවා ගැනීමට සුදුසු බව යෝජනා කරමි.**

මේක හදිසි යෝජනාවක්ද කියලා අහයි සමහර විට ප්‍රාදේශීය සභාවේ ඉන්න ස්ථිර රියදුරෝ දෙන්නයි. එක්කෙනෙක් ට්‍රැක්ටර් රියදුරෙක් අනෙක් රියදුරා තමයි, එක රියදුරයි හිටියේ.ගිය සතියෙ තමයි අනෙක් රියදුරා ස්ථිර කළේ. ස්ථිර පත්වීම් ලිපිය ලැබුණේ. ඒක නිසා අපි ප්‍රාදේශීය සභාවට වාහන කීපයක් තියෙනවා. කැබ් රථ දෙකක් තියෙනවා. ත්‍රීවිල් රථයක් තියෙනවා. ට්‍රැක්ටර් රථ 4 ක් තියෙනවා. තව වාහන කිහිපයක් ගන්න බලාපොරොත්තු වෙන් සිටිනවා. අනික තමයි ස්ථිර කරපු අසිත රියදුරා සමහරවිට එයාට ඕනෑම තැනකට යන්න පුළුවන්. අනික තමයි මධුර කියල අපට දැනට ඉන්නවා ස්ථිර සේවකයෙක්. නමුත් ඔහුගේ සේවය තියෙන්නේ දරන්නාට කාලයට පමණයි. එහෙම උනොත් අපිට එක රියදුරයි ඉන්නේ. ඔහුටත් ස්ථිර වෙලා ආවෙ ගිය සුමානෙ. ඕන තැනකට ඔහුටත් යන්න පුළුවන්. ඒ නිසා ඔබතුමන්ලා සමහරවිට දන්නවා ඇති සමහරවිට සභාපතිගේ වාහනය ගොඩක් දුරට මම තනියෙන් මම විතරක් ඩ්‍රයිව් කරගෙන යන අවස්ථා තියෙනවා. ඒ හින්ද මං සභාවට යෝජනා කරනවා,සභාපතිගේ වාහනය සඳහා පෞද්ගලික රියදුරෙක් බඳවා ගැනීමට සුදුසු බව මේ අවස්ථාවේදී යෝජනා කරනවා.කොන්ත්‍රාත් පදනම මත.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, ඔබතුමා කාර්ය බහුල කෙනෙක් මාත් කීප වතාවක්ම කියලා තියෙනවා තනියෙන් වාහනය ඩ්‍රයිව් කරන් යන්න එපා කියලා. ඒ නිසා ඇත්තටම රියදුරෙක් ලබාගන්න එක ඉතාම සුදුසුයි, මේ වැඩේට. එතකොට ඔබතුමාගේ කාලය මහජන සේවය සඳහා ම සභාවේ වැඩ කටයුතුවලට ඵලදායිව යොදාගන්න හැකි නිසා.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මොකුත් හිතන්න එපා.මේක හදිසි යෝජනාවක් විදිහට දාලා,මට දැනගන්න ඕනේ මේකප්‍රමාණවත්ද කියන එක.

**සභාපතිතුමා :-**
ඒක තමයි මං මේ කියන්න හැදුවේ.මේක මං කතා කළා, සභාවෙන් විතරක් අනුමත වෙලා මදි. මේක අපි කතා කළා පළාත් පාලන කොමසාරිස්වරයාට. එතුමා කිව්වා අපි මේක අනුමත කරල, සාධාරණකරණී වාර්තාවක් මේ සමඟ කොමසාරිස්වරයාට යවන්න ඕන. කොමසාරිස්වරයා ආණ්ඩුකාරවරියට යොමු කරනව. ඊට පස්සේ තාවකාලික පදනම මත ඒ රියදුරා අනුමත කරන්න ඕනෑ,මේක යෝජනා සම්මත කරාට රියදුරා ගන්න බෑ.

ඒ අනුව සභාපතිතුමාගේ හදිසි යෝජනා **03**යටතේ ඉදිරිපත් කළසභාපතිතුමාගේ වාහනයට පෞද්ගලික රියදුරු මහතෙකු බඳවා ගැනීමට සුදුසු බවට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
මී ළඟට කාරක සභා වාර්තා.

**සභාපතිතුමා :-**
**07.**කාරක සභා වාර්තාව

**07.01.2025.08.06** වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව

**07.02.2025.08.25** වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්ථාව

**සභික එච්. ආරියදාස මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,2025.08.06 හා 2025.08.25 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තා මං ස්ථිර කරනවා.

ඒ අනුව **07.01 හා 07.02.** හි සඳහන් 2025.08.06 හා 2025.08.25 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තා මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.03. 2025.08.26**වන දින පැවති ප්‍රසම්පාදන (ටෙන්ඩර්) කමිටු වාර්ථාව

**සභික එච්.එස්.එල්.දීපාල් මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, 2025.08.26වන දින පැවති ප්‍රසම්පාදන (ටෙන්ඩර්) කමිටු වාර්ථාව මං ස්ථිර කරනවා.

ඒ අනුව **7.03.**හි සඳහන් 2025.08.26 වන දින පැවති ප්‍රසම්පාදන (ටෙන්ඩර්) කමිටු වාර්ථාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.04.2025.08.22**වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, 2025.08.22වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවමං ස්ථිර කරනවා.

ඒ අනුව **7.04.**හි සඳහන් 2025.08.22 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.05. 2025.08.26** වන දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, 2025.08.26 වන දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව මං ස්ථිර කරනවා.

ඒ අනුව **7.05.**හි සඳහන් 2025.08.26 වන දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.06.2025.08.19** වන දින පැවති පරිසර හා සේවා පහසුකම් කමිටු වාර්තාව

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, 2025.08.19 වන දින පැවති පරිසර හා සේවා පහසුකම් කමිටු වාර්තාව මං ස්ථිර කරනවා.

ඒ අනුව **7.06.**හි සඳහන් 2025.08.19 වන දින පැවති පරිසර හා සේවා පහසුකම් කමිටු වාර්තාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**08.** ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා,වෙනත් වාර්තා

**සභාපතිතුමා :-**
**08.01.2025 අගෝස්තු මස ආදායම් වියදම් වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එච්. ආරියදාස මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, 2025 අගෝස්තු මස ආදායම් වියදම් වාර්තාව මං ස්ථිර කරනවා.

ඒ අනුව **08.01.**හි සඳහන් 2025 අගෝස්තු මස ආදායම් වියදම් වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**08.02.2025 අගෝස්තු මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එච්.එස්.එල්.දීපාල් මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, 2025 අගෝස්තු මස හිඟ ආදායම් වාර්තාව මං ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි,ආදායම් වියදම් වාර්තාව අපිට ලැබිල තියෙනවා අගෝස්තු මාසේ, ඒකේ 16 වෙනි කාරණාව යටතේ වෙනස් සේවා සඳහා ගාස්තු, අංක ටිකක් දාල තියෙනවා අපට ඒ ගැන පොඩ්ඩක් දැනගන්න පුළුවන්ද? ඒකෙ ආදායමඉහළ ගිහින් තියනවා. ඒ ගැන අපි සතුටු වෙනවා.ඔක්කොමතියෙනවාහැටතුන් ලක්ෂ අනූ හයදහස් හැට හතක්. මේ කාරණා ටික තියෙනවා අංක ටිකක් දාලා ඒකෙ අය ශීර්ෂ මොනවද කියල පොඩ්ඩක් දැනගන්න පුලුවන්ද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,මහා සභාව කාරක සභාවක් බවට මං යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,කාරක සභාව මහා සභාව බවට මං යෝජනා කරනවා.

**සභික ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

ඒ අනුව **08.02.**හි සඳහන් 2025 අගෝස්තු මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.

**සභාපතිතුමා :-**
**09.ගෙවා අවසන් බිල්පත්**

**09.01.2025 අගෝස්තු මස ගෙවීම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි 2025 අගෝස්තු මස ගෙවීම් වාර්තාව මං ස්ථිර කරනවා.

ඒ අනුව **09.01.**හි සඳහන්2025 අගෝස්තු මස ගෙවීම් වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**10.වෙනත් කාරණා**

**10.01**.පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම.

**සභාපතිතුමා :-**
එක මන්ත්‍රී කෙනෙක් එක අවස්ථාවක් පමණක් ගන්න.

**සභික ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, පෞද්ගලික කාරණා යටතේ, මේ දහතුන් වැනිදා බටහිර කලටුවාව කොට්ඨාශය තුළ පවත්වනු ලබනවා වෛද්‍ය සායනයක්.කොට්ඨාශයේ තියෙන පළවෙන් සායනය විදිහට, ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යතුමන් එතැනට පැමිණෙනවා. මං සභාවේ සියලු දෙනාට ම ආරාධනා කරනවා එදාට 13 වෙනිදට වෛද්‍ය සායනයට සහභාගී වන ලෙසට.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මං මේක යෝජනාවක් විදිහටගේනවා. ඇහැලියගොඩ නගරයේ මීට පෙර තිබුණා ඔත්තේ ඉරට්ටේ දින කියල වාහන නවත්තන ක්‍රමවේදයක්. ඒක නැවතත් ක්‍රියාත්මක කරනවනම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

**සභාපතිතුමා :-**
මේ යෝජනාව අපි කරන්න හිතාගෙන ඉන්නෙ වෙළෙඳ සංගමය සහ කඩ අයත් එක්ක සාකච්ඡා කරලා.ඊට ඉස්සෙල්ලා RD එකෙන් අපි කාණු පද්ධතිය පිරිසිදු කරලා.අපි ඉස්සරහට ඒක ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මට කාරණා .තුනක් යටතේ දැනුවත් කිරීමක් කරන්න අවශ්‍යයි.සභාපතිතුමනි,(පැහැදිලි නැ වචන) එතන වැසිකිළි පද්ධතියේ ප්‍රාදේශිය සභාවේ කවුරු හරි අපේ එක්කෙනෙක් දාල,එතනින් ටිකට් කැඩීමක් වුණා ද?නැත්නම් එතන ටෙන්ඩර් කිරීමක් වුණා ද?සමහර වෙලාවට එතන ටිකට් කඩන කෙනත් නෑ.ඒ කට වෙන වැඩ පිළිවෙළක් නෑ.ඒකෙන් මිනිස්සුන්ගේ ලොකු අප්‍රසාදයට ලක් වෙනවා.(පැහැදිලි නැ වචන) එතන වැසිකිළි පද්ධතිය පාවිච්චි කරනවට රුපියල් 50.00 ක ටිකට් එකක් කඩනවා,ඒ වැසිකිලි පද්ධතිය පාවිච්චි කරනවට.
මගේ ඊළඟ කාරණය තමා සභාපතිතුමනි, පොළ භූමියේ තියෙන වැසිකිලි පද්ධතියේ දැන් මේ වෙනකොට බට නළ,මුත්‍රා නළ අක්‍රිය වීමෙන්, කැඩිලා පිටාර ගැලීමක් සිදුවෙනවා. ඒ සඳහා සභාව දැනුවත් කරල තියෙනවද M .O .H එක හරහා.එතුමන්ලා කිව්වා දැනුවත් කිරීමක් කරලා තියෙනවා කියලා.

**සභාපතිතුමා :-**
මොන භූමියේද?

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා :-**

පොළ භූමියේ වැසිකිළි පද්ධතිය.මදුරු කීටයෝ එහෙම බෝ වෙලා.

**සභාපතිතුමා :-**

ඔව්, දැනුවත් කරල තියෙන්නෙ, මම හා තාක්ෂණික නිලධාරී නිශාන්ත රාමනායක මයා අපි එතනට දෙතුන් පාරක් ගියා. එතන අවහිරතා කීපයක් තියෙනවා. ඒක දැනුවත් කරල තියෙන්නෙ.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි,ඊළඟ කාරණය තමයි පුස්තකාලයට එහා පැත්තෙ භූමිය සභාවෙන් පාලනය කළා , රැස්වීම් එහෙමක් තියෙනකොට භාවිතයට ගත් සභාවෙන් පාලනය කළා තොරන් එහෙමත් ගැහුවා.ඒක හිටි ගමන් ම ඒ කාලේ තිබුණ සභාව මඟින් පොළ භූමියට ගෙනිච්චා එතන තිබුණු බස් හෝල්ට් එකත්.බස් හෝල්ට් එකක් තාවකාලිකව පවත්වාගෙන ගියාපසුගිය රජය හිටිගමන්ම පොළ භූමියටබස් හෝල් එක ගත්තා.සභාපතිතුමනි, ඒක ප්‍රයෝජනයට ගන්න පුළුවන් විදියට පත්කර ගන්න ක්‍රමයක් තියෙනවද?එකෙ ක්‍රම වේදය පොඩ්ඩක් දැන ගන්න පුළුවන් ද? පරණ මන්ත්‍රීවරු දෙන්නයි මෙතන ඉන්නේ. අනිත් සියලුම දෙනා ම අලුත් අය.දිලීන් මන්ත්‍රීතුමයි,මහේෂ් මන්ත්‍රීතුමයි විතරයි ඉන්නේ. මොකද ඒ කාලේ උනේ කියලා දැනගන්න අවශ්‍යයි. ඒක දැන් ප්‍රයෝජනයට ගන්න පුළුවන් තත්ත්වයකට පත් කර ගන්න පුළුවන්ද?

**සභාපතිතුමා :-**

මන්ත්‍රීතුමා ඔය ඉඩම සම්බන්ධයෙන් දෙපාර්ශවයක් අතර අයිතිය පිළිබඳව නඩුවක් ගියා.ඒ නඩුව මේ වෙනකොට අවසානයි. ඒ නඩුවෙන් අයිති වුණේදැරණියගල විවිධ සේවා සමුපකාර සමිතියට තමයි දැන් ඒ භූමිය අයිතිවෙලා තියෙන්නේ.ඊට කලින් තොරන් එහෙමත් හැදුවා. අපි දේශපාලන රැස්වීම් තිබ්බා. එතන අවසර ගත්තෙ දැරණියගලසමුපකාර සමිතියෙන්.ඊට පස්සෙ තමා නඩුව ෆයිල් කළේ. දැන් මේ වෙනකොට දැරුණියගල සමුපකාර සමිතියට තමා අයිති වෙලා තියෙන්නේ. ඉතින් අපෙත් ලොකු උත්සාහයක් තියෙනවා. අපිට පුළුවන්,ඒ භූමිය විකුණනවා නම් මිලදී ගන්න. ගත්තොත් ගොකු වැඩ කොටසක් කළ හැකියි.එහෙම නැත්නම් අඩුම ගානේ ඒක ඇහැළියගොඩ සමුපකාර සමිතියට හරි ඒක දුන්නොත් අපිට ඒගොල්ලොත් එක්ක කතා කරලා මොකක් හරි කරන්න පුළුවන්.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා :-**

සමාවෙන්න සභාපතිතුමා,එතන ඉඩම් කොටස් දෙකක් තියෙන්නෙ. මං කියන්නේ පුස්තකාලෙන් එහා පැත්තෙ තියෙන ඉඩම ගැන බස් හෝල්ට් එක තිබ්බෙ දැරණියගල සම්ප්‍රකාර සමිතියට අයිති කොටසේ නෙමෙයි.පුස්තකාලයට අයිති කොටස වෙනම තියනවා. ඊට එහා පැත්තේ කොටසක් තියෙනවා. ඒකට කවුරුත් අයිතිකාරයො නෑ. ගොඩ කරාට පස්සේ තමා ඒකෙ අයිතිය කතා කරන්න කීපදෙනෙක් ඇවිත් තියෙන්නේ.බස් හෝල්ට් එක අතෙන්ට අරන් යනකොට,නඩු තීන්දුවක් එහෙම වෙලා නෙමේ එතනට ගියේ.ඒක ඔබතුමා මේ ගැන පොඩ්ඩක් හොයලා බලන්න.

**සභාපතිතුමා :-**

මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධව අපේ ලොකු දැන්වත් කමක් නෑ.පුස්තකාලය භූමිය විතරයි එතන අපිට අයිති තියෙන්නේ.අපිට දැන් ඒක ප්‍රතිසංස්කරණය කරන්නත් බෑ.එතන කඩලා අලුතෙන් පුස්තකාලයක් හදන්න ගියොත්,අපට බොහොම ටිකයි ඉඩ තියෙන්නේ.ඒක අපිට නැති වෙනවා.ඒක කඩන් නැතුව තියෙන විදිහටම ප්‍රතිසංස්කරණය කරන්නේ. මන්ත්‍රීතුමා කියන කාරණය ගැන අපි දැනුවත් වෙලා හොයලා බලලා අවශ්‍ය කටයුතු කරමු.ඊට අමතරව මේ වෙනකොට එතනට ලියුම් ගහලත් තියෙනවා.එතන අවිධිමත් හා නිත්‍යානුකූල නැති කඩ කීපයක් මේ වෙනකොට හදල තියනවා.ඒවට විරුද්ධව අපි සභාව මඟින් පියවර ගන්නවා.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා :-**

මෝරගල පිට්ටනිය

**සභාපතිතුමා :-**

මෝරගල පිට්ටනිය වැසිකිලි පද්ධතියද?

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා :-**

ඒ සම්බන්ධව හා U.D එකෙන් පිට්ටනිය ලබා ගන්නවා. ඒක ලබා ගත්තට පස්සේ ගියපාර සරුංගල් ප්‍රදර්ශනයක් තිබ්බා.ඒකෙ මුදල් අය කරලා තමයි කරලා තිබුණේ.පිට නට්ටිය දන්නැ ඒක අයිති U.D එකට ද සභාවටද කියලා.ඒකෙන් අප්‍රසාදයට පත්වන්නේ අපි. ඒකෙන් විශාල වශයෙන් මුදල් අය කරලා ඇහැලියගොඩ මුදල් උපයාගෙන පිටතට යනවා. අර ගොල්ලන්ගෙන් පොඩි ගාණක් දීලා අවසරය ගන්නවා. U.D එකත් එක්ක අවබෝධයෙන් කටයුතු කරන්න දැනුවත් කරා නම් සභාපතිතුමා.එහෙම මොනවහරි ව්‍යාපෘතියකට දෙනවනම් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව දැනුවත් කරලා කරනවනම් ඒක ඉතා වැදගත් කියලා මං කියනවා.

**සභාපතිතුමා :-**

ඇත්තටම ඒක තියෙන්නේU.D එකට. නාගරික සංවර්ධන අධිකාරියට. නමුත් ඒකෙ විශාල ගැටළු කිහිපයක් තියෙනවා. ඒක නිසාම අපි මේ මාසෙ මොන සතියේ මම විශේෂයෙන්ම මම පෞද්ගලිකව කතා කරලා සුනිල් සෙනෙවි ඇමතිතුමා සම්බන්ධ කරගෙනU.D එකේ ඇමති අතුල කරුණාතිලක ඇමතිතුමාවත් අපි ප්‍රාදේශි ලේකම් කාර්යාලයට ගෙන්වා ගන්න අපිට උවමනා කරනවා.ඕකෙ ඉඩම් ප්‍රමාණය නිරවුල් කරලා, පිට්ටනිය නිරවුල් කරලා, අපිට අයිතිවාසිකම් නෑ අපට ඇත්තටම තියෙන්නේ උත්සවයක් තියෙන අවස්ථාවක කසල ඇදීම සඳහා මුදලක් ලබාගන්න විතරයි අපට කරන්න තියෙන්නේ.නැතුව අපිට නිත්‍යානුකූලව කිසිම දෙයක් නෑ ලබන මාසය ඇතුළත ඕක නිරාකරණය කිරීම සඳහා කටයුතු කරන්න උත්සාහ කරනවා බුද්ධ ශාසන ඇමතිතුමා අපේ ආසන සංවිධායකතුමා යූ.ඩී එක ලේකම් කාර්යාලය ඉඩම් හිමියෝ එකතුවෙලා අමාත්‍යාංශයේ දී මේක නිරවුල් කිරීම සඳහා මැදිහත්වීමක් සිදුකරනවා. අපිට ලොකු ගැටළුවක්. ඒ පිට්ටනිය හා ඒ අවට සමහරු ගොඩ කරනවා. පිටාර ගැලුවොත් එහෙම ඒ ගොඩ කරන විදිහට පොලිසිය පවා ටවුම පවා

පිටාර ගලන්න පුළුවන්. ඒක හින්දා අපි හැකි ඉක්මනින් ඒ සම්බන්ධව නිරවුල් කිරීමට පියවර ගන්නවා.එන මාසයෙ අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරගෙන තියෙන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, පොළ භූමියේ ආදායම් උත්පාදන මාර්ග කීපයක් ඇති කරන්න යෝජිතයි. එහිදී පොළේ වෙළදාම් කරන වෙළෙන්දොත් එක්ක සාකච්ඡා කරලා යම් යම් ප්‍රවේශ වලට ගියා නම් වටිනව කියන අදහස වෙළෙන්දෝ කියනවා. ඒ කට්ටියගෙන් වෙළදාමට බාධාවක් නොවන විදිහට විකල්ප ක්‍රමවලට සාකච්ඡා ප්‍රවේශයකටගිහිල්ල තීන්දු ගන්නවා නම් යෝජිතයි කියල අදහස් කරනවා.

**සභාපතිතුමා :-**
ඔබතුමාගේ යෝජනාව හොඳයි අපි දැනටමත් ප්‍රමාද වුණා වැඩියි. පොළට ගිහිල්ලා ඒ ව්‍යාපාරිකයන් හමුවෙන්න ඕන හමුවෙලා ඒගොල්ලොත් එක්ක කතා කරල තමයි අපි ඉස්සරහටකටයුතු කරන්න සූදානම් වෙලා සිටින්නේ. පොළට දැන් මිනිස්සු එන්නේ නෑ. ඒක හින්ද පොලට අනිවාර්යෙන්ම පාරිභෝගිකයෝ එවන්න ඕන මේ සඳහා ලොකු වැඩපිළිවෙලක් සාකච්ඡා කරමින් කියනවා. ඒකත් හැකි ඉක්මනින් පොළේ අයත් එක්ක සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙනවා.සියලුම මන්ත්‍රිවරු අපි ඒකට සහභාගී වෙමු.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, ඇහැළියගොඩ සුසානාගාරය අනෙකු සුසානාගාර එක්ක බලනකොට අය කරන ගාස්තුව ඉතා වැඩියි කියලා පොඩි චෝදනාවක් එල්ල වෙමින් පවතිනවා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළට මුදල වැඩියි කියලා කියනවා. ඒක නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වලට ගැලපෙන විදිහට සංශෝධනයකට යන්න පුළුවන් නම් හොඳයි මම කියනවා.සුභසාධන කටයුත්තක් නිසා මේක.

**සභාපතිතුමා :-**
ඒක මන්ත්‍රීතුමා අතුරු ව්‍යවස්ථා සම්මත කරලා තමයි ඇවිත් තියෙන්නේ. ඒක ආයෙ වෙනස් කරන්න ආයෙ අතුරු ව්‍යවස්ථාවක් හදන්න ඕන. ඒකෙ ගැටළු රැසක් තියෙනවා. ඒක හදන්න මේ වෙනකොට ගිවිසුම් ගතවෙලා තියෙනවා කියලා ඔබතුමා දැනුවත් ඇති නේ ද?

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා :-**
සභාපතිතුමනි කුරුවිට ප්‍රාදේශීය සභාවේ සුසානාගාරයේ දොළොස් දාහක් විතර ගන්නේ.පහළොස්දාහක් ගන්නෑ මං හිතන්නේ.

**සභාපතිතුමා :-**
එහෙම වුණොත් අපට අතුරු වස්ථාවකින් තමා ඒක සංශෝධනය කරන්න ඕන.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
**ගරු සභාපතිතුමනි, නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවෙන් මං ඉල්ලා අස්වෙනවා. ඒ සඳහා ප්‍රියන්ත බණ්ඩාර මහතා සුදුසු යැයි මං යෝජනා කරනවා.**

**සභාපතිතුමා :-**
**නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවෙන් වත්සලා නිශාන්ති ධනරත්න මන්ත්‍රීතුමිය ඉවත් වී ඒ සඳහා ප්‍රියන්ත බණ්ඩාර මහතා ඇතුල් වී නාම සංශෝධනයක් සිදුවෙනවා.**

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි. වීදි පහන් සඳහා අවශ්‍ය බල්බ් මේ වෙනකොට සභාවට ලබා දිලා තියෙනවා.විදි පහන් සවි කිරිමට කටයුතු කරන්න කියලා (පැහැදිලි නෑ)

**සභාපතිතුමා :-**
වීථි පහන් සඳහා මේ වන විට වීථි පහන් 1000 ක් මිලදී ගත්තා. මේ වෙනකොට අපට වීථි පහන් එකසිය පනස් පහයි සවි කිරීමට පුළුවන් වුණේ. අපි ඉස්සෙල්ලාම කළේ ප්‍රධාන මාර්ගයේ වරිපනම් ගෙවන සීමාව තුළ තමයි අපි සවි කරන්නේ. මේ අවස්ථාවේ මං සියලු දෙනාගෙන් ම ඉල්ලා සිටිනවා අපේ පෞද්ගලික ලේකම්තුමාගෙන් ඒ සඳහා දිනයක් ලබා ගන්න. ඒ දිනයට කටයුතු කරන්න පුළුවන්. අපිට ඉන්නේ එක විදුලි කාර්මික ශිල්පියයි. ඇත්තටම අද යන්න වුණේ නෑ.වතුර ගහන්න යන්නෙත් වෙනත් රාජකාරී වලට යන්නෙත් මේ මෙල්සිරි මහත්මයා ම තමයි. ඒක හින්ද අපි ඇත්තට ම විදුලි කාර්මිකයෙක් ඉල්ලුවා. සමහරවිට අපට ලැබෙන්න පුළුවන්. එක විදුලි කාර්මික ශිල්පියයි ඉන්නේ. ඒක තමයි ලොකුම ගැටළුව තියෙන්නේ. නැත්නම් සියලු දෙනාගේම යෝජනාවක් මේ, විදුලි පහන් යෝජනාව. ඇත්තට ම සියලු දෙනාට ම ලැබෙනවා. දවස් පහයි තව අපි සවි කිරීම් කටයුතු කළේ. තවම එකසිය පනස් පහයි සවි කරලා තියෙන්නේ.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, විදුලි පහන් කියන කොට ඇත්තටම මතක් වුණේ. ඇත්තට ම මේ වෙන කොට ඉඩංගොඩ පාරේ වීදි පහන් සැහෙන පිච්චිලා තියෙනවා. ඔබතුමා අවධානය යොමු කරන්න. ඊට අමතරව නාකන්දල මාර්ගයේ විදුලි පහන් සැහෙන්න පිච්චිලා තියෙන්නෙ. ඒකටත් වැඩි අවධානයක් යොමු කරන්න කියල මම යෝජනා කරනවා.

**සභාපතිතුමා :-**
වීදි පහන් තියනවා ප්‍රාදේශීය සභාවෙන් හා විදුලි බල මණ්ඩලයෙන් දාන ඒවා. ඉඩංගොඩ පාරේ තියෙන්නේ මං හිතන්නේ විදුලිබල මණ්ඩලයෙන් සවි කරන පහන්.අපි මේ වනකොට ලිවුම් කියක් ගහලද දන්නෙ නෑ.ඒ ගොල්ලෝ කියන්නේ ප්‍රතිපාදන නෑ කියලා.අපි අමාත්‍යාංශයටත් ඒ සම්බන්ධව ගිය සුමානේ ලිපියක් යැව්වා. තවම උත්තරයක් ආවේ නෑ. අපිට කිසි ප්‍රශ්නයක් නෑ ප්‍රාදේශිය සභාවේ,අපට අවශ්‍ය වෙලාවේදී ඒ වැඩේ කරන්න පුළුවන්.නමුත් වවිදුලි මණ්ඩලයට අයිති ප්‍රධාන පාරේ හා මං මාවත් කීපයක් තියෙනවා.අපි එයාලා එක්ක කතා කරලා ඒක කරන්න බලමු.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි කසල එකතු කරනව නේ,වරිපනම් ප්‍රදේශවල. එතකොට ඒකේ වෙලාවක් නෑ. පැයක් දෙකක් එළියෙ තියන්නත් බෑ. සත්තු අදිනවා.එම නිසා එම ට්‍රැක්ටරයටම නලාවක් හයි කරන්න.ගෙවල්වල කසල තියාගෙන ඉන්නෙ. ඒ සද්දෙට තමා එළියට ඇවිත් දාන්නේ. එම නිසා එම යෝජනාව මම ඔබතුමාට කරනවා.අනිත් එක මෝරගල වසමේ මේ නගරයට ආසන්න නිසා මේ වීදි පහන් දැන් මාසයක් තිස්සේ පත්තු වෙන්නෑ. ඒක මං හිතන්නෙ විදුලි බල මණ්ඩලයට තමයි සම්බන්ධව ඇත්තේ. මොකද මේ නගරයට ලඟ හින්ද, ඒ ටික අනිවාර්යෙන්ම රෑට පොඩ්ඩක් ඒ පැත්තට ඇවිල්ල බලන්න. එළිය මදි. මිනිස්සු හරි අපහසුතාවයකට පත්වෙලා ඉන්නේ. දැන් මේ ළඟදි ඉඳන් තමයි මේ පත්තු වෙන් නැත්තෙත්. මෙච්චර කාලයක් පත්වුණා. මං එම යෝජනාව ඔබතුමාට ඉදිරිපත් කරනවා.

**සභාපතිතුමා :-**
කසල වලට අපි ටයිම් ටේබල් එකක් දීලා තියෙනවා. ඊට අමතරව ජී.පී.එස් හයි කරලා තිබුණා. ඒවා කඩලා තියෙනවා. අපි දැන් ඒවාට ක්‍රියාමාර්ග ගන්න වෙනවා. නලාවක් හයි කරලා දුන්නා. ඇත්තටම ඒගොල්ලෝ ඒක තියාගන්නෙ නෑ. අපි මොකක් හරි ඒගොල්ලන්ට තීරණයක් ගන්න වෙනවා. මන්ත්‍රීතුමා කියන එක හරි.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා :-**
ගොඩක් අය කියනවා අපි එනකොට ට්‍රැක්ටරේ ගිහිල්ලනේ කියල. වෙලාවක් නෑ. පැයක් දෙකක් පරක්කු වෙනවා. හරි වෙලාවක් නෑ.ඒකට යෝජනාවක් දාන්න කියලා හැම දෙනාම කියනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මගේ කතාව කරුණු කීපයකට ගොනු කරනවා. පළවෙනි කාරණය තමයි, පසුගිය දවසක අපේම,තංගල්ල නගර සභාවේ නිලධාරීන් පිරිසක් විනෝද චාරිකාවක් සඳහා යන අතරතුරඇල්ල ප්‍රදේශයේදී සිදුවුන හදිසි අනතුර. අනතුර නිසා ජීවිත පහළොවක් පමණ නැතිවුණා. මම දැක්කා සෝසල් මීඩියා වල ගරු සභාවෙන් පළ කරලා තිබුණා, ශෝකය. ඊට අමතරව ලිපියකින් අපි ශෝකය පළ කරොත් හොඳයි කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා සභාපතිතුමා ඇතුළු සියලුම සභික මණ්ඩලයේ ශෝකය ප්‍රකාශ කරනවා කියලා අදහස් දක්වනවා.

ඊට අමතරව දිගින් දිගටම කතා වුණා වීදි පහන් ආලෝකය ගැන. මිස්බාහ් මන්ත්‍රීතුමාගේ නිවස ඉස්සරහත් වීදි පහන් ආලෝකය අක්‍රිය වෙලා තියෙන්න.හිටිගමන් පත්තු වෙනවා. දැන් නම් ඒක කොහෙත්ම පත්තු වෙන්නේ නෑ. විදුලි අධිකාරියට දැනුම් දුන්නත් කිසිම තේරුමක් නෑ. එතුමගේ වචන අපිට පිළිගතනොහැකි මට්ටමකට ඇවිල්ලා තියෙනවා. මෙතනදී මම කියනවා ඒ සඳහා අපට සම්බන්ධීකරණයේදී යෝජනාවක් විදිහට, අපිට කතා කරන්න අවස්ථාව සලසලා දෙන්න කියලා.මීට ඉහතදීත් පැල්පිටිය ප්‍රදේශයේ දිගින් දිගටම විදුලි බිල වැඩි වුණා. මං සම්බන්ධීකරණයේදී කතා කරලාඒක නිවැරදි කර ගත්තා අපිට අවස්ථාව සලසලා දෙන්න. විදුලි අධිකාරියට අපි කිව්වට වැඩක් නැත්නම්, සම්බන්ධීකරණය හරහා දැනුම් දීම තුළ අපට ඒකෙ වාසිය ගන්න පුළුවන් වෙයි කියල අපි විශ්වාස කරනවා.

ඊට අමතරව කණගාටුදායක සිද්ධියක් වුණත් සති දෙකකට විතර කලින් පැල්පිටිය ප්‍රදේශයේ විදුලි ආලෝකය ලබා දීලා තිබුණා.හොඳයි. ප්‍රශ්නයක් නෑ. මාව සම්බන්ධ කර ගත්තේ නැති උනාට. පැල්පිටිය වසමේ විදුලි පහන් පහළොවක් වගේ දාල තිබ්බා එකපාරටම. මං දන්නෑ කොහොමද කියල. මාවවත් දැනුවත් කලේ නෑ. කලින් වතාවෙදි සභාවේදී කතා වුණා සෑම සභිකයෙකුට ම එක හා සමානව සලකනවා කියල.විශේෂයෙන් පැල්පිටිය කොට්ඨාශය දිනලා තියෙන දිලීන් කරුණාපාල, ඒක හින්ද මාව දැනුවත් කරනව කියලා. ඒක කමක් නෑ. ඒක දැනුවත් කලේ නැති උනාට. හැබැයි මිනිස්සුන්ගේ චෝදනාවක් තියෙනවා,මෙතන බල්බ් එක හයි කරලා. මෙතන බල්බ් එක හයි කරලා නෑ කියලා. එහෙම චෝදනාවක් තියෙනවා. හැබැයි ඒකෙ වගකීම ගන්න වෙන්නේ කාටද කියන එක ප්‍රශ්නයක්. ඒ මිනිස්සු කතා කරලා මට බනිනවා. ඇයි ඔයා එහෙම කරන්නෙ, සභාව වෙලාවේ දි අපි චන්දෙ දුන්නේ ඔයාට,ඇයි මේ තැනින් තැන වීදි ආලෝකය හදන්නෙ කියල. කිසිම වගකීමක් නැතුව ඇයි හදන්නේ කියලා.එතනදි මම අපහසුතාවයට පත්වුණා. ඉතින් මං හිතුවා මාව අපහසුතාවයට පත් කරන්න වෙන්නැති මේ වගේ තීරණයක් ගන්න ඇත්තේ කියලා.සමහර විට එහෙම වෙන්න ඇති නේද සභාපතිතුමා.

**සභාපතිතුමා :-**
කිසිසේත් ම නෑ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා :-**
ඇත්තටම මම දන්නෙ නෑ.මේ වන කොටත් මම විශ්වාස කළේ මේ සංවර්ධන කටයුතුවලට මාව සම්බන්ධ කර ගනී කියලා.අපි බලාපොරොත්තු වෙනවා විපක්සෙ කණ්ඩාමත් ඒ සංවර්ධන කටයුතුවලට සම්බන්ධ කර ගනී කියලා.සිස්ටම් එකක් වෙනස් වෙන කිවුවා.ලෝභ නෑ.මට මොකක් හරි දැනුමක් තියෙනව නම් ඒ දැනුම මං සභාව වෙනුවෙන් පාවිච්චි කරන්න මම කිසිසේතු ම පැකිලෙන් නෑ.ඒක මගේ යුතුකමක් විදිහට තමා මම ඒක දකින්නේ.ඒ සඳහා ඔබලගේ සාධාරණත්වයක් අපි බලාපොරොත්තු වෙනවා.

ඊට අමතරව පසුගිය සතියේ සිද්ධි දෙකක් අපට වාර්තා වුණා. රන්මාල කඩා ගැනීම සම්බන්ධව.විශේෂයෙන්ම අපේ පාසලේ ගුරුවරයෙක්ගේ රන්මාලයක් කඩා ගත්ත බෙලෙක්කඩේ ඉඳන් වෙළංගල්ලට යන මාර්ගයේ අපේ සීමාව ඇතුළත පොලිස් බල ප්‍රදේශයේ. ඒක හින්දා දැඩි අසීරුතාවයකට පත්වෙලා ඉන්නවා කාන්තාවන්. ඊටඅමතරව මට ආරංචි වුණා බෝපැත්ත ප්‍රදේශයේ, මින්නාන ප්‍රදේශයේ එහෙම සිද්ධියක් ආරංචි වුණා අද .මේ වගේ දිගින් දිගටම වෙන්න වුනොත් ආයෙත් ආරක්ෂක තත්ත්වය පිළිබඳ ගැටළුවක් ඇතිවෙනව ජාතික ආරක්ෂාව පිළිබඳබංකුවක් ගෙනල්ල උගන්නන්න කිව්වට වැඩක් නෑ. මේ වගේ සිද්ධි අපේ ජීවන තත්ත්වය කෙරෙහි බලපානවා. ඒක හින්දා සභාපතිතුමනි, පොලිස් පොලිසියට දැනුම් දෙන්න, මෙන්න මේ මෙහෙම සිද්දි වෙලා තියෙනවා ජනතාව හිතියෙන් ඉන්නේ.ඒ සඳහා කටයුතු කරන්න පොලිසියට බලතල දීල තියෙනව. ඒ සඳහා කටයුතු කරන්න කියලා දැනුවත් කිරීමක් කරන්න

ඊට අමතරව ලොකු අනතුරක් වෙන්න තියෙන ගැටළුවක් තියනවා. කීල්ස් එක ඉස්සරහ, මෝරගල වසම ආරම්භයේ ම ටවුන් එකේ ඉඳන් යනකොට ලොකු අපට තොරණක් ගහල තියෙනවා. මේක අවුරුදු පහළොවකට වඩා පරණයි, මං දන්න විදියට. ඒක නිෂ්පාදනය කරපු ආයතනයට යෝජනාවක් කරලා මේක පොඩ්ඩක් අබලන් තත්ත්වයේ තියෙන්නෙ, සමහර විට මේක කඩාගෙන වැටෙන්න ඉඩ තියෙයිද කියල අහන්න වෙයි. බැරි වෙලාවත් කඩාගෙන වැටෙන වෙලාවක අපි බයික් එකක හරි වාහනේක හරි යන කොට අපිට තමයි ඒ අනතුර සිද්ධ වෙන්නේ. ඒක හින්දා ගරු සභාපතිතුමනිඔබේ අවධානය යොමු කරන්න. ඒක එක්කෝ නඩත්තු කරන්න. නැත්නම් මේක ඉවත් කරන්න. මං දන්න විදියට RD එකෙන් කියලා තියෙනවා ඒක ඉවත් කරන්න කියලා. ඒක අවශ්‍ය අනුමැතියට නෙමෙයි, ඒක සභාවෙන් ඒක ගහලා තියෙන්නේ. ඒක අපිට ප්‍රශ්නයක් වෙන්න ඉඩ තියෙනවා.ඒක දැන් දිරලා තියනවා කියල තමයි අපිට දැන ගන්න හම්බුනේ.

අවසාන වශයෙන් මෝරගල හන්දියේ ඉඳන් රණවිරු සම්පත් මාවත හන්දිය දක්වා ට්‍රැක්ටරයක් ගියා පසුගිය කාල සීමාව තුළ. මෝරගල මාර්ගය දිගු කරලා තිබ්බා කසල එකතු කිරීමට එතනට යනකන්.නමුත් මේ වන විට දීර්ඝ කාලයක් තිස්සේ ඒ කසළ කළමනාකරණය කර ගන්න ඔවුන්ට අවස්ථාව නැතිවෙලා තියෙනවා ඔවුන්ට. මෝරගල හන්දියේ ඉඳන් රණවිරු සම්පත් මාවත දක්වා ජනතාවට, ගොඩක් වෙලාවට එයාලා කසල බැහැර කරන්න උත්සාහ කරන්නේ එක්කෝ වෙලට. නැත්නම් ඇළට. ඒ අවස්ථාව අපි සම්පාදනය කරන්නෙ නැති හින්දා. ඒ ගැනත් සභාපතිතුමා සලකලා බලලා ඒ ටැක්ටරය වෙනදා මෙන් කසල එකතු කිරීමසඳහා ඒ මාර්ගයේ ටික දුරක් ගමන් කරන්න උපදෙස් දෙන විදිහට ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි,ඇත්තටම අපේ ප්‍රාදේශීය සභාව සතුව තියෙන ඉඩම් ටික අපි නිශ්චිත කරගන්න ඕන. ඉඩම් සේල්වල තියෙනවා ,අපට මග ඇරිච්ච ඉඩම් ප්‍රමාණයක් තියෙනවා. ඒවා නිශ්චිත කර ගෙන මොකක් හරි වැඩකට වෙන් කර ගැනීමක් කරගෙන ප්‍රයෝජනයට ගන්න පුළුවන්නේ ඉස්සරහට. කසල කළමණාකරන වැඩ වලට හරි, ඒ ස්ථාන ප්‍රයෝජනයට අරගෙන අපට වැඩක් කරගන්න පුළුවන්. ඒ වගේ ස්ථාන නිශ්චිත කරගෙන, ප්‍රජාශාලාවල් වගේ දේවල් තියෙනවා, ප්‍රාදේශීය සභාව තුළ වාචිකව තියෙන ඒවා අපට තියෙනවද කියලා හඳුනාගෙන කර ගන්න පුළුවන් නම් හොදයි කියලා මම ඔබතුමාට යෝජනා කරනවා**.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, ඒ මන්ත්‍රීතුමාගේ ගෙනා යෝජනාව හැම වසමකම වගේ ක්‍රියාත්මක වෙනව නම් හොදයි. රජයේ ආයතන පවත්වාගෙන ගිය ස්ථාන තියෙනවා. නමුත් ඒවා රජයට පවරාගෙන නැති තැන් තියෙනවා. ප්‍රාදේශීය සභාවට පවරාගත යුතු තැන් මේ දක්වා පවර ගෙන්න නැති තැන් තියෙනවා. හොයාගන්න තැනක් නෑ. ඒවාට ප්‍රතිපාදන වෙන් කරල වැඩ කරලා තියෙනවා. නමුත් ඒවා දැන් ප්‍රයෝජනයට ගන්නෙ නෑ. ඒවා කඩා වැටිල තියෙනවා. බිම තියනවා. ඒ බිමේ නිශ්චිත අයිතිය රජයට තියෙනවද, පුද්ගලික ඉඩම් පරිත්‍යාග කරපුවද ,කියලා හඳුනා ගන්න සාක්ෂි නෑ. අපේ කොට්ඨාශයේ තියෙනවා,ඒ වගේ ස්ථාන තුන හතරක්ම. ඒවා මොනවා හරි ක්‍රියාවකට යොමු කරන්න පුළුවන් නම් ගොඩනැගිලිත් තියෙනවා. මම යෝජනා කරනවා.ඒ මන්ත්‍රීතුමා යෝජනා කළා වගේ මෙම ස්ථාන හඳුනාගෙන (පැහැදිලි නෑ) ඒ ගොඩනැගිලි අත අරින්න බෑ. රජයේ දේපල. පොදු දේපළ. මගේ කොට්ඨාශයේ රජයේ ආයතන පැවතිච්ච ගොඩනැගිලි ගොඩක් ඒවා වැහිල ගිහිල්ලා තියෙනවා. අද ඔබතුමා ඒවා ක්‍රියාත්මක කරන්න විශාල කාර්ය භාරයක් කරලා තියෙනවා.ස්තුතිවන්ත වෙනවා.

**සභාපතිතුමා :-**
මේ අවස්ථාවේ දී මම සභාවෙන් ඉල්ලා සිටිනවා, සභාවේ අපේ ලේකම්තුමාට, සභාව අමතලා කතා කරන්න ඕන නිසා මහා සභාව කාරක සභාවක් බවට පත් කරමු කියලා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,මහා සභාව කාරක සභාවක් බවට මං යෝජනා කරනවා.

**සභිකඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,කාරක සභාව මහා සභාව බවට මං යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
දැන් වෙලාව ප.ව 4.10 යි. අද උදෑසන ඉඳන් ගරු උපසභාපතිතුමත් මන්ත්‍රීතුමන්ලාත් මන්ත්‍රීතුමියන්ලාත් ලේකම්තුමත් නිලධාරීන් දෙපළත් අද දවසේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සියලු දෙනාම තම තමන්ට පුළුවන් මට්ටමෙන් අපට, මේක කරගෙන යන්න උදව් කරා. අපි සභාවේ කටයුතු අවසන් කරමු. සියලු දෙනාට ම සුභ සැන්දෑවක් වේවා! බොහොම ස්තුතියි!

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2025 ක් වූ..................................මස................ දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.